# EASTERN UNIVERSITY, SRI LANKA






# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை - 2016

# ANNUAL REPORT

# නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

මහාචාර්ය ටී. ජයසිංහම්

උපකුලපති

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## දැක්ම

ශ්‍රී ලංකාවේ උසස් ඉගෙනුම් සඳහා විශිෂ්ඨත්වයෙන් පිරි මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

## මෙහෙවර ප්‍රකාශය

ප්‍රජාවගේ සමාජ-ආර්ථික හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා කර්මාන්ත-ප්‍රජා සහයෝගීතාවය තුළින් වඩා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම මඟින් කුසලතා පූර්ණ උපාධිධාරියෙකු බිහිකිරීම සඳහා ඉගෙනුම්,පර්යේෂණ සහ දැනුම බෙදාහැරීමේ පහසුකම් සැලසීම.

## විමසීම්

නැගෙනහිර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව

වන්දාරුමූලෛයි

චෙන්කලඩි - 30350

ශ්‍රී ලංකාව.

දුරකතන අංක (පොදු): +94 65 22 40490
+94 65 22 40580
+94 65 22 40590

ෆැක්ස් අංකය (පොදු): +94 65 22 40730

ඊමේල් : reception@esn.ac.lk

වෙබ් : www.esn.ac.lk

## අරමුණු

විශ්වවිද්‍යාලය පහත සඳහන් අරමුණු, ඒවාට අදාළ පරමාර්ථ ද සමඟින් හඳුනාගෙන ඇත.

**1.** ඉගැන්වීම්, පර්යේෂණ හා දැනුම බෙදාහැරීමේ විශිෂ්ඨත්වයට පත්වීම.

- 1.1 රටේ සහ ලෝකයේ වෙනස්වන අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දක්වමින් රැකියා අරමුණු කරගත් උපාධිධාරීන් පිරිසක් බිහි කිරීම සඳහා අධ්‍යයන පාඨමාලාවන් අළුතින් සකස්කිරීම.
- 1.2 විෂය මාලාවන්හි ගුණාත්මකභාවය හා අදාළත්වය ඉහළ නැංවීම.
- 1.3 ආයතනයේ පර්යේෂණ ධාරිතාවය ඉහළ නැංවීම.
- 1.4 දැනුම බෙදාහැරීම ධෛර්යමත් කිරීම.

**2.** මානව සම්පත්, යටිතල පහසුකම් හා අනෙකුත් සම්පත් සංවර්ධනය තුළින් ආයතනයේ ධාරිතාවය ඉහළ නැංවීම.

- 2. 1 කාර්ය මණ්ඩලයේ අධ්‍යයන දැනුම ඉහල නැංවීම.
- 2. 2 ආයතනයේ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා යටිතල පහසුකම් හා අනෙකුත් සම්පත් ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම.

**3.** ප්‍රජාවගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකරගැනීමට දායක වීම.

- 3. 1 අවස්ථාවන් ලබාදීම.
- 3. 2 ප්‍රජාවගේ සම්ප්‍රදායන්, සංස්කෘතිය හා මානව වටිනාකම් සංරක්ෂණය කිරීම හා පෝෂණය කිරීමට කිරීම.

**4.** යහපාලනය පවත්වාගෙනයාම හා ඉහළ නැංවීම.

- 4. 1 සම්පත් ඵලදායීව හා කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීම.
- 4. 2 උනන්දුවක් දක්වන පාර්ශව අතර සමාජ එකමුතුකම වැඩිදියුණු කිරීම.

# පටුන

3.උපකුලපති සමාලෝචනය: ........ 1

3.1 උපකුලපතිගේ වාර්තාව ........ 1
3.2 විශේෂ අවස්ථා 2016 ........ 3
3.3 දළ විශ්ලේෂණය ........ 4
අ. පීඨ හා අධ්‍යයන පාඨමාලා : ........ 5
ආ. නව පීඨ හා අධ්‍යයන පාඨමාලා ........ 6
ඇ. විශ්වවිද්‍යාලයේ සංවිධාන සැලැස්ම ........ 7
ඈ. පාලක සභාව ........ 8
ඉ. සනාථන සභාව ........ 9
3.4 අසාර්ථකවීම් හා හේතු පැහැදිලි කිරිම් ........ 12
3.5 අනාගත සැලසුම් ........ 12

4.සිසුන් සහ සම්පත් පිළිබඳ විස්තර ........ 13

4.1 ශිෂ්‍ය ජනගහනය ........ 14
දේශිය සිසුන් ........ 14
විදේශිය සිසුන් ........ 15
4.2 කාර්ය මණ්ඩල සම්පත් ........ 16
4.3 පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලය ........ 18
4.4 අධ්‍යයනාංශ/ඒකකයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ........ 22
4.5 සම්පත් හා සේවාවන් පිළිබඳ කාර්යය සාධන දර්ශක........ 24
උපාධිධාරි සේවා නියුක්තිය........ 26

5. මූල්‍ය තත්ත්වය ........ 27

5.1 දෙසැම්බර් 2016 31 දිනට භාණ්ඩාගාරය විසින් නිදහස් කරන ලද අරමුදල් වලට අදාළ තත්ත්ව වාර්තාව ........ 27
5.2 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර : ........ 28
5.3 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර ........ 28
ව්‍යාපෘති පිළිබඳ විස්තර (විදේශීය අරමුදල් සම්පාදිත/දේශීය)........ 29
ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (විදේශීය අරමුදල් සම්පාදිත/දේශීය) : ........ 31
5.6 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්): ........ 33
5.7 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම): ........ 33
5.8 මූල්‍ය ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය - 2016: ........ 34
5.9 2016 වර්ෂය තුල ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර : ........ 34
5.10 මූල්‍ය ප්‍රකාශන 2016........ 36

6.අත්පත්කර ගැනිම් ........ 40

6.1 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන ........ 40
6.2 විද්‍යා වෙබ් අඩවියේ ලැයිස්තුගත සඟරාවන්හි 2016දී පළකරන ලද පර්යේෂණ පත්‍ර ........ 43
6.3 ලබා ගත් සම්මාන පිළිබඳ විස්තර ........ 44
2016 දී ලද පර්යේෂණ ප්‍රදාන........ 44
ක්‍රිඩාවන්ගෙන් ශිෂ්‍යයන් ලද ජයග්‍රහණ ........ 45
6.4 වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර : ........ 46
6.5 අළුතින් ආරම්භ කරන ලද පාඨමාලාවන් පිළිබඳ විස්තර........ 47

7. අභ්‍යන්තර විගණනය........ 48

8. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.. 54

9. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළව කළමණාකරණයේ හේතු පැහැදිලි කිරීම ........ 69

# 3. උපකුලපති සමාලෝචනය:

## 3.1 උපකුලපතිගේ වාර්තාව



ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2016 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සඳහා මා මෙම පණිවිඩය සටහන් කරනුයේ ඉතාමත් සතුටිනි.

වර්තමාන යුගය වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුලින් අරමුණු කරනුයේ දේශීය, කලාපීය හා ජාත්‍යන්තර තත්ත්වයන්ට මුහුණ දිය හැකි තරඟකාරි බුද්ධිමතුන් පිරිසක් බිහි කිරීමයි. උසස් අධ්‍යාපනය මඟින් පර්යේෂණ දිරිගැන්විම ද අරමුණු කරන අතර ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය (ශ්‍රී .ලං.නැ.වි.වි) තේමාත්මක පර්යේෂණ සිදු කිරිම සඳහා සිය අධ්‍යයන කාර්ය මණ්ඩලය උනන්දු කරවනු ලබයි. ප්‍රජා සහභාගිත්වය හා සත්කාරක සේවා විශ්වවිද්‍යාලයේ සංඝටනීය කොටසක් වේ.

ශ්‍රී.ලං.නැ.වි.වි. නිසි බලධාරියාගේ වසරක සේවා කාලයකින් (2015) පසු නව උපකුලපතිවරයෙකු විසින් උපකුලපති ධුරයේ වැඩ භාරගන්නා ලද 2016 වසර අද්විතීය වසරක් විය. එහෙත්, නිසි බලධාරයා ලෙස මහාචාර්ය උමා කුමාරස්වාමීගේ ඥාන ශක්තිය ලබා ගැනිමට අප වාසනාවන්ත වූ අතර ශ්‍රී.ලං.නැ.වි.වි. නිසි මාර්ගයට ගැනීමට එතුමිය ලබාගත් පෙර නොවූ විරූ ප්‍රවේශය ඉතා ඵලදායී වූ අතර එය 2016දී තවදුරටත් ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී.

ශ්‍රී.ලං.නැ.වි.විද්‍යාල ඉතිහාසයේ ප්‍රථම වතාවට උපකුලපතිවරයෙක් වර්ණවත් උත්සවයකදි උත්සවාකාරයෙන් සිය ධුරයේ වැඩ කටයුතු නිල වශයෙන් ආරම්භ කරන ලද අතර නියෝජ්‍ය උපකුලපතිවරයෙකු ද පත් කරන ලදී. 2016 ජුනි මස දී ලිංගික සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ ඒකකයේ සමාරම්භයත් සමඟම නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ලිංගික සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිපත්ති රාමුව ද ක්‍රියාත්මක කරන ලද අතර ඒ අනුව ලිංගික සාධාරණත්ව හා සමානාත්මතා ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.

අධ්‍යයන, පරිපාලන හා අනෙකුත් කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය 2016දී අරමුණු කරන ලද අතර මෙවැනි වැඩසටහන් විදේශීය මධ්‍යස්ථාන වලදී මෙන්ම කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් ද පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන් තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයේ (ඒ.අයි.ටී) හිදි ආරම්භ කරන ලද අතර මෙය 2017 වර්ෂයේදී ද ක්‍රියාත්මක වනු ඇත. කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළු හා විෂය බාහිර පුහුණු වැඩසටහන් ගණනාවක් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පවත්වන ලදී. තවද, ප්‍රධාන කාර්ය මණ්ඩලය හා පාලක සභාවේ සාමාජිකයන් සම්බන්ධ කරගෙන උපාය මාර්ගික සැලසුම් සම්බන්ධයෙන් 2016 මැයි මසදී නේවාසික වැඩමුළුවක් පවත්වන ලදී. ආයතනික ප්‍රතිඵල රාමුව මැයෙන් වැඩමුළුවක් 2016 අප්‍රේල් මස දී පවත්වන ලදී.

විශ්වවිද්‍යාලය විනය පාලක පද්ධතියක් හඳුන්වාදුන් අතර සිසුන්ගේ විනය ඇතිකිරිම සඳහා පහසුකම් සපයන ලදී. 2015 වර්ෂයේ දී “ශිෂ්‍ය ප්‍රඥාප්තියක්” පිළියෙල කරන ලද අතර නවක ශිෂ්‍යයන්ට අවශ්‍ය අනෙකුත් තොරතුරු සමඟ පිළිපැදීම සඳහා නවක ශිෂ්‍යයන් අතර බෙදා හරින ලදී. අවශ්‍යතාවය ඇති සිසුන්ට පහසුකම් සැපයීම සඳහා ශිෂ්‍ය උපදේශන සේවාවන් තවදුරටත්

ක්‍රියාත්මක කරන ලදී. විශ්වවිද්‍යාල දින දර්ශනය පිළියෙල කිරීම සඳහා අත්‍යවශ්‍ය වැඩ කටයුතු සිදු කරන ලදී.

2016 දී පවත්වන ලද සිසුන්ගේ තෘප්තිය පිළිබඳ සංගණනයෙන් පෙන්නුම් කරනුයේ ශ්‍රී.ලං.නැ.වි.වි. ශිෂ්‍ය ජීවිතයේ විවිධ අංශවලින්, අධ්‍යයන පාඨමාලාවන් බෙදාහැරීමට අදාළව සිසුන්ගේ සමස්ත තෘප්ති මට්ටම 75% ක් බව පර්යේෂණය කර ඇති අතර මෙය අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන්ට අදාළව තුලිත කාර්ය සාධනයක් පෙන්නුම් කරයි. මීළඟ වසරවලදී මෙය වඩා වැඩි දියුණු වූ තත්ත්වයක් පෙන්නුම් කරනු ඇත.

නව අධ්‍යයන පාඨමාලාවන් ගණනාවක් සැලසුම් කර ඇත. "තාක්ෂණික පීඨයක්" ස්ථාපිත කිරීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය යථාර්ථයක් වනු ඇති අතර ආසියානු තාක්ෂණ ආයතනයේ (ඒ.අයි.ටී.) ප්‍රවීණයන්ගේ සහයෝගය මත විෂය මාලාව නිර්මාණය කෙරෙනු ඇත.

විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය සාර්ථකව ක්‍රියාත්මක වේ. පසුගිය කාලය තුළ තරමක් දුරට නොසලකා හරින ලද අපගේ දේපළවල අයිතිය ලබාගැනීමේ ක්‍රියාවලිය අප විසින් කරගෙන යන ලදී. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය, කෘෂිකර්ම පීඨය, තාක්ෂණ පීඨය හා කාර්ය මණ්ඩල නේවාසිකාගාර සඳහා ගොඩනැගිලි සංකීර්ණයන් ඉදිකිරීම පිළිබඳ ප්‍රාරම්භක කටයුතු 2016 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

වෙන්කරන ලද අරමුදල් වලින් 95% ක් උපයෝගී කරගත් බැවින් ශ්‍රී.ලං.නැ.වි.වි. වෙන්කරන ලද අරමුදල් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අප ඉතා සෑහීමට පත්වෙමු. ඉදිරි වර්ෂවලදී වඩා වැඩි දියුණු වූ තත්ත්වයක් අපේක්ෂා කරන්නෙමු.

කෙසේ වෙතත්, මුළුමනින්ම නවක වදය තුරන් කිරීමේ තත්ත්වය තවදුරටත් පවත්වා ගෙන යාම, උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය වැඩිදියුණු කිරීම හා සේවක මණ්ඩල ප්‍රතිපාදන හා පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳ අපගේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් අප තරමක් පසුපසින් පසුවේ. මෙය ඉදිරි වර්ෂවලදී සාක්ෂාත් කරගත හැකිවනු ඇත.

අවසාන වශයෙන්, 2016 වර්ෂයේදී සතුටුදායක කාර්ය සාධනයක් ලඟාකර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී.ලං.නැ.වි.වි. කාර්ය මණ්ඩලයට මා සුභපතන අතර ඉදිරි වර්ෂවලදි මීටත් වඩා හොඳ කාර්ය සාධනයක් අපේක්ෂා කරන්නෙමි. එසේම සනාථන සභාව, ශ්‍රී.ලං.නැ.වි.වි. පාලක සභාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයට දිගින් දිගටම ශ්‍රී.ලං.නැ.වි.වි. සමඟ සම්බන්ධවීම සම්බන්ධයෙන් මාගේ ස්තූතිය පුදකරමි.

**මහාචාර්ය ටී. ජයසිංහම්**
***උපකුලපති***
***නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව***

## 3.2 විශේෂ අවස්ථා 2016

- තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනය සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය (ශ්‍රී.ලං.නැ.වි.වි) අතර වෘත්තීය සංවර්ධනය, කාර්ය මණ්ඩල හුවමාරුව, තාක්ෂණය හුවමාරුව පශ්චාත් උපාධි පුහුණුව, පර්යේෂණ සහයෝගිතාවය, නව තාක්ෂණ පීඨය සඳහා හවුල් සම්මන්ත්‍රණ/ සමුළු, හවුල් උපාධි පාඨමාලා හා විෂය මාලා සංවර්ධනය යනාදි සහයෝගීතා ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙහි ආරම්භයක් ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 26 දෙනෙකු කණ්ඩායම් දෙකක් (කණ්ඩායම් - 1 : ඔක්තෝබර් 17-24, 2016 හා කණ්ඩායම් - 2 : 14 – 21 නොවැම්බර්, 2016) ආසියානු තාක්ෂණ ආයතනයේ පුහුණු/ අත්දැකීම් ලබාගැනීම සඳහා සහභාගි වන ලදි. පශ්චාත් උපාධි කාලය තුල විදේශ රටක අත්දැකීමක් නොලද අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මෙම සංචාර සංවිධානය කරන ලද අතර මෙමගින් යහ භාවිතය තුලින් ධාරිතා සංවර්ධනය, ඉගෙනුම් ඉගැන්වීම් හි නූතන ප්‍රවණතා, පර්යේෂණ ක්‍රියාකාරකම්, පරිපාලනය හා කළමනාකරණය, කර්මාන්ත සමඟ සම්බන්ධතා හා ශිෂ්‍ය උපදේශනය යනාදි අරමුණු ඉලක්ක කරන ලදී.

- ඉන්දියාවේ තමිල්නාඩු හි අන්නාමලෙයි විශ්වවිද්‍යාලය හා ශ්‍රී.ලං.නැ.වි.වි අතර අභ්‍යන්තර උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් වලට සහභාගී වීම සඳහා කාර්ය මණ්ඩලය හා  ශිෂ්‍යයන් හුවමාරුව, පීඨ සංවර්ධනය, පීඨ සාමාජිකයන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩමුළු, කාර්ය මණ්ඩල සංවර්ධනය හා රැකියා මාර්ගෝපදේශනය පිළිබඳ උපදෙස් හා පුහුණුව, සමුළු , සම්මන්ත්‍රණ හා වැඩමුළු, යනාදිය සඳහා සහභාගීවීම ඇතුළත් අධ්‍යයන හා වෘත්තීය සංවර්ධන සහයෝගීතාවය උදෙසා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

- කාර්ය මණ්ඩල සංචාර, ශිෂ්‍ය හුවමාරුව හා විද්වත් කාර්යයන් හුවමාරුව යනාදිය ප්‍රවර්ධනය හා පහසුකම් සැලසීමේ අරමුණින් ඉන්දියාවේ පොන්ඩිචෙරි හී ප්‍රංශ ආයතනය හා ශ්‍රී.ලං.නැ.වි.වි අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

- ඉන්දියාවේ තමිල්නාඩුවේ තන්ජාවූර්හි පිහිටි දමිළ විශ්විද්‍යාලය හා ශ්‍රී.ලං.නැ.වි.වි. අතර පර්යේෂණ, පශ්චාත් උපාධි පුහුණුව, පොදු සමුළු/සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා ශිෂ්‍ය හා කාර්ය මණ්ඩලය හුවමාරුව සම්බන්ධයෙන් සහයෝගීතාවය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

- පර්යේෂණ සහයෝගීතා දිරිගැන්වීම, කාර්ය මණ්ඩල පුහුණුව හා හුවමාරුව සඳහා ඉන්දියාවේ බර්තියර් විශ්වවිද්‍යාලය හා ශ්‍රී.ලං.නැ.වි.වි අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ සියළුම විශ්වවිද්‍යාල අතරින් ලිංගික සාධාරණත්වය හා සමානාත්මතා ඒකකය ස්ථාපිත කරන ලද ප්‍රථම විශ්වවිද්‍යාලය ශ්‍රී.ලං.නැ.වි.වි වන අතර එය 2016 ජූනි 13 දින ආරම්භ කරන ලදී.

- නව ආයතනික සමාලෝචන අත්පොත - 2015ට අනුව ආයතනික සමාලෝචනය නිම කල ශ්‍රී ලංකාවේ ප්‍රථම විශ්වවිද්‍යාලය ශ්‍රී.ලං.නැ.වි.වි විය.

- "සමෝධානය තුළින් දැනුම ප්‍රවර්ධනය" යන තේමාව යටතේ 2016 මාර්තු 10 -11 දින දක්වා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 4 වන ජාත්‍යන්තර සමුළුව ( ICE 2016) පවත්වන ලදී.

- 2014 වර්ෂයේදී ප්‍රසිද්ධ කර සඟරාවල පළකරන ලද පර්යේෂණ පත්‍රිකා වෙනුවෙන් බත්තරමුල්ලේ වෝටර්ස් එජ් හිදි 2016 නොවැම්බර් 22 දින පැවති උත්සවයකදී ශ්‍රී.ලං.නැ.වි.වි. විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සිව් දෙනෙකු ජනාධිපති සම්මාන ලබාගත්හ.

- චීනයේදී පැවති 2වන ආසියානු විශ්වවිද්‍යාල බාස්කට්බෝල් ශූරතාවය-2016 සඳහා සහභාගි වූ ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල බාස්කට් බෝල් කණ්ඩායම නියෝජනය කරමින් ශ්‍රී.ලං.නැ.වි.වි යේ සිසුන් දෙදෙනෙකු සහභාගී විය.

- ශ්‍රී.ලං.නැ.වි.වි යේ මහජන සෞඛ්‍ය උපාධිය (BPH) ආරම්භ කිරීම සඳහා අත්දැකීම් ලබාගැනීම සඳහා නේපාලයේ තිබුවාන් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ආයතනය වෙත සංචාරයක් සංවිධානය කරන ලදී. විෂයමාලා අධ්‍යයනය හා එම වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ නියෝජිතයින් පිරිසක් මෙම ආයතනයේ සංචාරයක නියැලුණි.
- ශ්‍රී.ලං.නැ.වි.වි යේ ඉතිහාසයේ ප්‍රථම වතාවට උපකුලපතිවරයෙක් වර්ණවත් උත්සවයකදී සිය ධුරයේ කටයුතු 2016 ජනවාරි 09 වැනි නිල වශයෙන් භාර ගැනීමට කටයුතු කරන ලදී.
- ශ්‍රී.ලං.නැ.වි.වි යේ ප්‍රථම නියෝජ්‍ය උපකුලපතිවරයා ලෙස ආචාර්ය කේ.ඊ. කරුණාකරන් මහතා පත්කරන ලදී.
- 2016 අප්‍රේල් මස දී "සංවිධාන ප්‍රතිඵල රාමුව" නමින් වැඩමුළුවක් පවත්වන ලදී.
- පාලනය හා කළමනාකරණය අරමුණු කරගෙන පාලක සභාවේ සාමාජිකයන්ගේ හා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන නිලධාරින්ගේ සහභාගීත්වයෙන් "සංයුක්ත සැලැස්ම සමාලෝචනය - වර්තමාන තත්ත්වය හා අනාගත ඉලක්ක" යන මැයෙන් වැඩමුළුවක් 2016 ජුනි 10 සිට 12 දක්වා කාලයේ දී පවත්වන ලදී.

## 3.3 දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය 2016 වර්ෂයේ දී අධ්‍යයන ක්‍රියාකාරකම් එහි පීඨ 7ක් හා අධ්‍යයනාංශ 35ක් මඟින් අඛණ්ඩව බෙදා හැරීමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්විද්‍යාලය, 1981 අගෝස්තු මස 01 වන දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව විද්‍යා හා කෘෂිකර්ම යන පීඨ දෙකක් සමඟ මඩකලපුවේ විශ්වවිද්‍යාල විද්‍යාලය නමින් ආරම්භ කර ඇත. 1986 ඔක්තෝබර් මාසයේ දී වානිජ හා කළමනාකරණ පීඨය සහ කලා හා සංස්කෘත පීඨය යන අතිරේක පීඨයන්ගෙන් සමන්විත ව මෙම විශ්වවිද්‍යාලය ආයතනය සියළු සුදුසුකම් ඇති විශ්විවිද්‍යාලයක් ලෙස උසස් කරන ලදී. 2006 වර්ෂයේ දී සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය, සන්නිවේදන සහ ව්‍යාපාර අධ්‍යයන පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨ දෙකකින් සමන්විත ව 2001 ජුනි මස 15 දින ස්ථාපිත කරන ලද අතර දැනට දේශීය වෛද්‍ය ඒකකයක් ද ස්ථාපිත කර ඇත. මෙ වන විට ත්‍රිකුණාමල මණ්ඩපය ත්‍රිකුණාමලයේ සිට කි.මී. 10ක් උතුරු දෙසින් පිහිටි කෝනේසපුරි හි අක්කර 250 ක භූමියක පිහිටා ඇත.

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය (ස්.වි.සෞ.අ.ආ.) , 2005 මාර්තු මස 01 වන දින සිට නැගෙනහිර විශ්වවිද්‍යාලයට අනුබද්ධ කර ඇත. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීමට පෙර එය 1981දි ස්ථාපිත ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් විද්‍යාලය ලෙස නම් කරන ලද අතර ප්‍රාදේශීය කටයුතු හා හින්දු සංස්කෘතික අමාත්‍යාංශය යටතේත් පසුව සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේත් ක්‍රියාත්මක වේ.

රටේ සමාජ ආර්ථික හා සංස්කෘතික අවශ්‍යතා සඳහා සේවය කළ හැකි කුසලතා පූර්ණ උපාධිධාරීන් පිරිසක් බිහිකිරීම සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය සුවිශේෂ අවධානයක් යොමුකරනු ලැබේ. බහුවිධ පර්යේෂණ ප්‍රවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම තුලින් එහි පර්යේෂණ ධාරිතාවයන් ඉහළ නැංවීම සමඟින් කලාපයේ හා රටේ අවශ්‍යතා සඳහා සේවය සැපයීම සඳහා ඉමහත් පරිශ්‍රමයක් දරනු ලබන අතර කලාපයේ සාමය හා සමගිය ඇති කිරීම සඳහා ද එහි කාර්ය භාරය අවබෝධ කරගෙන ඇත.

## අ . පීඨ හා අධ්‍යයන පාඨමාලා :

ශ්‍රී.ලං.නැ.වි.වි. පහත පීඨ හා අධ්‍යයනාංශ යටතේ ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා පිරිනමනු ලබයි.

| පීඨය | දෙපාර්තමේන්තු |
|---|---|
| කෘෂිකර්මය | කෘෂි විද්‍යාව, කෘෂි රසායන විද්‍යාව, කෘෂි ආර්ථික විද්‍යාව, කෘෂි ඉංජිනේරු විද්‍යාව, සත්ත්ව විද්‍යාව, භෝග විද්‍යාව |
| කලා හා සංස්කෘත | අරාබි, සංසන්දනාත්මක ආගම්, අධ්‍යාපනය, ලලිත කලා, භූගෝල විද්‍යාව, හින්දු ශිෂ්ඨාචාරය, ඉතිහාසය, ඉස්ලාම් අධ්‍යයනය, භාෂා, සමාජ විද්‍යාවන් ප්‍රභේද: ක්‍රිස්තියානි, ආර්ථික විද්‍යාව |
| වාණිජ හා කළමනාකරණ | වාණිජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, කළමනාකරණය |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා | සායනික විද්‍යාව, මානව ජීව විද්‍යාව, වෛද්‍ය අධ්‍යාපන හා පර්යේෂණ, භෞත ව්‍යාධිවේදී, ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණය, අතිරේක සෞඛ්‍ය විද්‍යාව |
| විද්‍යා | උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව |
| ත්‍රිකුණාමල මණ්ඩපය | |
| සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යනය | ව්‍යාපාර හා කළමනාකරණ අධ්‍යනය , භාෂා හා සන්නිවේදන අධ්‍යනය |
| ව්‍යවහාරික විද්‍යාව | පරිගණක විද්‍යාව, භෞතික විද්‍යාව |
| | දේශිය වෛද්‍ය ඒකකය |

- කෘෂිකර්ම පීඨය මඟින් කෘෂිකර්ම විද්‍යාවේදී ගෞරව උපාධිය හා කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය පිරිනමනු ලබයි.
- කලා හා සංස්කෘත පීඨය මඟින් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය, සංසන්දනාත්මක ආගම් පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) ගෞරව උපාධිය, නාට්‍ය හා රංග කලාව, ආර්ථික විද්‍යාව, ලලිත කලා, භූගෝල විද්‍යාව, හින්දු සංස්කෘතිය, ඉතිහාසය, දර්ශනය, දේශපාලන විද්‍යාව,

සමාජ විද්‍යාව හා දෙමළ, අධ්‍යාපන ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය, ශාස්ත්‍රපති, දර්ශනවේදී හා දර්ශන ශූරී උපාධීන් පිරිනමනු ලැබේ.

- වාණිජ හා කළමනාකරණ පීඨය මඟින් වාණිජවේදී ගෞරව (වාණිජවේදී.ගෞරව) උපාධිය, වාණිජවේදී ගෞරව (ගිණුම්කරණ හා මූල්‍ය), වාණිජවේදී ගෞරව (ව්‍යවසාය සංවර්ධනය), වාණිජවේදී ගෞරව(ව්‍යාපාර ආර්ථික විද්‍යාව) ; ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව (බී.බී.ඒ. ගෞරව) උපාධිය, ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව(මානව සම්පත් කළමනාකරණය), ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව(අලෙවි කළමනාකරණ); කළමනාකරණ පශ්චාත් ඩිප්ලෝමාව (පී.ජී.ඩී.එම්), ව්‍යාපාර පරිපාලනපති (එම්.බී.ඒ) හා සංවර්ධන ආර්ථික විද්‍යාපති (එම්.ඩී.ඒ) උපාධිය පිරිනමනු ලබයි.

- සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය මඟින් වෛද්‍යවේදී හා හෙද විද්‍යාවේදී උපාධිය පිරිනමනු ලබයි.

- විද්‍යා පීඨය මඟින් විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය; උද්භිත විද්‍යාව පිළිබඳ ගෞරව (විශේෂ) උපාධිය, රසායන විද්‍යාව, පරිගනක විද්‍යාව; ගණිතය, භෞතික විද්‍යාව හා සත්ත්ව විද්‍යාව; විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති; දර්ශනපති හා දර්ශනශූරී පර්යේෂණ උපාධීන් පිරිනමනු ලබයි.


- ත්‍රිකුණාමල මණ්ඩපය යටතේ සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය හා දේශීය වෛද්‍ය ඒකකය පවතින අතර එමඟින් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය; කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය, අලෙවි කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය; තොරතුරු කළමනාකරණය; ශාස්ත්‍රවේදී ගෞරව (භාෂා), ශාස්ත්‍රවේදී ගෞරව (සන්නිවේදනය), ව්‍යාවහාරික භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රෝනික විද්‍යාවේදී, පරිගනක විද්‍යාවේදී හා දේශිය වෛද්‍ය හා සායනික විද්‍යා උපාධීන් පිරිනමනු ලබයි.

- බාහිර උපාධි හා ව්‍යාපෘති පාඨමාලා මධ්‍යස්ථානය (සී.ඊ.ඩී.ඊ.සී)*:* වැඩි ශිෂ්‍ය ප්‍රජාවකට විශ්වවිද්‍යාල අධ්‍යාපන අවස්ථාවන් ලබා දීම සඳහා පීඨ මඟින් ද බාහිර උපාධි පාඨමාලාවන් පිරිනමනු ලබයි. මෙම උපාධි පාඨමාලාවන් බාහිර උපාධි හා ව්‍යාපෘති පාඨමාලා මධ්‍යස්ථානය මඟින් පිරිනමනු ලබන අතර ඒවා නම් ශාස්ත්‍රවේදී, ව්‍යාපාර පරිපාලනවේදී, කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී, විද්‍යාවේදී, හෙද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී හා ත්‍රිකුණාමල මණ්ඩපය මඟින් ලබාදෙන කළමනාකරණ විද්‍යාවේදී හා සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධීන් වේ.

## ආ . නව පීඨ හා අධ්‍යයන පාඨමාලා

තාක්ෂණික නිපුණතාවයෙන් සමන්විත උපාධිධාරීන් පිරිසක් බිහිකිරීමේ ප්‍රතිපත්තිය අනුව යමින් තාක්ෂණික පීඨයක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී.ලං.නැ.වි.වි විසින් කරගෙන යන ලදී. “බලශක්තිය හා පරිසරය”, “බහුවිධ අධ්‍යයනය” යන අධ්‍යයන දෙපාර්තමේන්තු හතර අතරින් අවසාන දෙක ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ජීව පද්ධති තාක්ෂණ (කෘෂි තාක්ෂණ හා ව්‍යවසායකත්වය) උපාධි පාඨමාලාව සඳහා ද අනුමැතිය ලබා දී ඇති අතර එය ආරම්භ කිරීමට නියමිතය. තවද, “තොරතුරු හා සන්නිවේදන උපාධිය” හා “ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උපාධිය” (බලශක්තිය හා පරිසරය) යන උපාධි පාඨමාලාවන් දෙක ආරම්භ කිරීම සඳහා යෝජනාවලින් පිළියෙල කිරීම මූලික අදියරේ පවතී.

## ඇ . විශ්වවිද්‍යාලයේ සංවිධාන සැලැස්ම



## ඇ . පාලක සභාව

### පාලක සභාවේ සාමාජිකයන්

| | |
|---|---|
| මහාචාර්ය උමා කුමාරස්වාමි | නිසි බලධාරී - සභාපති (2016 ජනවාරි දක්වා) |
| මහාචාර්ය ටී. ජයසිංගම් | උපකුලපති - සභාපති (2016 ජනවාරි සිට) |
| ආචාර්ය කේ.ඊ. කරුණාකරන් | නියෝජ්‍ය උපකුලපති (2016 අප්‍රේල් සිට) |
| ආචාර්ය වී. කනගසිංගම් | මණ්ඩපාධිපති, ත්‍රිකුණාමල මණ්ඩලය |
| ආචාර්ය ටී. සුන්දරෙසන් | පීඨාධිපති / සෞ.ආ.වි.පී. (2016 ජනවාරි දක්වා) |
| ආචාර්ය ඒ.එන්. අරුල්ප්‍රගාසම් | වැඩබලන පීඨාධිපති / සෞ.ආ.වි.පී. (2016 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා) හා සැප්තැම්බර් සිට පීඨාධිපති |
| ආචාර්ය කේ. රාජේන්ද්‍රම් | පීඨාධිපති /කලා හා සංස්කෘත පීඨය (2016 නොවැම්බර් දක්වා) |
| එම්. රවි මයා | පීඨාධිපති / කලා හා සංස්කෘත පීඨය (2016 දෙසැම්බර් සිට) |
| ආර්. උදයකුමාර් මයා | පීඨාධිපති / වාණිජ හා කළමනාකරණ පීඨය |
| ආචාර්ය එෆ්.සී. රගෙල් | පීඨාධිපති /විද්‍යා පීඨය (2016 ජනවාරි දක්වා) |
| ආචාර්ය (මිය) එම්. විනෝබබා | පීඨාධිපති / විද්‍යා පීඨය (2016 පෙබරවාරි සිට) |
| ආචාර්ය පී. සිවරාජා | පීඨාධිපති / කෘෂිකර්ම විද්‍යා පීඨය |
| ටී. බාස්කර් මයා | පීඨාධිපති /සෞ.ආ.වි.වි., ත්‍රිකුණාමල මණ්ඩලය (2016 ඔක්තොබර් දක්වා) |
| කේ. ශාන්ත්‍රකුමාර් මිය | වැඩබලන පීඨාධිපති / සෞ.ආ.වි.වි., ත්‍රිකුණාමල මණ්ඩලය (2016 දෙසැම්බර් සිට) |
| ආචාර්ය එන්. ප්‍රතීෂ් | පීඨාධිපති /ව්‍යවහාරික විද්‍යා පීඨය, ත්‍රිකුණාමල මණ්ඩලය |

### වි.වි.ප්‍ර.කො.ස. විසින් පත්කරන ලද

පී.එස්.එම්. චාල්ස් මිය
පූජ්‍ය පෝල් රොබින්සන් පියතුමා
ඒ. ඥානදාසන් මයා
මහාචාර්ය ආර්. සිවකනෙසන්
ආචාර්ය එම්.එස්. ඉබ්රාලෙබ්බෙ
ආචාර්ය එච්.ආර්. තඹවිට
පී.ටී.ඒ. හසන් මයා
ආචාර්ය එස්. මෞනගුරු
ආචාර්ය එස්.එම්. හුසෙන්
ආචාර්ය එන්. තමිල්වන්නන්
ආර්. කන්නන් මයා

### සනාථන සභාව විසින් තෝරා පත්කරන ලද සාමාජිකයන්

ආචාර්ය කේ.ඊ. කරුණාකරන් (2016 පෙබරවාරි සිට මාර්තු දක්වා)
පී. සච්දනන්දම් මයා (2016 අප්‍රේල් දක්වා)
එම්. රවි මයා (2016 අගෝස්තු සිට ඔක්තොම්බර් දක්වා)
ටී. සදානන්දන් මයා(2016 ජුලි සිට)

### පාලක සභාවේ ලේකම්

වී. කාන්දීපන් මයා, ලේඛකාධිකාරි, ශ්‍රී.ලං.නැ.වි.වි.

## ඉ . සනාථන සභාව

### සනාථන සභා සාමාජිකයන්

| | |
|---|---|
| මහාචාර්ය උමා කුමාරස්වාමි | නිසි බලධාරී - සභාපති (2016 ජනවාරි දක්වා) |
| මහාචාර්ය ටී. ජයසිංගම් | උපකුලපති - සභාපති (2016 ජනවාරි සිට) |
| ආචාර්ය කේ.ඊ. කරුණාකරන් | නියෝජ්‍ය උපකුලපති (2016 අප්‍රේල් සිට) |
| ආචාර්ය වී. කනගසිංගම් | මණ්ඩපාධිපති, ත්‍රිකුණාමල මණ්ඩලය |
| ආචාර්ය එස්. ජයසංකර් | අධ්‍යක්ෂක/ස්.වි.සෞ.අ.ආ. |
| ආචාර්ය පී. සිවරාජා | පීඨාධිපති /කෘෂිකර්ම විද්‍යා පීඨය |
| ආචාර්ය කේ. රාජේන්ද්‍රම් | පීඨාධිපති /කලා හා සංස්කෘත පීඨය (2016 නොවැම්බර් දක්වා) |
| එම්. රවි මයා | පීඨාධිපති / කලා හා සංස්කෘත පීඨය (2016 දෙසැම්බර් සිට) |
| ආචාර්ය එෆ්.සී. රගෙල් | පීඨාධිපති /විද්‍යා පීඨය (2016 පෙබරවාරි දක්වා) |
| ආචාර්ය (මිය) එම්. විනෝබබා | පීඨාධිපති /විද්‍යා පීඨය (2016 මාර්තු සිට) |
| ආචාර්ය කේ.ටී. සුන්දරෙසන් | පීඨාධිපති /සෞ.ආ.වි.පී. (2016 පෙබරවාරි දක්වා) |
| ආචාර්ය ඒ.එන්. අරුල්ප්‍රගාසම් | වැඩබලන පීඨාධිපති / සෞ.ආ.වි.පී. (2016 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා) හා සැප්තැම්බර් සිට පීඨාධිපති |
| ආර්. උදයකුමාර් මයා | පීඨාධිපති /වාණිජ හා කළමනාකරණ පීඨය |
| ටී. බාස්කර් මයා | පීඨාධිපති /සෞ.ආ.වි.වි., ත්‍රි.ම |
| ආචාර්ය එන්. ප්‍රතීෂ් | පීඨාධිපති /ව්‍යවහාරික විද්‍යා, ත්‍රි.ම |
| මහාචාර්ය ඒ. මුරුගදාස් | මහාචාර්ය/දෙමළ භාෂාව |
| මහාචාර්ය (මිය) ටී. මහේන්ද්‍රන් | මහාචාර්ය/කෘෂි රසායන විද්‍යාව |
| මහාචාර්ය පී. විනෝබාබා | මහාචාර්ය/සත්ත්ව විද්‍යාව/අංශාධිපති/සත්ත්ව විද්‍යාව |
| මහාචාර්ය වී. ගුණරත්නම් | මහාචාර්ය/දේශපාලන විද්‍යා (2016 අප්‍රේල් සිට) |
| ටී. අරුල්නන්දි මිය | පුස්තකාලයාධිපති |
| ආචාර්ය (මිය) එන්. රොඩ්නි ප්‍රනාන්දු | අංශාධිපති /කෘෂි ජීව විද්‍යාව |
| ආචාර්ය එම්. පක්තිනාදන් | අංශාධිපති /සත්ත්ව විද්‍යාව (2016 ජුනි දක්වා) |
| එම්.එස්.එම්. නෆීස් මයා | අංශාධිපති / සත්ත්ව විද්‍යාව (2016 ජුලි සිට) |
| ආචාර්ය (මිය) පී.ප්‍රේමනන්දරාජා | අංශාධිපති / කෘෂි රසායන විද්‍යාව |
| එස්. ශ්‍රී ක්‍රිෂ්ණා මයා | අංශාධිපති /භෝග විද්‍යාව |
| ටී. ගෙරෙදරන් මිය | අංශාධිපති /කෘෂි ආර්ථික විද්‍යාව (2016 සැප්තැම්බර් දක්වා) |
| ටී. කිරුපනාන්දන් මිය | අංශාධිපති / කෘෂි ආර්ථික විද්‍යාව (2016 සැප්තැම්බර් සිට) |
| ආර්. තිවෛදර්සන් මයා | අංශාධිපති /කෘෂි ඉංජිනේරු විද්‍යාව (2016 මාර්තු දක්වා) |
| ආර්. බවදරණි මිය | අංශාධිපති / කෘෂි ඉංජිනේරු විද්‍යාව (2016 අප්‍රේල් සිට) |
| ආචාර්ය එම්. වර්ණකුලසිංගම් | අංශාධිපති /භූගෝල විද්‍යාව |
| ආචාර්ය වී. ඉන්පාමෝහන් | වැඩබලන අංශාධිපති /ලලිත කලා |
| ආචාර්ය පී. එම්. හම්තුන් | අංශාධිපති /අරාබි |
| පී. සච්දනන්දම් මයා | අංශාධිපති /සංසන්දනාත්මක ආගම් හා සමාජ සහජීවනය (2016 ජුලි දක්වා) |
| ආර්. සහයසීලන් මයා | වැඩබලන අංශාධිපති / සංසන්දනාත්මක ආගම් හා සමාජ සහජීවනය (2016 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා) හා සැප්තැම්බර් සිට අංශාධිපති |
| ආර්.වී. ෆ්‍රැන්සිස් මිය | අංශාධිපති /භාෂා සහ වැඩබලන අංශාධිපති /ඉ.භා.ඉ.ඒ. |
| එම්. රවි මයා | අංශාධිපති /සමාජ විද්‍යාව (2016 නොවැම්බර් දක්වා) |

| | |
|---|---|
| **ආචාර්ය ජී. තිල්ලෛයිනාදන්** | **අංශාධිපති /සමාජ විද්‍යාව** (2016 දෙසැම්බර් සිට) |
| **එම්.ටී.එම්. රිස්වි මයා** | **අංශාධිපති /ඉස්ලාම් අධ්‍යයනය** |
| **එස්. කේසවන් මිය** | **අංශාධිපති /හින්දු ශිෂ්ඨාචාරය** |
| **ආචාර්ය සී. අරුල්මෝලි** | **අංශාධිපති /අධ්‍යාපනය හා ළමා ආරක්ෂාව** |
| **එස්.කේ. ශිවහනේෂන් මයා** | **අංශාධිපති /ඉතිහාසය** |
| **එස්. මහේෂ්වරනාදන් මිය** | **අංශාධිපති /ආර්ථික විද්‍යාව** |
| **සී. ශ්‍රීදරන් මිය** | **අංශාධිපති /වාණිජ්‍ය** |
| **ආර්.වී. රගෙල් මිය** | **අංශාධිපති /කළමනාකරණ** |
| **ආචාර්ය පී. පෙරදීපන්** | **අංශාධිපති /භෞතික විද්‍යාව** |
| **ආචාර්ය එම්. සිදම්බරෙසන්** | **අංශාධිපති /රසායන විද්‍යාව** |
| **එස්. සදානන්දන් මිය** | **අංශාධිපති /ගණිතය** |
| **යූ. මදිවෙන්දන් මිය** | **අංශාධිපති /උද්භිද විද්‍යාව** |
| **නිරුබා එස්. ජයසුන්දර මිය** | **අංශාධිපති /භාෂා හා සන්නිවේදන අධ්‍යයනය, ත්‍රි.ම** (2016 ජුලි දක්වා) |
| **ආචාර්ය වී.ජේ. නවීන්රාජ්** | **අංශාධිපති / භාෂා හා සන්නිවේදන අධ්‍යයනය, ත්‍රි.ම** (2016 නොවැම්බර් සිට) |
| **කේ. සාන්ත්‍රර්කුමාර් මිය** | **අංශාධිපති /ව්‍යාපාර හා කළමනාකරණ අධ්‍යයනය, ත්‍රි.ම** |
| **එස්. තඩ්වනමූරතී මයා** | **වැඩබලන අංශාධිපති /පරිගනක විද්‍යාව, ත්‍රි.ම** (2016 පෙබරවාරි දක්වා) හා මාර්තු සිට **අංශාධිපති** |
| **එස්. ලෝහීස්වරන් මයා** | **අංශාධිපති / භෞතික විද්‍යාව , ත්‍රි.ම** |
| **ආචාර්ය පූජ්‍ය** Sr. **ජොසේෆා ජොසෆ්** | **අංශාධිපති /අතිරේක සෞඛ්‍ය විද්‍යාව** |
| **ආචාර්ය කේ.ඊ. කරුණාකරන්** | **අංශාධිපති / සායනික විද්‍යාව** (2016 ජනවාරි දක්වා) |
| **ආචාර්ය (මිය) ඒ.එන්. අරුල්ප්‍රගාසම්** | **අංශාධිපති / සායනික විද්‍යාව** (2016 පෙබරවාරි සිට මාර්තු දක්වා) |
| **ආචාර්ය එම්. තිරුකුමාර්** | **වැඩලන අංශාධිපති / සායනික විද්‍යාව** (2016 නොවැම්බර් සිට) |
| **ආචාර්ය (මිය) ඒ.එන්. අරුල්ප්‍රගාසම්** | **අංශාධිපති / භෞත ව්‍යාධිවේදී** (2016 ජනවාරි දක්වා) |
| **ආචාර්ය එම්. තිරුකුමාර්** | **වැඩලන අංශාධිපති / භෞත ව්‍යාධිවේදී** (2016 පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා) |
| **ආචාර්ය එම්. තිරුකුමාර්** | **වැඩලන අංශාධිපති /වෛද්‍ය අධ්‍යාපනය හා පර්යේෂණ** (2016 පෙබරවාරි දක්වා) |
| **ටී. සදානන්දන් මයා** | **අංශාධිපති / වෛද්‍ය අධ්‍යාපනය හා පර්යේෂණ** (2016 මාර්තු සිට) |
| **ආචාර්ය (මිය) එම්. දයාපරන්** | **අංශාධිපති /මානව ජීව විද්‍යාව** |
| **ආචාර්ය (මිය) ජේ. මහින්දන්** | **අංශාධිපති /ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණය** |
| **ආචාර්ය එම්.එම්. මහුසුන්** | **නියෝජිත/කෘෂිකර්ම පීඨය** |
| **කේ. තිරුමාපන් මිය** | **නියෝජිත / කෘෂිකර්ම පීඨය** |
| **ආචාර්ය ඒ. ඇන්ටන් අරුල්රාජ්** | **නියෝජිත /වාණිජ හා කළමනාකරණ පීඨය** |
| **ආචාර්ය එන්. රාජේස්වරම්** | **නියෝජිත / වාණිජ හා කළමනාකරණ පීඨය** |
| **පී. පරමදේවන් මයා** | **නියෝජිත /විද්‍යා පීඨය** (2016 පෙබරවාරි සිට) |
| **ආචාර්ය (මිය) සී. මහේන්ද්‍රනාදන්** | **නියෝජිත / විද්‍යා පීඨය** (2016 පෙබරවාරි දක්වා) |
| **ආචාර්ය ටී. මදිවෙන්දන්** | **නියෝජිත / විද්‍යා පීඨය** (2016 පෙබරවාරි සිට) |
| **ඒ.ජේ. හුසේන් මයා** | **නියෝජිත /කලා හා සංස්කෘත පීඨය** |
| **ආචාර්ය ජේ.කෙනඩි** | **නියෝජිත / කලා හා සංස්කෘත පීඨය** (2016 ජුලි දක්වා) |

| | |
|---|---|
| ආර්. කිරුපරාජා මයා | නියෝජිත / කලා හා සංස්කෘත පීඨය (2016 ඔක්තෝබර් සිට) |
| ටී. සදානන්දන් මයා | නියෝජිත / සෞ.ආ.වි.පී. (2016 පෙබරවාරි දක්වා) |
| ආචාර්ය ජේ. ජයරුබන් | නියෝජිත / සෞ.ආ.වි.පී. (2016 පෙබරවාරි සිට) |
| ආචාර්ය කේ.ඊ. කරුණාකරන් | නියෝජිත / සෞ.ආ.වි.පී. (2016 පෙබරවාරි සිට මැයි දක්වා) |
| ආචාර්ය කේ. කාර්දීපන් | නියෝජිත / සෞ.ආ.වි.පී. (2016 ජනවාරි සිට) |

## සනාථන සභාවේ ලේකම්

**වී. කාන්දීපන් මයා, ලේඛකාධිකාරි, නැගෙනහිර විශ්වවිද්‍යාලය**

| | | |
|---|---|---|
| * ස්.වි.සෞ.අ.අ. | - | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය |
| සෞ.ආ.වි.පී. | - | සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය |
| ස.ආ. | - | සංසන්දනාත්මක ආගම්, ස.ස. - සමාජ සහජීවනය |
| ත්‍රි.ම. | - | ත්‍රිකුණාමල මණ්ඩපය |
| සෞ.ආ.වි.වි. | - | සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය |

## 3.4 අසාර්ථකවීම් හා හේතු පැහැදිලි කිරීම්

ඇ. ගැටුම්කාරි කාලයේ ලද අත්දැකිම්වල ප්‍රතිඵලයක් ලෙස වියහැකි කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය තවමත් ඉතා පහළ මට්ටමක පවතී. විවිධ හේතුන් මත බෝහෝ දෙනා ඔවුන්ගේ සේවය අධ්‍යයන/පරිපාලන කාර්යයට පමණක් සීමාකර තිබුණි.

ආ. මුළුමනින්ම නවක වදයෙන් තොර විශ්වවිද්‍යාලයක් බවට පත්කිරීම අපගේ ප්‍රාර්ථනය මෙන්ම අරමුණු වන අතර මෙයට විරුද්ධව බහුතරයක් නැගී නොසිටීම නිසා මෙය ඉතා දුෂ්කර කාර්යයක් වන අතර ප්‍රථම වසරේ සිසුන්ගේ සිට කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දක්වා බහුතරයක් නවක වදය වැළැක්වීම පරිපාලනයේ කාර්යයක් ලෙස සළකති. මෙම තර්ජනයට එරෙහිව සටනට අපගේ නායකත්වය දෙන අතර මෙහි ධනාත්මක ප්‍රතිඵලය ශ්‍රී.ලං.නැ.වි.වි. සුවිශාල අභිවෘද්ධියක් ඇති කරනු ඇත.

ඇ. කාර්ය මණ්ඩලයේ හා පහසුකම්වල සීමාකම දැනට ඇති දුෂ්කරතාවයක් වන අතර මෙය දින දර්ශනය ප්‍රමාද කිරිමට ද හේතු වී ඇති අතර අවශ්‍ය සම්පත් ලබාගැනීම සඳහා අපගේ ඉල්ලීම් තරමක් සලකා බලන ලදී. මෙම ඉල්ලීම සපුරාලීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

## 3.5 අනාගත සැලසුම්

අ. විශ්වවිද්‍යාලය තුල නවක වදය තුරන් කිරීම හා ලිංගික සාධාරණත්වය හා සමානාත්මතාවය එහි ප්‍රමුඛයන් ලෙස සැලකෙන අපගේ ප්‍රධාන තේමාව වේ. ලිංගික සාධාරණත්වය හා සමානාත්මතාවය (ජී.ඊ.ඊ.) සඳහා වන එක්සත් ජාතින්ගේ අධ්‍යාපනික (යුනෙස්කෝ) ආධාර ලබාදීම මෙය සනාථ කරයි.

ආ. ශ්‍රී ලංකාවෙන් එපිට විශ්වවිද්‍යාලවල වැඩසටහන් සංවිධානය කිරීම තුළින් කාර්ය මණ්ඩලයේ ධාරිතාවය වර්ධනයට කටයුතු කරන ලද අතර මෙහි ප්‍රතිඵල මේ වන විටත් ලැබෙමින් පවතී. අභිප්‍රේරණ වැඩසටහන්, ක්‍රියාශීලි කාර්ය මණ්ඩලයට හා සිසුන්ට සම්මාන ලබාදීම අනාගතයේදී ප්‍රධාන තැනක් ගනු ඇත.

ඇ. විශ්වවිද්‍යාල - නාගරික වැඩසටහන සංවර්ධනය, ප්‍රජාව සමඟ සම්බන්ධ කරලීම සඳහා සංවර්ධනය කරන ලද අතර මේ සඳහා වන යෝජනාවලිය භාර දී ඇත. මෙය ආසන්න ප්‍රදේශයේ සිටින ප්‍රජාවට වඩා සමීප කරවන අතර ප්‍රජාවගේ උන්නතිය සඳහා හේතුවනු ඇත.

ඈ. සාම අධ්‍යයනය, නාවික විද්‍යා හා තාක්ෂණය, සංචාරක හා ආගන්තුක සත්කාර, නීතිය හා කිරිපට්ටි විද්‍යාව පිළිබඳ අධ්‍යයන පාඨමාලා යෝජනා කර ඇත.

ඉ. සියළුම පීඨවල අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්ගේ අධ්‍යයන පාඨමාලාවන්ට සීමාවාසික පුහුණුව ඇතුළත් කෙරෙනු ඇත.

## 4. සිසුන් සහ සම්පත් පිළිබඳ විස්තර:

| පීඨය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| කලා හා සංස්කෘත | ශාස්ත්‍රවේදී | 1462 | 56 | 19 |
| කෘෂිකර්ම | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 271 | 32 | 34 |
| වාණිජ හා කළමනාකරණ | ව්‍යාපාර පරිපාලනවේදී | 452 | 23 | 10 |
| | වාණිජවේදී | 384 | | |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා | වෛද්‍යවේදී | 380 | 31 | 37 |
| | හෙද විද්‍යාවේදී | 81 | | |
| විද්‍යා | විද්‍යාවේදී (ජීව) | 229 | 32 | 32 |
| | විද්‍යාවේදී (භෞතික) | 256 | | |
| පුස්තකාලය | | - | 07 | 13 |
| අනෙකුත් දෙපාර්තමේන්තු | | - | - | 204 |
| එකතුව | | **3515** | **181** | **349** |


**ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය)**

| පීඨය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනය | කළමනාකරණ විද්‍යාවේදී | 314 | 11 | 02 |
| | ශාස්ත්‍රවේදී සන්නිවේදන අධ්‍යයන | 183 | 05 | 02 |
| | ශාස්ත්‍රවේදී භාෂා | | 02 | |
| | ශාස්ත්‍රවේදී වාග් විද්‍යාව | - | 01 | |
| ව්‍යවහාරික විද්‍යාව | පරිගණක විද්‍යාවේදී | 21 | 07 | 03 |
| | ව්‍යවහාරික භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රෝනික විද්‍යාවේදී | 44 | 04 | |
| දේශීය වෛද්‍ය ඒකකය | දේශීය වෛද්‍ය හා සැත්කම් පිළිබඳ විද්‍යාවේදී | 154 | 09 | 03 |
| පුස්තකාලය | | - | 01 | 05 |
| අනෙකුත් දෙපාර්තමේන්තු | | - | - | 42 |
| එකතුව | | **716** | **40** | **57** |


## 4.1 ශිෂ්‍ය ජනගහනය

ශ්‍රී.ලං.නැ.වි.වි. (ප්‍රධාන විශ්වවිද්‍යාලය) හා ත්‍රිකුණාමල මණ්ඩපයේ එකිනෙක පීඨ අතර සමානුපාතික ශිෂ්‍ය ව්‍යාප්තිය පහත වගුව මගින් පෙන්නුම් කරනු ලැබේ. (වගුව 2)

ශ්‍රී.ලං.නැ.වි.වි.




ත්‍රිකුණාමල මණ්ඩපය




වගුව ***2:*** ශිෂ්‍ය ජනගහනයේ ව්‍යාප්තිය

### දේශීය සිසුන්:

| ශ්‍රී.ලං.නැ.වි.වි. | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම 2016 | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | 5 වන වසර සිසුන් | උපාධිදාරි සංඛ්‍යාව |
| කලා හා සංස්කෘත | ශාස්ත්‍රවේදී | දෙමළ | 400 | 400 | 517 | 545 | - | - | 87 |
| කෘෂිකර්ම | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | 126 | 84 | 75 | 112 | - | - | 80 |
| වාණිජ හා කළමනාකරණ | ව්‍යාපාර පරිපාලනවේදී | ඉංග්‍රීසි | 97 | 95 | 95 | 176 | 86 | - | 61 |
| | වාණිජවේදී | ඉංග්‍රීසි | 100 | 88 | 77 | 134 | 85 | - | 51 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා | වෛද්‍යවේදී | ඉංග්‍රීසි | 131 | 59(1st year) 71(Fresher) | 66 | 58 | 75 | 51 | 58 |
| | හෙද විද්‍යාවේදී | ඉංග්‍රීසි | 31 | 29 | 14 | 16 | 22 | - | 26 |
| විද්‍යා | විද්‍යාවේදී (ජීව) | ඉංග්‍රීසි | 108 | 58 | 107 | 64 | - | - | 111 |
| | විද්‍යාවේදී (භෞතික) | ඉංග්‍රීසි | 121 | 77 | 124 | 55 | - | - | |
| එකතුව | | | **1114** | **961** | **1075** | **1160** | **268** | **51** | **474** |

| ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනිම 2016 | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | 5 වන වසර සිසුන් | උපාධිදාරි සංඛ්‍යාව |
| ව්‍යවහාරික විද්‍යාව | පරිගණක විද්‍යාවේදී | ඉංග්‍රිසි | 14 | 14 | 7 | - | - | - | - |
| | ව්‍යවහාරික භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රෝනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රිසි | 22 | 22 | 22 | - | - | - | - |
| සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනය | විද්‍යාවේදී කළමනාකරණ (සාමාන්‍ය හා විශේෂවේදී) | ඉංග්‍රිසි | 86 | 77 | 79 | 66 | 92 | - | 32 |
| | සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී | ඉංග්‍රිසි | 93 | 74 | 24 | 17 | 8 | - | 17 |
| | භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී | ඉංග්‍රිසි | - | - | 39 | 21 | - | | 11 |
| දේශීය වෛද්‍ය ඒකකය | දේශිය වෛද්‍ය හා සැත්කම් පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රිසි | 50 | 43 | 49 | 22 | 25 | 15 | 16 |
| එකතුව | | | **265** | **230** | **220** | **126** | **125** | **15** | **76** |


**විදේශිය සිසුන්:**


| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනිම 2016 | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | 5 වන වසර සිසුන් | උපාධිදාරි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| වාණිජ හා කළමනාකරණ | ව්‍යාපාර පරිපාලනවේදී | ඉංග්‍රිසි | - | - | 1 | - | - | - | - |
| | වාණිජවේදී | ඉංග්‍රිසි | - | - | 1 | - | - | - | - |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා | වෛද්‍යවේදී හා සායනික විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රිසි | - | 4 | 3 | - | - | - | - |
| එකතුව | | | - | **4** | **5** | - | - | - | - |

## 4.2 කාර්ය මණ්ඩල සම්පත්

34% ක අධ්‍යයන, 4 % ක පරිපාලන, 3% ක අධ්‍යයන සහායක හා 59% ක සංයුතියකින් යුත් ස්ථිර කාර්ය මණ්ඩලයේ 530 දෙනෙකුගේ සහයෝගය යටතේ විශ්වවිද්‍යාලය එහි අරමුණු කරා ගමන් කරන ලදී.

වගුව *3:* කාර්ය මණ්ඩල ශක්තිය – *2016*





| ශ්‍රී.ලං.නැ.වි.වි. (මඩකලපුව) | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාර්ය මණ්ඩලය | වැටුප් පරිමාණය | අනුමත කාර්ය මණ්ඩලය | පුරවන ලද කාර්ය මණ්ඩලය | | | කාර්ය මණ්ඩල පුරප්පාඩු |
| | | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | U-AC 3 to U-AC 5 | 237 | 112 | 62 | 174 | 63 |
| | U-AC 1 to U-AC 2 | 62 | 19 | 60 | 79 | -17 |
| පුස්තකාලය (වෘත්තීය කාර්ය මණ්ඩලය) | U-AC 5 | 1 | - | 1 | 1 | 0 |
| | U-AC 4 | - | - | - | - | - |
| | U-AC 3 | 6 | 4 | 2 | 6 | 0 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | U-EX 3 | 2 | 1 | - | 1 | 1 |
| | U-EX 2 | 11 | 3 | 2 | 5 | 6 |
| | U-EX 1 | 14 | 12 | 2 | 14 | 0 |
| අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය | U-EX 3 | - | - | - | - | - |
| | U-EX 2 | - | - | - | - | - |
| | U-EX 1 | - | - | - | - | - |
| | U-MO 2 | - | - | - | - | - |
| | U-MO 1 | 1 | 1 | - | 1 | 0 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | U-AS 2 | 8 | 5 | 3 | 8 | 0 |
| | U-AS 1 | 8 | 4 | 1 | 5 | 3 |
| තාක්ෂණික කාර්ය මණ්ඩලය | U-MT 1 | 86 | 13 | 2 | 15 | 71 |
| | U-MN 4 | 7 | 8 | 1 | 9 | -2 |
| | U-MN 3 | 3 | - | - | 0 | 3 |
| | U-MN 2 | - | - | - | - | - |
| | U-MN 1 | - | - | - | - | - |
| | U-EX 2 | - | - | - | - | - |
| | U-EX 1 | 3 | 1 | 1 | 2 | 1 |
| ලිපිකාර හා අනුබද්ධ | U-MN 4 | 12 | 6 | 13 | 19 | -7 |
| | U-MN 3 | 11 | 1 | 3 | 4 | 7 |
| | U-MN 2 | 4 | 1 | 1 | 2 | 2 |
| | U-MN 1 | 57 | 47 | 37 | 84 | -27 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ප්‍රාථමික කාර්ය මණ්ඩලය | U-PL 3 | 27 | 66 | 2 | 68 | -41 |
| | U-PL 2 | 30 | 22 | 6 | 28 | 2 |
| | U-PL 1 | 130 | 80 | 4 | 84 | 46 |
| එකතුව | | **720** | **387** | **143** | **530** | **190** |

**ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය)**

| කාර්ය මණ්ඩලය | වැටුප් පරිමාණය | අනුමත කාර්ය මණ්ඩලය | පුරවන ලද කාර්ය මණ්ඩලය | | | කාර්ය මණ්ඩල පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | U-AC 3 to U-AC 5 | 45 | 15 | 24 | 39 | 6 |
| | U-AC 1 to U-AC 2 | 2 | 0 | 6 | 6 | -4 |
| පුස්තකාලය (වෘත්තීය කාර්ය මණ්ඩලය) | U-AC 5 | - | - | - | - | - |
| | U-AC 4 | - | - | - | - | - |
| | U-AC 3 | 1 | 0 | 1 | 1 | 0 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | U-EX 3 | - | - | - | - | - |
| | U-EX 2 | 3 | 1 | 0 | 1 | 2 |
| | U-EX 1 | 5 | 3 | 3 | 6 | -1 |
| අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය | U-EX 3 | - | - | - | - | - |
| | U-EX 2 | - | - | - | - | - |
| | U-EX 1 | - | - | - | - | - |
| | U-MO 2 | - | - | - | - | - |
| | U-MO 1 | 1 | - | - | 0 | 1 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | U-AS 2 | 5 | 2 | 0 | 2 | 3 |
| | U-AS 1 | 2 | 1 | 0 | 1 | 1 |
| තාක්ෂණික කාර්ය මණ්ඩලය | U-MT 1 | 4 | 1 | 1 | 2 | 2 |
| | U-MN 4 | - | - | - | - | - |
| | U-MN 3 | 2 | - | - | 0 | 2 |
| | U-MN 2 | 0 | 1 | 0 | 1 | -1 |
| | U-MN 1 | - | - | - | - | - |
| | U-EX 2 | - | - | - | - | - |
| | U-EX 1 | - | - | - | - | - |
| ලිපිකාර හා අනුබද්ධ | U-MN 4 | 0 | 1 | 1 | 2 | -2 |
| | U-MN 3 | 4 | 1 | 2 | 3 | 1 |
| | U-MN 2 | 1 | 2 | 0 | 2 | -1 |
| | U-MN 1 | 28 | 9 | 9 | 18 | 10 |
| ප්‍රාථමික කාර්ය මණ්ඩලය | U-PL 3 | 7 | 11 | 0 | 11 | -4 |
| | U-PL 2 | 1 | 7 | 0 | 7 | -6 |
| | U-PL 1 | 16 | 1 | 0 | 1 | 15 |
| එකතුව | | **127** | **56** | **41** | **97** | **30** |

**ශ්‍රී.ලං.නැ.වි.වි. (ප්‍රධාන විශ්වවිද්‍යාලය) හා ත්‍රිකුණාමල මණ්ඩපයේ මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සමානුපාතික ව්‍යාප්තිය. (රූප සටහන් 4)**




වගුව *4:* අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2016

## 4.3 පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලය

**ශ්‍රී.ලං.නැ.වි.වි. (මඩකලපුව)**

| ප්‍රභේදය/ ආවරණය කරන ලද විෂයයන් | කාර්ය මණ්ඩලය | වැටුප් පරිමාණය | අනුමත කාර්ය මණ්ඩලය | පුරවන ලද කාර්ය මණ්ඩලය | | | කාර්ය මණ්ඩල පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| | | | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| **කෘෂිකර්ම පීඨය** | | | | | | | |
| කෘෂි ජීව විද්‍යාව, කෘෂි රසායන විද්‍යාව, කෘෂි ආර්ථික විද්‍යාව, කෘෂි ඉංජිනේරු විද්‍යාව, සත්ත්ව විද්‍යාව, භෝග විද්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | 5 | - | - | - | 5 |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | 34 | - | - | - | - |
| | මහාචාර්ය | U-AC 5 (II) | | - | 2 | 2 | 2 |
| | ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | | - | - | - | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | U-AC 3 (I) | | 7 | 3 | 10 | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | U-AC 3 (II) | | 6 | 7 | 13 | |
| | කථිකාචාර්ය | U-AC 3 (III) | | - | - | 0 | |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | 1 | 6 | 7 | |
| | තාවකාලික සහය කථිකාචාර්ය | U-AC 2 | 5 | 0 | 4 | 4 | 1 |
| | තාවකාලික පර්යේෂණ සහකාර | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික ප්‍රදර්ශක | U-AC 1 | 6 | 3 | 5 | 8 | -2 |
| | තාවකාලික උපදේශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික නිබන්ධක | U-AC 1 | - | - | - | - | - |
| | එකතුව | | **50** | **17** | **27** | **44** | **6** |

| කලා හා සංස්කෘත පීඨය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අරාබි, සංසන්දනාත්මක ආගම්, අධ්‍යාපනය, ලලිත කලා, භූගෝල විද්‍යාව, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ඉස්ලාම් අධ්‍යයනය, භාෂා, සමාජ විද්‍යා <u>ප්‍රභේද:</u> ක්‍රිස්තියානි, ආර්ථික විද්‍යා | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | 3 | - | - | - | 3 |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | 64 | - | - | - | 8 |
| | මහාචාර්ය | U-AC 5 (II) | | 1 | 1 | 2 | |
| | ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | | - | - | - | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | U-AC 3 (I) | | 8 | 3 | 11 | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | U-AC 3 (II) | | 22 | 3 | 25 | |
| | කථිකාචාර්ය | U-AC 3 (III) | | 1 | - | 1 | |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | 10 | 7 | 17 | |
| | තාවකාලික සහය කථිකාචාර්ය | U-AC 2 | 2 | 3 | 12 | 15 | -13 |
| | තාවකාලික පර්යේෂණ සහකාර | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික ප්‍රදර්ශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික උපදේශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික නිබන්ධක | U-AC 1 | 7 | - | - | 0 | 7 |
| | එකතුව | | **76** | **45** | **26** | **71** | **5** |

| වාණිජ හා කළමනාකරණ පීඨය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | 2 | - | - | - | 2 |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | | - | - | - | |
| | මහාචාර්ය | U-AC 5 (II) | | - | - | - | |
| | ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | 26 | - | - | - | 3 |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | U-AC 3 (I) | | 7 | 2 | 9 | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | U-AC 3 (II) | | 5 | 5 | 10 | |
| | කථිකාචාර්ය | U-AC 3 (III) | | - | - | - | |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | 2 | 2 | 4 | |
| | තාවකාලික සහය කථිකාචාර්ය | U-AC 2 | 7 | 3 | 6 | 9 | -2 |
| | තාවකාලික පර්යේෂණ සහකාර | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික ප්‍රදර්ශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික උපදේශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික නිබන්ධක | U-AC 1 | 5 | 0 | 5 | 5 | 0 |
| | එකතුව | | **40** | **17** | **20** | **37** | **3** |

| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සායනික විද්‍යාව, මානව ජීව විද්‍යාව, වෛද්‍ය අධ්‍යාපනය හා පර්යේෂණ, භෞතවෛද්‍යාධිවේදී , ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණය, අතිරේක සෞඛ්‍ය විද්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | 3 | - | - | - | 3 |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | | - | - | - | - |
| | මහාචාර්ය | U-AC 5 (II) | | - | - | - | |
| | ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | | - | - | - | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | U-AC 3 (I) | 56 | 1 | 1 | 2 | 25 |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | U-AC 3 (II) | | 3 | 3 | 6 | |
| | කථිකාචාර්ය | U-AC 3 (III) | | - | - | - | |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | 15 | 8 | 23 | |
| | තාවකාලික සහය කථිකාචාර්ය | U-AC 2 | 0 | 2 | 2 | 4 | -4 |
| | තාවකාලික පර්යේෂණ සහකාර | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික ප්‍රදර්ශක | U-AC 1 | 2 | 1 | 5 | 6 | -4 |
| | තාවකාලික උපදේශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික නිබන්ධක | U-AC 1 | - | - | - | - | - |
| | එකතුව | | **61** | **22** | **19** | **41** | **20** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| විද්‍යා පීඨය | | | | | | | |
| උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | 5 | 1 | - | 1 | 4 |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | 36 | - | - | - | 5 |
| | මහාචාර්ය | U-AC 5 (II) | | 3 | - | 3 | |
| | ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | | - | - | - | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | U-AC 3 (I) | | 6 | 3 | 9 | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | U-AC 3 (II) | | 7 | 5 | 12 | |
| | කථිකාචාර්ය | U-AC 3 (III) | | 2 | - | 2 | |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | 4 | 1 | 5 | |
| | තාවකාලික සහය කථිකාචාර්ය | U-AC 2 | 8 | 4 | 4 | 8 | 0 |
| | තාවකාලික පර්යේෂණ සහකාර | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික ප්‍රදර්ශක | U-AC 1 | 18 | 2 | 16 | 18 | 0 |
| | තාවකාලික උපදේශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික නිබන්ධක | U-AC 1 | 0 | 1 | 1 | 2 | -2 |
| | එකතුව | | **67** | **30** | **30** | **60** | **7** |

**ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය)**

| ප්‍රභේදය/ ආවරණය කරන ලද විෂයයන් | කාර්ය මණ්ඩලය | වැටුප් පරිමාණය | අනුමත කාර්ය මණ්ඩලය | පුරවන ලද කාර්ය මණ්ඩලය | | | කාර්ය මණ්ඩල පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| | | | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | | | | | | | |
| පරිගණක විද්‍යාවේදී, භෞතික විද්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | - | - | - | - | - |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | 11 | - | - | - | 0 |
| | මහාචාර්ය | U-AC 5 (II) | | - | - | - | |
| | ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | | - | - | - | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | U-AC 3 (I) | | - | - | 0 | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | U-AC 3 (II) | | 3 | 0 | 3 | |
| | කථිකාචාර්ය | U-AC 3 (III) | | 1 | 0 | 1 | |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | 2 | 5 | 7 | |
| | තාවකාලික සහය කථිකාචාර්ය | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික පර්යේෂණ සහකාර | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික ප්‍රදර්ශක | U-AC 1 | 1 | 0 | 1 | 1 | 0 |
| | තාවකාලික උපදේශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික නිබන්ධක | U-AC 1 | - | - | - | - | - |
| | එකතුව | | **12** | **6** | **6** | **12** | **0** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සන්නිවේදන හා ව්‍යාපාරික අධ්‍යයන පීඨය | | | | | | | |
| ව්‍යාපාර හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන, භාෂා හා සන්නිවේදන අධ්‍යයනය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | - | - | - | - | - |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | | - | - | - | |
| | මහාචාර්ය | U-AC 5 (II) | | - | - | - | |
| | ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | | - | - | - | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | U-AC 3 (I) | 23 | 2 | 1 | 3 | 4 |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | U-AC 3 (II) | | 1 | 4 | 5 | |
| | කථිකාචාර්ය | U-AC 3 (III) | | 0 | 1 | 1 | |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | 2 | 8 | 10 | |
| | තාවකාලික සහය කථිකාචාර්ය | U-AC 2 | 0 | 0 | 5 | 5 | -5 |
| | තාවකාලික පර්යේෂණ සහකාර | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික ප්‍රදර්ශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික උපදේශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික නිබන්ධක | U-AC 1 | - | - | - | - | - |
| | එකතුව | | **23** | **5** | **19** | **24** | **-1** |
| දේශීය වෛද්‍ය ඒකකය | | | | | | | |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | - | - | - | - | - |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | | - | - | - | |
| | මහාචාර්ය | U-AC 5 (II) | | - | - | - | |
| | ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | 7 | - | - | - | 5 |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | U-AC 3 (I) | | - | - | 0 | |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | U-AC 3 (II) | | 1 | 1 | 2 | |
| | කථිකාචාර්ය | U-AC 3 (III) | | - | - | 0 | |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | - | - | 0 | |
| | තාවකාලික සහය කථිකාචාර්ය | U-AC 2 | 4 | 3 | 4 | 7 | -3 |
| | තාවකාලික පර්යේෂණ සහකාර | U-AC 2 | - | - | - | - | - |
| | තාවකාලික ප්‍රදර්ශක | U-AC 1 | - | - | - | - | - |
| | තාවකාලික උපදේශක | U-AC 1 | 1 | - | - | 0 | 1 |
| | තාවකාලික නිබන්ධක | U-AC 1 | - | - | - | - | - |
| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය (පුවත්පත් දැන්වීමකට අනුව බඳවාගත්) | U-AC 5 (I) / U-AC 5 (II) | - | - | - | - | - |
| | එකතුව | | **12** | **4** | **5** | **9** | **3** |

## 4.4 අධ්‍යයනාංශ/ඒකකයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර :

| ශ්‍රී.ලං.නැ.වි.වි. (මඩකලපුව) | | | | |
|---|---|---|---|---|
| පීඨ/අධ්‍යනාංශ/අංශ/ශාඛා/ඒකක | වඩා ජොෂ්ඨ 1 | ජොෂ්ඨ කාර්ය මණ්ඩලය 2 | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය 3 | සුළු සේවකයන් 4 |
| උපකුලපති කාර්යාලය, උපකුලපති බංගලාව | - | 1 | 1 | 1 |
| නියෝජ්‍ය උපකුලපති කාර්යාලය | - | 1 | - | - |
| ලේඛකාධිකාරි කාර්යාලය | - | 3 | 2 | 1 |
| සනාථන මන්දිරය | - | - | 1 | 1 |
| පාලන අංශය | 2 | 1 | 3 | 5 |
| මූලධන වැඩ අංශය | - | - | 2 | - |
| උපාය මාර්ගික සැලසුම් හා සංඛ්‍යාන ඒකකය | - | - | - | 1 |
| අධ්‍යයන/ආයතනික ශාඛාව | 1 | 1 | 5 | 1 |
| අනධ්‍යයන/ ආයතනික ශාඛාව | 1 | - | 2 | 1 |
| අභ්‍යන්තර විගණන ඒකකය | 1 | 1 | 2 | 1 |
| මූල්‍යාධිකාරි කාර්යාලය | 3 | 2 | 9 | 2 |
| ගබඩා හා සැපයුම් අංශය | 1 | 1 | 7 | 1 |
| ආරක්ෂක සේවා | - | - | 3 | 23 |
| ප්‍රවාහන සේවා | - | - | - | 14 |
| කෘෂිකර්ම පීඨය | 3 | 4 | 6 | 21 |
| වාණිජ හා කළමනාකරණ පීඨය | 1 | 1 | 4 | 4 |
| විද්‍යා පීඨය | 1 | 6 | 6 | 19 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය | 1 | 3 | 16 | 17 |
| කලා හා සංස්කෘත පීඨය | 2 | 1 | 9 | 7 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය | - | 5 | 1 | 1 |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය | - | 3 | 1 | 1 |
| බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානය | 1 | - | 2 | 2 |
| අධ්‍යයන කටයුතු | 1 | 2 | 7 | 3 |
| පුස්තකාලය | 1 | 2 | 5 | 5 |
| සෞඛ්‍ය සේවා | 1 | - | - | 5 |
| ශාරීරික අධ්‍යාපනය | - | 2 | - | 3 |
| ශිෂ්‍ය කටයුතු | 1 | - | 3 | 1 |
| රැකියා මාර්ගෝපදේශන ඒකකය | - | 1 | 1 | - |
| නඩත්තු දෙපාර්තමේන්තුව | 1 | - | 3 | 29 |
| නේවාසිකාගාර | - | - | 4 | 10 |
| එකතුව | **23** | **41** | **105** | **180** |

| ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | | | |
|---|---|---|---|---|
| පීඨ/අධ්‍යනාංශ/අංශ/ශාඛා/ඒකක | වඩා ජොෂ්ඨ 1 | ජොෂ්ඨ කාර්යය මණ්ඩලය 2 | කනිෂ්ඨ කාර්යය මණ්ඩලය 3 | සුළු සේවකයන් 4 |
| මණ්ඩාධිපති කාර්යාලය | - | - | 1 | - |
| සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය | - | - | 3 | 1 |
| ව්‍යවහාරික විද්‍යාපීඨය | - | - | 2 | 1 |
| දේශීය වෛද්‍ය ඒකකය | - | - | 2 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| මුදල් පරිපාලන | 1 | 2 | 3 | 1 |
| ගබඩා හා සැපයුම් සේවා | 1 | - | 2 | - |
| අධ්‍යයන කටයුතු | 1 | - | 2 | 1 |
| මුලධන වැඩ | 1 | - | 1 | - |
| ආයතන අංශය | 1 | - | 1 | - |
| පාලන අංශය | - | - | 2 | 9 |
| පුස්තකාලය | - | - | 3 | 2 |
| ශිෂ්‍ය කටයුතු | 1 | 3 | 3 | - |
| නඩත්තු | 1 | - | 1 | 3 |
| **එකතුව** | **7** | **5** | **26** | **19** |

1 - පරිපාලන මට්ටමේ හා විධායක මට්ටමේ කාර්ය මණ්ඩලය

2 - අධ්‍යයන සහායක හා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික මට්ටමේ කාර්ය මණ්ඩලය


3 - ලිපිකාර හා අනුබද්ධ ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය

4 - පුහුණු හා අර්ධ කාර්ය මණ්ඩලය

## 4.5 සම්පත් හා සේවාවන් පිළිබඳ කාර්යය සාධන දර්ශක


**2016 - උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිලාභින්ගේ නියැදියක් සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරිම මඟින් සිසුන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණයක් සිදුකරන ලද අතර "සිසුන්ගේ සන්තෘප්තිය" සම්බන්ධයෙන් සම්පාදනය කරන ලද තොරතුරු පහත දැක්වේ.**

- **පීඨය/අධ්‍යයනාංශය**





වගුව 5: පීඨයේ/අධ්‍යයනාංශ ඉගැන්වීම්/ඉගෙනුම් සම්පත් පිළිබඳ සිසුන්ගේ තෘප්තිය

- **පුස්තකාලය**





වගුව 6: පුස්තකාල සම්පත් හා සේවා සම්බන්ධයෙන් සිසුන්ගේ තෘප්තිය

- **නේවාසිකාගාර පහසුකම්**





වගුව *7:* නේවාසිකාගාර පහසුකම් හා සේවා සම්බන්ධයෙන් සිසුන්ගේ තෘප්තිය

- **ආහාර සේවා හා සැපයුම් හා භෝජනාගාර**





වගුව *8:* භෝජනාගාර සේවා සම්බන්ධයෙන් සිසුන්ගේ තෘප්තිය

- **සෞඛ්‍ය සේවා**




වගුව *9:* විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය මඟින් සපයන ලද සේවාවන් පිළිබඳ ශිෂ්‍ය තෘප්තිය


- සමස්ථ තෘප්තිය




වගුව *10:* සමස්ථ විශ්වවිද්‍යාල පරිසරය සම්බන්ධයෙන් සිසුන්ගේ තෘප්තිය

## උපාධිධාරි සේවා නියුක්තිය


2016 උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිලාභීන් අතර සිදුකරන ලද සමීක්ෂණයකින් ශ්‍රී.ලං.නැ.වි.විද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය සම්බන්ධයෙන් මිනුමක් ලබා ගන්නා ලදී. ඒ අනුව, උපාධිය වලංගු වන දිනයේ සිට වසරක් ඇතුළත සේවා නියුක්ත හා සේවා වියුක්ත ප්‍රතිශතය පහත රූපසටහන් 11 මඟින් දැක්වේ.




වගුව *11:* වසරක් තුල උපාධිධාරින්ගේ සේවා නියුක්තිය

රූපසටහන් 12 මඟින් පෙන්නුම් කරනු ලබන ප්‍රස්තාරය මඟින් උපාධිය වලංගු වන දිනයේ සිට වසරක් ඇතුළත සේවා නියුක්ත උපාධිධාරීන්ගේ ප්‍රතිශතය පෙන්නුම් කරනු ලබයි.

වගුව *12:* පීඨයන්හි වසරක් තුල සේවා නියුක්ත උපාධිධාරින්ගේ ප්‍රතිශතය




## 5. මුල්‍ය තත්ත්වය

### 5.1 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය විසින් නිදහස් කරන ලද අරමුදල් වලට අදාළ තත්ත්ව වාර්තාව

රු. '000

| විස්තර | වෙන්කරන ලද මුදල | නිර්දේශ කරන ලද මුදල | නිදහස් කරන ලද මුදල |
|---|---|---|---|
| පුද්ගලික පඩිනඩි | 713,350 | 695,000 | 695,000 |
| වෙනත් පුනරාවර්තන | 280,650 | 271,000 | 271,000 |
| **මුළු පුනරාවර්තන ප්‍රතිපාදන** | **994,000** | **966,000** | **966,000** |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරිම් | 82,000 | 82,000 | 82,000 |
| වත්කම් අත්පත් කර ගැනීම් | 88,000 | 88,000 | 88,000 |
| කෙරීගෙන යන ඉදිකිරිම් ව්‍යාපෘති | 269,000 | 269,000 | 269,000 |
| නව ඉදිකිරිම් ව්‍යාපෘති | 100,000 | - | - |
| දැනුම වැඩිදියුණු කිරිම් හා ආයතන සංවර්ධන හා පර්යේෂණ | 89,000 | 89,000 | 89,000 |
| **මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන** | **628,000** | **528,000** | **528,000** |
| **මුළු ප්‍රතිපාදන** | **1,622,000** | **1,494,000** | **1,494,000** |

## 5.2 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

| ශ්‍රී.ලං.නෑ.වි.වි. (මඩකලපුව) | | |
|---|---|---|
| විෂය | 2015 රු. | 2016 රු. |
| අ. පුද්ගලික පඩිනඩි | 610,167,848 | 678,188,713 |
| ආ. ගමන් වියදම් | 1,730,283 | 4,267,894 |
| ඇ. සැපයුම් | 26,561,658 | 35,799,395 |
| ඈ. නඩත්තු වියදම් | 17,324,837 | 19,355,508 |
| ඉ. ගිවිසුම්ගත සේවා | 112,310,739 | 127,886,123 |
| ඊ. වෙනත් | 39,522,177 | 48,764,103 |
| උ. ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 135,505,587 | 168,332,773 |
| එකතුව | **943,123,129** | **1,082,594,509** |

| ශ්‍රී.ලං.නෑ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | |
|---|---|---|
| විෂය | 2015 රු. | 2016 රු. |
| අ. පුද්ගලික පඩිනඩි | 94,810,319.91 | 113,330,198.42 |
| ආ. ගමන් වියදම් | 119,538.75 | 562,870.00 |
| ඇ. සැපයුම් | 6,371,256.83 | 8,833,988.42 |
| ඈ. නඩත්තු වියදම් | 1,893,251.28 | 3,243,228.10 |
| ඉ. ගිවිසුම්ගත සේවා | 55,304,520.96 | 55,991,496.36 |
| ඊ. වෙනත් | 4,246,028.75 | 9,797,343.17 |
| එකතුව | **162,744,916.48** | **191,759,124.47** |

## 5.3 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| ශ්‍රී.ලං.නෑ.වි.වි. (මඩකලපුව) | | |
|---|---|---|
| විෂය | 2015 රු. | 2016 රු. |
| අ. පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් | 69,754,433 | 73,353,692 |
| ආ. වත්කම් අත්පත් කර ගැනීම් | 111,936,705 | 63,037,091 |
| ඇ. ඉදිකිරීම් ව්‍යාපෘති | 174,875,758 | 240,468,916 |
| ඈ. නව ඉදිකිරීම් ව්‍යාපෘති | 74,794,900 | - |
| ඉ. දැනුම වැඩිදියුණු කිරීම් හා ආයතන සංවර්ධන | 40,060,000 | 24,062,499 |
| ඊ. පර්යේෂණ හා සංවර්ධන | 14,574,554 | 989,940 |
| එකතුව | **485,996,350** | **401,912,138** |

| ශ්‍රී.ලං.නෑ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | |
|---|---|---|
| විෂය | 2015 රු. | 2016 රු. |
| අ. ස්ථාවර වත්කම නඩත්තු කිරීම හා පුනරුත්ථාපනය | 24,165,120.22 | 17,549,973.37 |
| ආ. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | 23,365,999.50 | 4,200,402.31 |
| ඇ. මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘති | 84,380.00 | 2,217,577.50 |
| එකතුව | **47,615,499.72** | **23,967,953.18** |

## ව්‍යාපෘති පිළිබඳ විස්තර ( විදේශීය අරමුදල් සම්පාදිත/දේශීය)

| ශ්‍රී.ලං.නැ.වි.වි. (මඩකලපුව) | | | | | |
|---|---|---|---|---|---|
| නම සහ විස්තරය | ණය/ ප්‍රතිපාදන | අරමුදල් සම්පාදිත ආයතන | මු.පි.ඇ. (රු. මිලියන) | ආ.ගෙ.වි. (රු. මිලියන) | දේ.ආ. (රු.මිලියන) |
| අ. විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා අධ්‍යනාංශය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 199.0 | - | - |
| ආ. කලා හා සංස්කෘත පීඨය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 121.0 | - | - |
| ඇ. පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 171.0 | - | - |
| ඇ. වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 230.0 | - | - |
| ඉ. මඩකලපුවේ පිලෛයාරඩිහි පිහිටි ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨයේ පිරිමි සිසුන් 250 ක් සඳහා ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඇතුළුව මායිම් තාප්පයක් හා පිවිසුම් දොරටුව ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 360.0 | - | - |
| ඊ. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨයේ ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 299.0 | - | - |
| උ. කලා හා සංස්කෘත පීඨය සඳහා දේශන ශාලාවක් සහිත ශ්‍රවණාගාරයක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 44.6 | - | - |
| ඌ. ශ්‍රී.ලං.නැ.වි.විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් නිර්මාණය කිරීම හා ඉදිකිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 263.2 | - | - |
| එ. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ජීව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 200.0 | - | - |
| ඒ. ශ්‍රී.ලං.නැ.වි.විද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 200.0 | - | - |
| එකතුව | | | **2087.8** | **-** | **-** |

| ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | | | | |
|---|---|---|---|---|---|
| නම සහ විස්තරය | ණය/ ප්‍රතිපාදන | අරමුදල් සම්පාදිත ආයතන | මු.පි.ඇ. (රු. මිලියන) | ආ.ගෙ.වි. (රු. මිලියන) | දේ.ආ. (රු.) |
| අ. තෙමහල් ආපනශාලා ගොඩනැගිල්ල ඉදි කිරිම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 130.40 | - | 103.75 |
| ආ. මහල් පහකින් යුක්ත ව්‍යවහාරික විද්‍යා ගොඩනැගිල්ලක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 410.00 | - | 331.95 |
| ඇ. සිව් මහල් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරිම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 304.40 | - | 253.77 |
| ඈ. සිව් මහල් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 326.40 | - | 271.00 |
| ඉ. ත්‍රිකුණාමල මණ්ඩපයේ ක්‍රිඩාංගණයක් ඉදි කිරිම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 50.00 | - | 32.45 |
| ඊ. පවත්නා අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 19.53 | - | - |
| උ. කාර්ය මණ්ඩල නේවාසිකාගාර ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 24.94 | - | 20.80 |
| ඌ. කාමර 100කින් සමන්විත සිව් මහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරිම. (නේවාසිකාගාර අංක 3) | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 244.58 | - | 212.68 |
| එ. සන්නිවේදන හා ව්‍යාපර අධ්‍යයන පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 821.40 | - | - |
| ඒ. බහුකාර්යය ශ්‍රවණාගාරයක් ඉදි කිරිම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 784.80 | - | - |
| ඓ. කි.මී. 2.5ක ගල්තාර මතුපිටක් සහිත මාර්ග ජාලයක් ඉදිකිරිම. | ප්‍රතිපාදන | ශ්‍රී ලංකා රජය | 145.00 | - | - |
| එකතුව | | | **3261.45** | **-** | **1,226.40** |

# (ශ්‍රී ලංකා රජය/ ආසියානු සංවර්ධන බැංකුව/අන්තර්ජාතික සංවර්ධන අරමුදල/ලෝක බැංකුව/...............)

මු.පි.ඇ. - මුලික පිරිවැය ඇස්තමේන්තුව ආ.ගෙ.වි. - ආපසු ගෙවනු ලබන විදේශ ආධාර

දේ.ආ. - දේශීය ආධාර

**ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (විදේශීය අරමුදල් සම්පාදිත /දේශීය):**

| ශ්‍රී.ලං.නැ.වි.වි. (මඩකලපුව) | | | | | |
|---|---|---|---|---|---|
| නම | මු.පි.ඇ. (රු. මිලියන) | වියදම් 2016 (රු.) | වියදම් 2016 (රු.) | 2016.12.31 දිනට සමුච්චිත වියදම් (රු.) | භෞතික ප්‍රගතිය % |
| අ. විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා අධ්‍යනාංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 199.0 | 172.14 | - | 172.14 | 99% |
| ආ. කලා හා සංස්කෘත පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 121.00 | 100.73 | - | 100.73 | 99% |
| ඇ. පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 171.00 | 140.12 | - | 140.12 | 99% |
| ඈ. වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 230.00 | 195.11 | - | 195.11 | 99% |
| ඉ. මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨයේ ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 299.00 | 58.35 | 71.29 | 129.63 | 99% |
| ඊ. මඩකලපුවේ පිලෛයාරඩිහි පිහිටි ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨයේ පිරිමි සිසුන් 250 ක් සඳහා ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඇතුළුව මායිම් තාප්පයක් හා පිවිසුම් දොරටුව ඉදි කිරීම. | 360.00 | 85.49 | 127.68 | 213.17 | 99% |
| උ. කලා හා සංස්කෘත පීඨය සඳහා දේශන ශාලාවක් ශ්‍රවණාගාරයක් සහිත ඉදි කිරීම. | 44.60 | 24.85 | - | 24.85 | 99% |
| එකතුව | **1,424.6** | **776.79** | **198.97** | **975.75** | - |

| ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | | | | |
|---|---|---|---|---|---|
| නම | මු.පි.ඇ. (රු. මිලියන) | වියදම් 2016 (රු.) | වියදම් 2016 (රු.) | 2016.12.31 දිනට සමුච්චිත වියදම් (රු.) | භෞතික ප්‍රගතිය % |
| අ. 103- පිරිමි හා ගැහැණු සිසුන් සඳහා නේවාසිකාගාර යක් ඉදි කිරිම. | 200.00 | 17.32 | 13.73 | 174.58 | 100% |
| ආ. 103- රසායනාගාරය ක් ඉදි කිරීම. | 14.00 | - | 0.44 | 12.12 | 100% |
| ඇ. 103- විවේකාගාර මධ්‍යස්ථානයක් ඉදි කිරීම. | 45.50 | 6.92 | 5.15 | 36.55 | 100% |
| ඈ. 103- ක්‍රීඩාංගනයක් ඉදි කිරීම. | 50.00 | 5.98 | 1.00 | 30.50 | 85% |
| ඉ. 103-තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ඉදි කිරීම. | 304.40 | 140.67 | 134.95 | 275.63 | 100% |
| ඊ. 103-ව්‍යවාහාරික විද්‍යාපීඨය සඳහා ගොඩනැගිලි සංකිර්ණයක් ඉදි කිරීම. | 410.00 | 35.09 | 103.98 | 139.08 | 35% |
| උ. 103-පුස්තකාල ගොඩනැගිල්ල ක් ඉදි කිරීම. | 326.20 | 74.89 | 209.01 | 283.90 | 90% |
| ඌ.103-ආපන ශාලා ගොඩනැගිල්ල ක් ඉදි කිරීම. | 130.40 | 11.10 | 96.17 | 107.27 | 100% |
| එකතුව | **1,480.50** | **291.97** | **564.43** | **1,059.63** | **-** |

## 5.6 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්):

| ශ්‍රී.ලං.නැ.වි.වි. (මඩකලපුව) | | | | |
|---|---|---|---|---|
| විෂය | වෙන්කිරිම් 2016 (රු.) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපරේතමේන්තුවෙන් ලද අරමුදල් | වියදම් 2016 (රු.) | ඉතුරුම්/අමතර (රු.) |
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන (ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් හැර) | 994.00 | 966.00 | 914.26 | 51.73 |
| ආ. මූලධන හැර ව්‍යාපෘති | 628.00 | 528.00 | 401.91 | 126.09 |
| ඇ. ව්‍යාපෘති - දේශීය අරමුදල් සම්පාදිත | - | - | - | - |
| ඈ. ව්‍යාපෘති - විදේශීය අරමුදල් සම්පාදිත | - | - | - | - |
| එකතුව | **1,622.00** | **1,494.00** | **1,316.17** | **177.82** |

| ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | | |
|---|---|---|---|
| විෂය | වෙන්කිරිම් 2016 (රු.) | වියදම් 2016 (රු.) | ඉතුරුම්/අමතර (රු.) |
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන | 205.50 | 191.75 | 13.74 |
| ආ. මූලධන හැර ව්‍යාපෘති | 96.00 | 23.97 | 72.03 |
| ඇ. ව්‍යාපෘති - දේශීය අරමුදල් සම්පාදිත | 394.00 | 564.44 | (170.44) |
| ඈ. ව්‍යාපෘති - විදේශීය අරමුදල් සම්පාදිත | - | - | - |
| එකතුව | **695.50** | **780.17** | **(84.67)** |

## 5.7 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම):

අභ්‍යන්තර ආදායම් පමණි

| ශ්‍රී.ලං.නැ.වි.වි. (මඩකලපුව) | | | |
|---|---|---|---|
| ආදායම් මූලාශ්‍රය | වෙන්කිරිම් 2016 (රු.) | රුස්කිරීම් 2016 (රු.) | ඌනතාවය/ අතිරික්තය (රු.) |
| අ. අභ්‍යන්තර උපාධි හා සහ පශ්චාත් උපාධි අධ්‍යයන | 6,300,000 | 14,100,636 | 7,800,636 |
| ආ. අනෙකුත් ආදායම් | 3,300,000 | 2,129,565 | (1,170,435) |
| එකතුව | **9,600,000** | **16,230,201** | **6,630,201** |

| ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | | |
|---|---|---|---|
| **ආදායම් මූලාශ්‍රය** | **වෙන්කිරීම් 2016 (රු.)** | **රුස්කිරීම් 2016 (රු.)** | **ඌනතාවය/ අතිරික්තය (රු.)** |
| අ. අභ්‍යන්තර උපාධි අපේක්ෂක අධ්‍යයන | 2,500,000.00 | 2,685,385.87 | 185,385.87 |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යයන | - | - | - |
| ඇ. උපදේශන | - | - | - |
| ඈ. වෙනත් | - | 1,404.324.51 | 1,404,324.51 |
| එකතුව | **2,500,000.00** | **4,089,710.38** | **1,589,710.38** |

## 5.8 මූල්‍ය ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය - 2016:

| ශ්‍රී.ලං.නැ.වි.වි. | | |
|---|---|---|
| **විෂය** | **සූත්‍රය** | **ඒක ශිෂ්‍ය පිරිවැය (රු.)** |
| ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම/ ශිෂ්‍ය සංඛ්‍යාව | 265,465.00 |
| ඒක ශිෂ්‍ය ප්‍රග්ධන වියදම | ප්‍රාග්ධන වියදම/ ශිෂ්‍ය සංඛ්‍යාව | 116,699.00 |
| එකතුව | | **382,164.00** |

| ත්‍රිකුණාමල මණ්ඩපය | | |
|---|---|---|
| **විෂය** | **සූත්‍රය** | **ඒක ශිෂ්‍ය පිරිවැය (රු.)** |
| ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම/ ශිෂ්‍ය සංඛ්‍යාව | 263,044.07 |
| ඒක ශිෂ්‍ය ප්‍රග්ධන වියදම | ප්‍රාග්ධන වියදම/ ශිෂ්‍ය සංඛ්‍යාව | 807,145.72 |
| එකතුව | | **1,070,189.79** |

## 5.9 2016 වර්ෂය තුල ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර :

| ශ්‍රී.ලං.නැ.වි.වි. | | |
|---|---|---|
| **යටිතල පහසුකම් පිළිබඳ විස්තර** | **වියදම (රුපියල් මිලියන)** | **භෞතික ප්‍රගතිය** |
| අ. වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 199.0 | 99% ක වැඩ අවසන් |
| ඈ. කලා හා සංස්කෘත පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 121.0 | 99% ක වැඩ අවසන් |
| ඇ. ප්‍රධාන පුස්තකාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 171.0 | 99% ක වැඩ අවසන් |
| ඈ. විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා අධ්‍යනාංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 230.0 | 99% ක වැඩ අවසන් |
| ඉ. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 360.0 | 99% ක වැඩ අවසන් |

| | | |
|---|---|---|
| ඊ. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම. | 299.0 | **99%** ක වැඩ අවසන් |
| උ. කලා හා සංස්කෘත පීඨය සඳහා දේශන ශාලාවක් ඇතුලත් ශ්‍රවණාගාරයක් ඉදි කිරීම. | 44.6 | **99%** ක වැඩ අවසන් |
| ඌ. ජීව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරිම | 238.0 | උපදේශකයකු තෝරාගැනීමේ ක්‍රියාවලියේ පවතී. |
| එ. ශ්‍රී.ලං.නැ.වි.විද්‍යාලයේ ඉංග්‍රිසි භාෂා ඉගැන්වීම් ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරිම | 237.0 | උපදේශකයකු තෝරාගැනීමේ ක්‍රියාවලියේ පවතී. |
| ඒ. කෘෂිකර්ම පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරිම. | 263.2 | **5%** ක වැඩ අවසන් |
| එකතුව | **2162.8** | |

| ත්‍රිකුණාමල මණ්ඩපය | | |
|---|---|---|
| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම (රුපියල් මිලියන) | භෞතික ප්‍රගතිය |
| අ. ප්‍රතික ටැංකි **02**ක් හා උරන වළ සමඟ අපද්‍රව්‍ය බැහැර කිරිමේ පද්ධතියක් ඉදිකිරිම. | - | **95%** ක වැඩ අවසන් |
| ආ. නේවාසික පරිශ්‍රයේ සයිකල් නැවතුම් අංගනයක් ස්ථාපිත කිරීම. | - | **100%** ක වැඩ අවසන් |
| ඇ. වානේ ගේට්ටුවක් සමඟ ප්‍රාකාර බිත්තිය දිගු කිරීම. | 436,447.24 | **100%** ක වැඩ අවසන් |
| ඈ. ආරක්ෂක කුටි **04**ක් ස්ථාපිත කිරීම. | - | **90%** ක වැඩ අවසන් |
| ඉ. අංක.**315,** ඩොක්යාඩ් පාරේ පිහිටි නේවාසිකාගාර පරිශ්‍රය අළුත් වැඩියා කිරීම. | - | **100%** ක වැඩ අවසන් |
| ඊ. තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ල සඳහා | - | - |
| උ. පිටත තාප්පය දිර්ඝ කිරිම. | - | 25.01.2017 දින ලංසු විවෘත කරන ලදී. |
| ඌ. දේශිය වෛද්‍ය ඒකකයේ පවතින රසායනාගාර ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම. | - | |
| එ. ව්‍යවහාරික විද්‍යා පීඨයේ රසායනාගාරයේ ඉතිරි වැඩ කොටස් නිම කිරීම. | - | 25.01.2017 දින ලංසු විවෘත කරන ලදී. |
| ඒ. නව නේවාසිකාගාර ගොඩනැගිල්ල අවට උද්‍යාන අලංකරණ හා අපද්‍රව්‍ය බැහැර කිරිමේ කාණු පද්ධතිය වැඩි දියුණු කිරීම. | - | |
| ඓ. පවත්නා අභ්‍යන්තර මාර්ග ජලාශ වැඩිදියුණු කිරිම. | - | අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත. |
| ඔ. කාර්ය මණ්ඩල නේවාසිකාගාර ඉදිකිරිම. | - | වි.වි.ප්‍ර.කො.ස. විසින් අනුමත කර ඇත. |
| ඕ. කාමර **100**කින් සමන්විත තට්ටු හතරේ පිරිමි නේවාසිකාගාරයක් ඉදි කිරීම (නේවාසිකාගාර අංක **3**) | - | අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත. |
| ඖ. සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරිම. | - | වි.වි.ප්‍ර.කො.ස. විසින් අනුමත කර ඇත. |
| අං. බහුකාර්ය ශ්‍රවණාගාරයක් ඉදිකිරිම. | - | වි.වි.ප්‍ර.කො.ස. විසින් අනුමත කර ඇත. |
| අඃ. **2.5** කි.මී. ක ගල්තාර මතුපිටක් සහිත මාර්ග පද්ධතියක් | - | වි.වි.ප්‍ර.කො.ස. විසින් අනුමත කර ඇත. |
| එකතුව | **436,447.24** | |

## 5.10 මූල්‍ය ප්‍රකාශන 2016

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය (ඒකාබද්ධ)
**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | **2016** රු. | **2015** රු. |
|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | | | |
| පුනරාවර්තන ප්‍රතිපාදන | 3 | 1,165,927,000 | 960,030,000 |
| අනෙකුත් ක්‍රියාකාරකම් වලින් | | | |
| ශුද්ධ ආදායම/පාඩුව | 4 | 3,338,351 | 6,930,728 |
| අනෙකුත් ආදායම් | 5 | 37,356,429 | 20,797,470 |
| මුළු මෙහෙයුම් ආදායම් | | **1,206,621,780** | **987,758,197** |
| සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය | 6 | 138,977,050 | 74,536,550 |
| | | **1,345,598,830** | **1,062,294,747** |
| මෙහෙයුම් වියදම් | | | |
| පෞද්ගලික පඩිනඩි | 7 | 790,536,202 | 704,978,168 |
| ගමන් වියදම් | 8 | 4,830,764 | 1,849,822 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | 9 | 44,555,267 | 32,980,000 |
| සුළු අළුත්වැඩියාකිරිම් හා නඩත්තු | 10 | 22,598,736 | 19,218,088 |
| ගිවිසුම්ගත සේවා | 11 | 183,877,619 | 167,615,260 |
| පර්යේෂණ හා සේවා | 12 | 834,059 | - |
| ක්ෂය හා ක්‍රම ක්ෂය වියදම් | 13 | 191,060,778 | 173,456,597 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 14 | 57,727,387 | 43,768,205 |
| මුළු මෙහෙයුම් වියදම් | | **1,296,020,812** | **1,143,866,140** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය / ඌනතාවය | | **(89,399,032)** | **(156,107,943)** |
| සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය | 15 | 138,977,050 | 74,536,550 |
| මුළු ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය / ඌනතාවය | | **(89,399,032)** | **(156,107,943)** |
| අතිවිශේෂ අයිතම | | | |
| ( ලියා හැරීම් හා අනෙකුත් ගැලපීම් ) | 16 | 17,860,815 | 1,394,928 |
| පොදු සංචිතයට මාරුකරන ලද කාලච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය / ඌනතාවය | | **(107,259,847)** | **(157,502,871)** |

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ඒකාබද්ධ)
**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. | රු. |
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 17 | 1,993,055,837 | 1,893,690,645 |
| අස්පෘශ්‍ය වත්කම් | 18 | 33,302,405 | 14,518,784 |
| ආයෝජන (දිගුකාලීන) | 19 | 5,811,315 | 5,131,713 |
| ප්‍රාග්ධන - කෙරිගෙන යන වැඩ | 20 | 1,735,203,458 | 935,822,690 |
| මුළු ජංගම නොවන වත්කම් | | 3,767,373,015 | 2,849,163,832 |
| වත්කම් නැතිවීම් | 21 | | 17,860,815 |
| ජංගම වත්කම් | | | |
| පරිලේඛන / තොග | 22 | 13,036,272 | 10,945,805 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 23 | 639,225,060 | 767,439,806 |
| ආයෝජන (කෙටි කාලීන) | 24 | 57,501,723 | 37,193,721 |
| මුදල් හා මුදල් සමාන දෑ | 25 | 464,954,696 | 224,792,660 |
| මුළු ජංගම වත්කම් | | 1,174,717,751 | 1,040,371,992 |
| මුළු වත්කම් | | 4,942,090,765 | 3,907,396,639 |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු දෑ | 26 | 308,008,093 | 265,389,531 |
| උපචිත වියදම් | 27 | 30,311,678 | 31,462,111 |
| කල්බදු බැදීම් (කෙටි කාලීන) | 28 | 1,743,031 | - |
| මුළු ජංගම වගකීම් | | 340,062,802 | 296,851,642 |
| ජංගම නොවන වගකිම් | | | |
| ගෙවිය යුතු දෑ | 29 | 8,143,021 | 6,951,817 |
| කල්බදු බැදීම් (දිගු කාලීන) | 30 | 7,472,755 | - |
| පාරිතෝෂික සඳහා වෙන්කිරිම් | 31 | 139,181,069 | 117,329,379 |
| සීමිත අරමුදල | 32 | 75,942,522 | 71,152,272 |
| පරිත්‍යාග හා ප්‍රදාන | 33 | 11,587,643 | 14,163,031 |
| අනෙකුත් ප්‍රදාන | 34 | 337,753,834 | 297,254,658 |
| මුළු ජංගම නොවන වගකිම් | | 580,080,843 | 506,851,157 |
| මුළු වගකිම් | | 920,143,645 | 803,702,799 |

| | | | |
|---|---|---|---|
| ශුද්ධ වත්කම් / හිමිකම් | | | |
| සමුච්චිත අරමුදල ( මූලධන ප්‍රතිපාදන ) | 35 | 5,100,197,385 | 4,073,942,018 |
| ඇප බැඳීම් සංචිතය | 36 | 170,584,861 | 170,584,861 |
| පොදු සංචිතය | 37 | (1,270,025,194) | (1,160,862,434) |
| ප්‍රාග්ධන සංචිතය | 38 | 21,190,067 | 20,029,395 |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | **4,021,947,120** | **3,103,693,840** |
| | | | |
| මුළු වගකීම් / හිමිකම් ( යෙදවූ මුළු අරමුදල් ) | | **4,942,090,765** | **3,907,396,639** |

**ඉහත ප්‍රකාශන, ශ්‍රී.ලං.නැ.වි. විද්‍යාලයේ 2016 වර්ෂයේ අවසන් ගිණුම්වල පිටු අංක 16 සිට 72 දක්වා වන පිටු අංකවල සංක්ෂිප්තය වේ.**

**මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර) හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (i) හා 107 (ii) වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) ඡේද වලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත.**

පාලක සභාව වෙනුවෙන් අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| මහාචාර්ය ටී. ජයසිංහම් | ඒ.එල්.ජේ. සදීක් | එම්.එම්.එම්. ෆරීස් |
| ගිණුම්කරණ නිළධාරි | සහකාර ගිණුම්කරණ නිළධාරි | මූල්‍යාධිකාරී |
| උපකුලපති | ලේඛකාධිකාරි | |

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ඒකාබද්ධ)
**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්තය / ඌනතාවය | (107,259,847) | (157,502,871) |
| මුදල් නොවන ප්‍රවාහයන් | | |
| ක්ෂය හා ක්‍රමක්ෂය | 197,933,135 | 192,143,495 |
| ක්‍රමක්ෂය | 21,851,691 | 6,397,720 |
| ගෙවියයුතු දෑ වල වැඩිවීම් | 51,875,118 | 36,900,090 |
| අනෙකුත් ජංගම වත්කම්වල වැඩිවීම් | 134,737,566 | (11,233,299) |
| පූර්ව කාලච්ඡේද අයිතම | 1,435,439 | (5,374,861) |
| නිශ්චිත අරමුදලට මාරු කිරීම් | (3,338,351) | (6,930,728) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **297,234,749** | **54,399,546** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| උපකරණ මිලදී ගැනිම් | (279,437,512) | (1,212,422,309) |
| අස්පෘශ්‍ය වත්කම් | (27,396,907) | (699,462) |
| කෙරිගෙන යන වැඩ | (799,380,768) | 462,092,490 |
| ආයෝජන | (20,987,603) | (30,830,661) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **(1,127,202,790)** | **(781,859,943)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | 1,026,255,367 | 740,000,000 |
| නිශ්චිත අරමුදල් | 4,790,250 | 7,804,603 |
| වෙනත් ප්‍රතිපාදන | 40,499,176 | 27,031,184 |
| ත්‍යාග හා ප්‍රදාන | (2,575,389) | 201,477 |
| ප්‍රාග්ධන සංචිතය | 1,160,672 | (28,772) |
| ඇප බැඳීම් සංචිතය | - | (270,934) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **1,070,130,077** | **774,737,557** |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ අඩුවිම | **240,162,036** | **47,277,161** |
| වර්ෂය මුල මුදල් හා මුදල් සමාන දෑ | 224,792,660 | 177,515,498 |
| වර්ෂය අවසානයට මුදල් හා මුදල් සමාන දෑ | **464,954,696** | **224,792,660** |

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

රු.

| | සමුච්චිත අරමුදල | ඇප බැදීම් සංචිතය | පොදු සංචිතය | වෙනත් සංචිත | එකතුව |
|---|---|---|---|---|---|
| 2014 දෙසැම්බර් මසට ශේෂය | 3,333,942,018 | 170,855,796 | (991,053,975) | 20,058,167 | **2,533,802,006** |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත/ ඌනතාවය | - | - | (157,502,871) | - | **(157,502,871)** |
| වෙනත් ගැලපීම් | - | - | (12,305,588) | - | **(12,305,588)** |
| සංචිතයේ වැඩිවීම් | - | (270,934) | | (28,772) | **(299,707)** |
| අතිරේක දායකත්වය | 740,000,000 | - | | - | **740,000,000** |
| **2015 දෙසැම්බර් මසට ශේෂය** | **4,073,942,018** | **170,584,861** | **(1,160,862,434)** | **20,029,395** | **3,103,693,840** |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත/ ඌනතාවය | - | - | (107,259,847) | - | **(107,259,847)** |
| වෙනත් ගැලපීම් | - | - | (1,902,912) | - | **(1,902,912)** |
| සංචිතයේ වැඩිවීම්/ අඩුවීම් | - | - | - | 1,160,672 | **1,160,672** |
| අතිරේක දායකත්වය | 1,026,255,367 | - | - | - | **1,026,255,367** |
| **2016 දෙසැම්බර් මසට ශේෂය** | **5,100,197,385** | **170,584,861** | **(1,270,025,194)** | **21,190,067** | **4,021,947,120** |

## 6.අත්පත්කර ගැනීම්

### 6.1 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

| 1. කෘෂිකර්ම පීඨය | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 55 | - | 36 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | |
| ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව | 01 | - | - |
| ඇ. පොත් සංඛ්‍යාව | - | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 27 | - | 05 |
| ඊ. වෙනත් (නිබන්ධන/ සමුළු) | - | - | - |
| එකතුව | **83** | **-** | **41** |

| **2.** කලා හා සංස්කෘත පීඨය | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 51 | - | 38 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව | 03 | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 10 | 01 | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 62 | 02 | - |
| ඊ. වෙනත් | 12 | - | 02 |
| එකතුව | **138** | **03** | **40** |

| **3.** වාණිජ හා කළමනාකරණ පීඨය | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 29 | 01 | 22 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | - | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | - | - | - |
| ඊ. වෙනත් | - | - | - |
| එකතුව | **29** | **01** | **22** |

| **4.** සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 24 | - | 09 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 01 | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 13 | - | - |
| ඊ. වෙනත් | 02 | - | - |
| එකතුව | **40** | **-** | **09** |

| **5.** විද්‍යා පීඨය | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 18 | - | 08 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව | 01 | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 01 | 01 | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 18 | - | 02 |
| ඊ. වෙනත් | - | - | - |
| එකතුව | **38** | **01** | **10** |

| **6.** සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය, ත්‍රිකුණාමල මණ්ඩපය | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 16 | - | 11 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | - | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | - | - | - |
| ඊ. වෙනත් | - | - | - |
| එකතුව | **16** | **-** | **11** |

| **7.** ව්‍යවහාරික විද්‍යා පීඨය, ත්‍රිකුණාමල මණ්ඩපය, ශ්‍රී.ලං.නැ.වි.වි. | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 42 | - | 17 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | - | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | - | - | - |
| ඊ. වෙනත් | - | - | - |
| එකතුව | **42** | **-** | **17** |

| **8.** දේශීය වෛද්‍ය ඒකකය, ත්‍රිකුණාමල මණ්ඩපය, ශ්‍රී.ලං.නැ.වි.වි. | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රකාශිත | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 17 | - | 07 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | - | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | - | - | - |
| ඊ. වෙනත් | - | - | - |
| එකතුව | **17** | **-** | **07** |

## 6.2 විද්‍යා වෙබ් අඩවියේ ලැයිස්තුගත සඟරාවන්හි 2016 දී පළකරන ලද පර්යේෂණ පත්‍ර

### කෘෂිකර්ම පීඨය

- **සේරන් ටී.එච්.** (2016). *Yield and yield components of Arachis hypogaea L. as influenced by NPK chemical fertilizers, farm yard manure and gypsum.* විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ පිළිබඳ බංගලදේශ සඟරාව 51(4): 285-290.

### සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය

- **දයාබරන් එම් සහ යසවර්ධන එස්.ජී.** (2016). *Neuronal control of localized inflammation through expressed nicotinic acetylcholine receptors: a study carried out in mice.* සිලෝන් මෙඩිකල් ජර්නල් , 60(4).

### විද්‍යා පීඨය

- **සිං එම්.එන්., කෝනේෂ්වරන් එම් සහ නාරායනාස්වාමි ආර්.** (2016). *A review on fluorescent inorganic nanoparticles for optical sensing applications*. RSC Adv., 2016,6, 21624-21661.

- **වෙයිස්වරියා එන්., සිතාම්බරසන් එම්., ශ්‍රීජිතා එස්.එස්., සීක් ඩබ්ලිව්.එන්. සහ ප්‍රතාපචන්ද්‍ර කුරුප්. එම්.ආර්.** (2016). *Polymeric polymorphs and a monomer of pseudohalide incorporated Cu(II) complexes of 2,4-dichlorido-6-((2-(dimethylamino)ethylimino)methyl)phenol]: Crystal structures and spectroscopic behavior*. ඉනෝර්ගනිකා චිමාකා ඇක්ටා.

- **කුන්නාත් ආර්.ජේ., සිතම්බරසන් එම්., අරවින්දක්ෂාන් ඒ.ඒ. සහ ප්‍රතාපචන්ද්‍ර කුරුප්.එම්.ආර්.** (2016). *The ligating versatility of pseudo halides like thiocyanate and cyanate in copper(II) complexes of 2-benzoylpyridine semi carbazone: Monomer, dimer and polymer*. පොලිහේඩ්‍රන් 113 · අප්‍රේල් 2016.

- **තිරුකනේෂ් එස් සහ රංගල් එෆ්.සී.** (2016). *Charged analogue of well-behaved neutral spheres: An algorithmic approach.* චයිනීස් ෆිසික්ස් C 40(4):045101 · අප්‍රේල් 2016.

- **හැරිස් ජේ.එම්., විනෝබාබා පී., කුලරත්න ආර්.කේ.ඒ. සහ කන්කන්නාම්ගේ සී.ඊ.** C. E. (2016). Spatial *and temporal distribution of cyanobacteria in Batticaloa Lagoon*. Environmental Sciences සඟරාව 47 · මාර්තු 2016.

- **රියාස් අහමඩ් ඒ.එම්. සහ මීනා ඩී.** (2016). *Relationships between Nesting Activities of Cichlids and Vegetation in Batticaloa lagoon, Sri Lanka.* Bull. Env. Pharmacol. Life Sci., Vol 5 [7] ජුනි 2016: 57-62.

- **රිචඩ් එච්., අභිලන් එස්., වෙන් ඉසඩ්. සහ බල්ජීන්ඩර් කේ.කේ.** (2016). *Flame Retardant Polyamide Fibres: The Challenge of Minimising Flame Retardant Additive Contents with Added Nanoclays.* Polymers 8(8):288 · අගෝස්තු 2016.

## 6.3 ලබා ගත් සම්මාන පිළිබඳ විස්තර:

| ශ්‍රී.ලං.නැ.වි.වි. (මඩකලපුව) | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රදාන සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
| අ. දේශිය සම්මාන | 09 | 06 | - |
| ආ. ජාතික සම්මාන | 18 | 05 | 21 |
| ඇ. ජාත්‍යන්තර සම්මාන | - | - | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | **27** | **11** | **21** |

| ශ්‍රී.ලං.නැ.වි.වි. (ත්‍රිකුණාමල මණ්ඩපය) | | | |
|---|---|---|---|
| විෂය | ප්‍රදාන සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
| අ. දේශිය සම්මාන | - | - | - |
| ආ. ජාතික සම්මාන | - | - | - |
| ඇ. ජාත්‍යන්තර සම්මාන | 01 | - | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | **01** | **-** | **-** |

### 2016 දී ලද පර්යේෂණ ප්‍රදාන

- 2014 වර්ෂයේදී ප්‍රසිද්ධ කර සඟරාවල පළකරන ලද පර්යේෂණ පත්‍රිකා වෙනුවෙන් බත්තරමුල්ලේ වෝටර්ස් එජ් හිදී **2016** නොවැම්බර් **22** දින පැවති උත්සවයකදී ශ්‍රී.ලං.නැ.වි.වි. විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සිව් දෙනෙකු ජනාධිපති සම්මාන ලබාගත්හ.

  - මහාචාර්ය එස්.තිරුකනේෂ්, ගණිත අධ්‍යයනාංශය;
  - ආචාර්ය එෆ්. සී. රාගෙල්, භෞතික විද්‍යා අධ්‍යයනාංශය;
  - ආචාර්ය පී. පෙරතීපන්, භෞතික විද්‍යා අධ්‍යයනාංශය ;
  - ආචාර්ය එම්. සිදම්බරසන්, රසායන විද්‍යා අධ්‍යයනාංශය .

- කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 27 වන වාර්ෂික සමුළුවේ කාලගුණය වෙනස්වීම හා ජල කළමනාකරණය පිළිබඳ සැසියේ "හොඳම ඉදිරිපත් කරන්නාගේ සම්මානය" කෘෂි කර්ම පීඨයේ එම්. රාජේන්ද්‍රන් මයා විසින් ලබා ගන්නා ලදී.

- කැළණිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සංවර්ධන පර්යේෂණ සැසියේ "හොඳම ආයෝජන කළඹ වාර්තාව" විද්‍යා පීඨයේ ජේ.එම්. හැරිස් විසින් ලබා ගන්නා ලදී.

## ක්‍රීඩාවන්ගෙන් ශිෂ්‍යයන් ලද ජයග්‍රහණ

- චීනයේ දී පැවති 2 වන ආසියානු විශ්වවිද්‍යාල බාස්කට්බෝල් ශූරතාවය - 2016 සඳහා සහභාගී වන ලද ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල බාස්කට්බෝල් කණ්ඩායමට, ශ්‍රී.ලං.නැ.වි.වි නියෝජනය කරමින් ශිෂ්‍යයන් දෙදෙනෙකු (එස්. උගන්දන් මයා වී.සී. විජේ මයා) සහභාගි වන ලදී.
- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා - 2016 දී ශ්‍රී.ලං.නැ.වි.වි යේ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් විසින් පහත පදක්කම් දිනාගන්නා ලදී:
    - පිරිමි උස පැනීමේ "රන් පදක්කම" ස්.වි.සෞ.අ.ආ. යේ කේ. තනුෂාන් විසින් දිනාගන්නා ලදී.
    - පිරිමි මීටර් 400 කඩුළු පැනීමේ "රිදී පදක්කම" කලා හා සංස්කෘත පීඨයේ එම්. රජීකරන් මයා විසින් දිනාගන්නා ලදී.
    - මීටර් 5000 (පිරිමි) දිවීමේ "රිදී පදක්කම", මීටර් 1500 (පිරිමි) දිවීමේ "ලෝකඩ පදක්කම" හා මැරතන් තරඟයේ (පිරිමි) "ලෝකඩ පදක්කම" කලා හා සංස්කෘත පීඨයේ කේ. කෝකුලනාදන් මයා විසින් දිනාගන්නා ලදී.
    - කි.ග්‍රෑ. 57 නිදහස් ආර මල්ලව පොර (පිරිමි) තරඟයේ "රිදී පදක්කම" කලා හා සංස්කෘත පීඨයේ කේ. සුවෙන්තිරකුමාර් මයා විසින් දිනාගන්නා ලදී.
    - කි.ග්‍රෑ. 65 නිදහස් ආර මල්ලව පොර (පිරිමි) තරඟයේ "ලෝකඩ පදක්කම" කලා හා සංස්කෘත පීඨයේ එස්.මතියකලන් මයා විසින් දිනාගන්නා ලදී.
    - කි.ග්‍රෑ. 70 නිදහස් ආර මල්ලව පොර (පිරිමි) තරඟයේ "ලෝකඩ පදක්කම" කලා හා සංස්කෘත පීඨයේ එස්.අජිත්රාජ් මයා විසින් දිනාගන්නා ලදී.
    - කි.ග්‍රෑ. 86 නිදහස් ආර මල්ලව පොර (පිරිමි) තරඟයේ "ලෝකඩ පදක්කම" කලා හා සංස්කෘත පීඨයේ එම්. කුයින්ටන් මයා විසින් දිනාගන්නා ලදී.
    - කි.ග්‍රෑ. 125 නිදහස් ආර මල්ලව පොර(පිරිමි) තරඟයේ "ලෝකඩ පදක්කම" කලා හා සංස්කෘත පීඨයේ එම්.ආර්.එම්.ඒ.අයි.අමීර් මයා විසින් දිනාගන්නා ලදී.
    - කි.ග්‍රෑ. 50 කුම්ටේ (කාන්තා) තරඟයේ "ලෝකඩ පදක්කම" කලා හා සංස්කෘත පීඨයේ ඒ. ඩිෂාන්ති මිය විසින් දිනාගන්නා ලදී.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරන ලද අන්තර් විශ්වවිද්‍යාලයීය මිශ්‍ර දැල්පන්දු තරඟාවලියේ "2වන ස්ථානය" ශ්‍රී.ලං.නැ.වි.වි. යේ මිශ්‍ර දැල්පන්දු කණ්ඩායම විසින් දිනාගන්නා ලදී. තවද, අපගේ විශ්වවිද්‍යාලයේ එස්.සුගන්දන් මයා තරඟාවලියේ හොඳම "මැදි ඉසව් ක්‍රීඩකයා" ලෙස තෝරාගන්නා ලදී.

## 6.4 වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර:

| 1. කෘෂිකර්ම පීඨය | | | |
|---|---|---|---|
| විෂය | සහභාගිවන ලද | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | 01 | - | - |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 01 | 01 | - |
| ඊ. වෙනත් (සම්මන්ත්‍රණ හා වැඩමුළු) | 41 | - | - |
| එකතුව | **43** | **01** | **-** |

| 2. කලා හා සංස්කෘත පීඨය | | | |
|---|---|---|---|
| විෂය | සහභාගිවන ලද | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | 10 | 09 | 06 |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | 02 | 04 | - |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 01 | 02 | - |
| ඊ. වෙනත් (සම්මන්ත්‍රණ හා වැඩමුළු) | 21 | 02 | - |
| එකතුව | **34** | **17** | **06** |

| 3. වානිජ හා කළමනාකරණ පීඨය | | | |
|---|---|---|---|
| විෂය | සහභාගිවන ලද | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | 02 | 01 | - |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඊ. වෙනත් (සම්මන්ත්‍රණ හා වැඩමුළු) | 08 | 01 | 02 |
| එකතුව | **10** | **02** | **02** |

| 4. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය | | | |
|---|---|---|---|
| විෂය | සහභාගිවන ලද | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | 10 | 02 | - |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | 01 | - |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 02 | 02 | - |
| ඊ. වෙනත් (සම්මන්ත්‍රණ හා වැඩමුළු) | 06 | - | - |
| එකතුව | **18** | **05** | **-** |

| **5. විද්‍යා පීඨය** | | | |
|---|---|---|---|
| විෂය | සහභාගිවන ලද | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | 01 | - | - |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 03 | 03 | - |
| ඊ. වෙනත් (සම්මන්ත්‍රණ හා වැඩමුළු) | 36 | 36 | - |
| එකතුව | **40** | **39** | **-** |

| **6. ශාරීරික අධ්‍යාපන ඒකකය** | | | |
|---|---|---|---|
| විෂය | සහභාගිවන ලද | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 02 | 02 | - |
| ඊ. වෙනත් (සම්මන්ත්‍රණ හා වැඩමුළු) | - | - | 01 |
| එකතුව | **02** | **02** | **01** |

| **7. ත්‍රිකුණාමල මණ්ඩපය** | | | |
|---|---|---|---|
| විෂය | සහභාගිවන ලද | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | 01 | 03 | - |
| ආ. පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඊ. වෙනත් (සම්මන්ත්‍රණ හා වැඩමුළු) | 32 | - | - |
| එකතුව | **33** | **03** | **-** |

## 6.5 අළුතින් ආරම්භ කරන ලද පාඨමාලාවන් පිළිබඳ විස්තර

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | සහතික පත්‍ර | ඩිප්ලෝමා | අභ්‍යන්තර උපාධි පාඨමාලා | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | පශ්චාත් උපාධි | දර්ශනපති | දර්ශනශූරී |
|---|---|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මය(2016 දෙසැම්බර් 31 දිනට තාවකාලිකව කෘෂිකර්ම පීඨය යටතේ)** | **ජීව පද්ධති තාක්ෂණ උපාධිය (කෘෂි තාක්ෂණ හා ව්‍යවසායකත්වය)** | ඉංග්‍රීසි | - | - | 20.10.2016 | - | - | - | - |
| එකතුව | | | **-** | **-** | **01** | **-** | **-** | **-** | **-** |

# 7. අභ්‍යන්තර විගණනය

## සභාපතිගේ වාර්තාව, 2016 වර්ෂය තුල පවත්වන ලද විගණන කමිටු රුස්වීම

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනු කමිටුවක් ලෙස විගණන කමිටුව ක්‍රියාත්මක වේ. සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුව සෑම වසරකම නිරන්තරයෙන් රැස්වන අතර විශ්වවිද්‍යාලයේ මූල්‍ය, පරිපාලන, මානව සම්පත් හා අධ්‍යයන පරිපාලන යන කරුණු පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. එහි සාමාජිකත්වය, නිල කාලය, වගකීම්, බලතල හා තෝරාගනු ලබන ක්‍රියාවලීන් යනාදිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාව මඟින් මහා භාණ්ඩාගාරය විසින් පාලනය කරනු ලබයි.

### 1. විගණන කමිටුවේ කාර්යයභාරයන්:

i. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කිරීම හා වාර්ෂික විගණන සැලැසුම් සමාලෝචනය කිරීම.

ii. විශ්වවිද්‍යාලයේ සියළු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම හා ඇගයීම.

iii. අභ්‍යන්තර විගණක විසින් පිළියෙල කරනු ලබන වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩ සැලැස්ම සමාලෝචනය කිරිම හා නිර්දේශ කිරීම.

iv. පිරිවැය ඵලදායීතාව හා අනවශ්‍ය වියදම් ඉවත් කිරීම යනාදිය සඳහා කාර්යය සාධනය නිරන්තරයෙන් සමාලෝචනය කරන ලදී.

v. බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය කිරිම හා විගණකාධිපතිගේ/බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් සම්බන්ධීකරණය කිරීම.

vi. අණපනත්, රෙගුලාසි, නීති සහ චක්‍රලේඛ වලට අනුකූල වන බව නිශ්චය කර ගැනීම.

vii. ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වන බවට තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.

viii. අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා හා කළමණාකරණ ලිපි සමාලෝචනය කිරීම හා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.

ix. රාජ්‍ය ව්‍යාපාර පොදු කාරක සභාවේ නිර්දේශ/නියෝගයන් ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම.

x. වාර්ෂික වාර්තාවේ ඇතුලත් කිරිම සඳහා කමටුවේ සොයාගැනිම් සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල කිරීම.

## 2. විගණන කමිටුවේ සාමාජිකයන්

| සාමාජිකයාගේ නම | තනතුරු හා සුදුසුකම් |
|---|---|
| (අ). පාලක සභාවෙන් පත්කරන ලද සාමාජිකයන් | |
| 1. ඒ. ඥානදාසන් මයා (සභාපති) | ජනාධිපති උපදේශක/විශ්‍රාමලත් අතිරේක සොලිසිටර් ජනරාල් |
| 2. පී.ටී.ඒ. හසන් මයා | ප්‍රධාන විධායක නිලධාරි, ආශ්‍රිත සාමාජික, මූල්‍ය ගණකාධිකාරි ආයතනය (එක්සත් රාජධානිය) |
| 3. ආර්. කන්නන් මයා | නීතිඥ |
| (ආ). නිල බලයෙන් පත් වූ සාමාජිකයන් | |
| 4. ඒ. පහිරදන් මයා, (45 වන රැස්වීම දක්වා)<br>වී. කාන්දීපන් මයා | වැඩබලන ලේඛකාධිකාරි<br>ලේඛකාධිකාරි (කොන්ත්‍රත්) |
| 5. එස්. තිරුවදුවෙල්වන් මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක |
| (ඇ). නිරීක්ෂකයන් | |
| 6. එස්. මුරුගුපිල්ලෛයි මයා (45 වන රැස්වීම දක්වා)<br><br>ඒ.එම්.මහීර් මයා | කණ්ඩායම් නිලධාරි/විගණකාධිපති දෙපාර්තමේන්තුව<br><br>විගණන පරීක්ෂක (ශ්‍රී.ලං.නැ.වි.වි), විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| 7. එම්.එම්.ජේ.ආර්. බෝගමුව මයා | අභ්‍යන්තර විගණක,වි.වි.ප්‍ර.කො.ස |
| (ඈ). ආරාධිත | |
| 8. මූල්‍යාධිකාරි (ඇරයුම් ලත්) | |

## 3. රැස්වීම්

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/31ට අනුව කමිටුවේ අවම වශයෙන් වසරකට 4 වතාවක් රැස්විය යුතුය. සමාලෝචිත වර්ෂය තුලදී කමිටුව **8** වතාවක් රැස්වන ලදී. කමිටුවේ නිර්දේශයන් විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය හා අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ඉදිරිපත් කරන ලදී. රැස්වීම් පිළිබඳ විස්තර පහත ඉදිරිපත් කරනු ලැබේ.

| අනු අංකය | රැස්වීම් වාරය | දිනය |
|---|---|---|
| 1 | 44 වන විගණන කමිටුව | 30.01.2016 |
| 2 | 45 වන විගණන කමිටුව | 26.02.2016 |
| 3 | 46 වන විගණන කමිටුව | 30.04.2016 |
| 4 | 47 වන විගණන කමිටුව | 25.06.2016 |
| 5 | 48 වන විගණන කමිටුව | 28.09.2016 |
| 6 | 49 වන විගණන කමිටුව | 22.10.2016 |
| 7 | 50 වන විගණන කමිටුව | 26.11.2016 |
| 8 | 51 වන විගණන කමිටුව | 30.12.2016 |

## 4. වර්ෂය තුලදී ක්‍රියාකාරකම්:

සමාලෝචිත වර්ෂය තුලදී කමිටුවේ පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.

**(අ) අභ්‍යන්තර විගණනය:**

- *අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන නිර්දේශ කිරීම හා නියාමනය කිරීම*

  පූර්ව අත්දැකීම්වලට අනුව විගණන සැලැස්මේ ඇතැම් ක්ෂේත්‍රයන්හි පරික්ෂා කිරීම් වැඩි කරන ලෙස නිර්දේශ කරන ලදී.

  - වාර්ෂික සත්‍යාපනය 60% සිට 75% දක්වා වැඩි කරන ලදී.
  - පුද්ගලික ලිපි ගොනු 50% සිට 60% දක්වා වැඩි කරන ලදී.
  - මිලදී ගැනීම් හා බැංකු සැසඳුම් 100% පරික්ෂා කල යුතුය.
  - සේවක පඩිනඩි ගෙවීමේ පද්ධතියද (කාර්ය මණ්ඩල වැටුප් හා වේතන) ඇතුලත් කරන ලදී.

  එසේම, කමිටුව විසින් වර්ෂය පුරාවටම මෙම කටයුතුවල ප්‍රගතිය නියාමනය කරන ලදී.

- *අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචනය කිරීම හා නියාමනය කිරීම.*

  කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා, සමාලෝචන සටහන් හා විමසුම් සමාලෝචනය කර එහි පෙන්වාදුන් අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා පරිපාලනයට අවශ්‍ය මඟ පෙන්වීම් හා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**(ආ) වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්:**

**සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව පිළියෙල කිරිමේ ප්‍රගතිය කමිටුව මඟින් නියාමනය කරන ලදී. තවද, විශ්වවිද්‍යාලයයේ අවසන් ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරිම පිළිබඳ පසු විපරම් කරන ලදී.**

**(ඇ) බාහිර විගණනය:**

**සමාලෝචිත වර්ෂයේදී අදාළ වල රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් හා වාර්ෂික විගණන වාර්තාව කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.**

**(ඇ) අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරිම හා නියාමනය කිරිම:**

- ***වාර්ෂික සත්‍යාපනය හා ස්ථාවර වත්කම් ලේඛනය***

  **විශ්වවිද්‍යාලයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය නියමිත කාලයට අවසන් කිරිම සඳහා එහි ප්‍රගතිය කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය හා නියාමනය කරන ලදී. තවද, ස්ථාවර වත්කම් මෘදුකාංගයේ කටයුතු අවසන් කිරිම සඳහා එම කාර්යය නියාමනය කරන ලද අතර අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.**

- ***පුස්තකාල පොත්පත්***

  **ප්‍රධාන පුස්තකාලයේ හා ත්‍රිකුණාමල මණ්පයේ පොත්පත් ආපසු ලබාගැනීම සම්බන්ධයෙන් වන ක්‍රියාවලිය කමිටුව විසින් අඛණ්ඩව නියාමනය කරන ලද අතර නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් අනුගමනය කිරිම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.**

- ***නිරවුල් නොකරන ලද අත්තිකාරම් හා ණය මුදල් අයකර ගැනීම***

  **ණය හා අත්තිකාරම් මුදල් අයකර ගැනිම සම්බන්ධයෙන් වන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කමිටුව විශේෂ අවධානයක් යොමුකරන ලද අතර සමාලෝචිත වර්ෂය තුලදි නිරවුල් කිරිමේ ක්‍රියාවලිය ඉතා සමීපව නියාමනය කරන ලදී. තවද, කමිටුව විසින් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා නිරවුල් නොකරන ලද දිගුකාලීන අත්තිකාරම් හා හඳුනානොගත් හෝ අයකර නොහැකි ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.**

- ***හඳුනානොගත් සෘජු බැර කිරීම් හා හර කිරීම්***

  **ප්‍රදේශ පැවති සිවිල් කෝලාහල හේතුවෙන් විශ්වවිද්‍යාල පරිපාලනයට බාධා පැමිණි 2009 වර්ෂයට පෙර සිදු වූ හඳුනානොගත් සෘජු බැරකිරිම් හා සෘජු හර කිරිම් සම්බන්ධයෙන් කමිටුවේ විශේෂ අවධානය යොමුකරන ලදී. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අදාළ අධිකාරින්වල කරන ලෙස කමිටුව විසින් පාලක සභාවට නිර්දේශ කරන ලදී.**

**(ඉ)** සංයුක්ත සැලැස්ම හා මූලික සැලැස්ම

- *සංයුක්ත සැලැස්ම*

  පොදු ව්‍යාපාර සම්බන්ධයෙන් වන යහපාලන මාර්ගෝපදේශයන්හි සඳහන් ප්‍රමිතීන්ට අනුව සංයුක්ත සැලැස්ම පිළියෙල කිරිමේ ප්‍රගතිය කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය හා නියාමනය කරන ලදී.

  ආයතනික ප්‍රතිඵල රාමුව පිළියෙල කිරිම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයට වැඩමුළු මාලාවක් පැවැත්විමට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

- *ප්‍රධාන සැලැස්ම*

  ශ්‍රී.ලං.නැ.වි.විද්‍යාලයට අයත් බොහොමයක් ඉඩම් සඳහා හිමිකම් ඔප්පු හෝ අයිතිය නොමැති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. කමිටුව මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලද අතර ඉඩම්වල අයිතිය/හිමිකම් ඔප්පු ලබාගැනිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පාලක සභාවට නිර්දේශ කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටළුව සම්බන්ධයෙන් කටයුතු කිරිම සඳහා උපදේශකවරයෙකු පත්කරන ලද අතර මේ වන විට වන්දාරමුලෛයි පරිශ්‍රය සඳහා ඔප්පුව ලබා ගැනීමට ශ්‍රී.ලං.නැ.වි.විද්‍යාලයට හැකි වී ඇත. තවද, ඉඩම් සම්බන්ධයෙන් පත්කර ගත් උපදේශකවරයාගේ සහයෝගය ඇතිව අනෙකුත් ඉඩම්වල අයිතිය නිරවුල් කරගැනීම සම්බන්ධයෙන් ද ධනාත්මක ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකි වී ඇත.

**(ඊ)** බැඳීම් හා ගිවිසුම් කඩ කිරීම

ගිවිසුම් කඩකල කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් ආපසු අයකර ගැනිමේ ක්‍රියාවලියේ තත්ත්වය කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමහරක් ගිවිසුම් කඩකල කාර්යය මණ්ඩලයෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබෙන ලදී. ගිවිසුම් කඩකල හයදෙනෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනිම ආරම්භ කර ඇති අතර ගිවිසුම් කඩකල පස්දෙනෙකුට එරෙහිව නීතිමය පටිපාටින් ආරම්භ කිරිමට මේ වන විටත් කටයුතු කර ඇත. ගිවිසුම් කඩකල 74 දෙනෙකු ඇතුලත් නඩු 12ක් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාරදීමට කටයුතු කර ඇත.

**(උ)** අයවැය පාලනය

නිසි මුදල් පාලනය හා බෙදාහැරිම තහවුරු කිරිම සඳහා කමිටුව විසින් අයවැය ප්‍රතිපාදනයට එරෙහිව නිත්‍ය ක්‍රියාකාරිත්වය ඉතා දැඩිව නිරික්ෂණය කරන ලදී.

## 5. නිගමනය:

**කමිටුවේ සාමාජිකයන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය හා විශ්වවිද්‍යාලයේ යහපාලනය ඇතිකිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ කැපවීම පිළිබඳව විගණන කමිටුව සෑහීමකට පත්වේ. කමිටුවේ ලේකම් ලෙස සිය කාර්යයභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකගේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් කමිටුවට සෑහීමකට පත් විය හැකි. කමිටුව ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා පසු විපරම් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සෑහීමකට පත්වන අතර යහ පාලනය, විනිවිදභාවය, නිසි මූල්‍ය පරිපාලනය හා අධ්‍යයන ක්‍රියාකාරිත්වය ස්ථාපිත කිරීම පිළිබඳ තවදුරටත් අවධාරණය කරන ලදී.**

**සභාපති**
**විගණන කමිටුව,**
**නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.**

## 8. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ **2016** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **108(1)** උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

C 46

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ENP/BT/C/EUSL/01/16/10 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } [illegible] August 2017

Vice Chancellor,

Eastern University of Sri Lanka

**Report of the Auditor General on the Financial Statements of the Eastern University of Sri Lanka for the year ended 31 December 2016 in terms of Sub - Section 108(1) of the Universities Act, No.16 of 1978.**

---

Reference to my letter of even number dated 27 July 2017 on the above subject.

02. The above mentioned report is sent herewith.

W.Premananda

Additional Auditor General

For Auditor General

| | | | | |
|---|---|---|---|---|
| Copies : | 1. | The Secretary, | - | Ministry of Higher Education and Highways |
| | 2. | The Secretary, | - | Ministry of Finance and Mass Media |
| | 3. | The Chairman | - | University Grant Commission |

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඑන්පී/බීටී/සී/ඊයූඑස්එල්/01/16/10 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ජූලි 27 දින

උප කුලපති,
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය.

**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංරාගිප්‍ර) අනුකූල වීම.

**ශ්‍රීලංරාගිප්‍ර 7 - දේපල පිරියත හා උපකරණ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි එකටම පවරාගෙන ඇතත්, ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව ඒවා වෙන වෙනම ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, විශ්ව විද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට රු. 1,915,507,577 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වෙන වෙනම දැක්වීමෙන් තොරව එකට දක්වා තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලය විසින් පෙර වර්ෂ තුළ දී රු. 4,597,940 ක පිරිවැයකට මිලදී ගන්නා ලද හා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් වාහන 03 ක් මෙම ප්‍රමිතියේ 65 වගන්තිය ප්‍රකාරව ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කිරීමෙන් හා වෙනස්වීම් ගිණුම්ගත කිරීමෙන් තොරව විශ්ව විද්‍යාලය විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ත්‍රිකුණාමලය මණ්ඩපයේ තාක්ෂණ තොරතුරු මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකර එම මණ්ඩපයට භාර දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු. 12,259,371 ක මුදලක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) මණ්ඩප ගොඩනැගිලි, පොම්පාගාරය සහිත ජල ටැංකිය, ජල සැපයුම් සංවර්ධනය, විදුලි බල සංවර්ධනය, ජෙනරේටර් කාමරය, මායිම් තාප්පය හා ක්‍රීඩා භූමිය යනාදී ඉදිකිරීම් වැඩ විෂයයන් 7 ක් 2010 සිට 2012 වර්ෂය සඳහා කාල පරිච්ඡේදය තුළ රු. 113,508,496 ක මුළු පිරිවැයකට සම්පූර්ණ කර තිබුණි. කෙසේ වුවද, එම නිම කරන ලද වැඩවල මුළු වටිනාකම දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වනු වෙනුවට කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද බස්රථයක් විකිණීමෙන් ලැබුණු රු. 327,000 ක මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්වීමෙන් තොරව විවිධ ණයහිමි ගිණුමට ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාලය විසින් පවත්වා ගෙන යන ලෙජර් ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් ණය ශේෂය රු. 113,391,627 ක් විය. කෙසේ වුවද, මෙම ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු. 112,243,299 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් ණය ශේෂය රු. 1,148,328 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) විශ්ව විද්‍යාලයේ මානව ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, ව්‍යාධි භෞතවේද දෙපාර්තමේන්තුව, ඵලදා විද්‍යා දෙපාර්තමේන්තුව සහ කෘෂිකාර්මික රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ පාරිභෝජ්‍ය හා රසායනික විෂයයන් 183 ක තොග ශේෂයන්වල මුළු වටිනාකම රු. 3,253,617 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) 1996 වර්ෂය සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ විශ්ව විද්‍යාලයේ බැංකු ගිණුමට කරන ලද රු. 1,639,218 ක් හා රු. 4,025,059 ක් වූ පිළිවෙලින් සෘජු බැර හා සෘජු හර හඳුනාගෙන අදාළ ගිණුම්වල ගිණුම් ගත කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 19,082,790 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ගොවිපොළ සතුන් | 87,187 | කෘෂිකර්ම පීඨයට අයත් ගොවිපොළේ සතුන් 60 දෙනෙකු මියයාම සම්බන්ධයෙන් පශු වෛද්‍ය වාර්තාව |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | සියලුම උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ යෙදී සිටින සියලු පුද්ගලයන් ඔවුන්ගේ දිනපතා පැමිණීම හා පිටවීම් වේලාවන් පැමිණීමේ ලේඛනයේ සටහන් කළ යුතු වුවද, විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. එබැවින් විශ්ව විද්‍යාලය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම පිළිබඳ සනාථ කර ගැනීමෙන් තොරව එකතුව රු. 407,738,731 ක් වූ වැටුප් හා පාරිශ්‍රමික 257 ක් වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයට සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 102 සිට 104 | විශ්ව විද්‍යාලයට අයත් වාහනයක් අනතුරකට භාජනය වී තිබූ අතර රු. 77,250 ක් වූ එහි අලුත්වැඩියා වියදම සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. කෙසේ වුවද හානියේ ප්‍රමාණය හා හේතුව හා වගකීම් නිශ්චය කර ගැනීම සඳහා විමර්ශන මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 571 | එකතුව රු. 8,143,021 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු 21 ක් වර්ෂ 2 සිට 12 දක්වා කාල පරිච්ඡේදයක් පැවතුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ 03 පරිච්ඡේදයේ 26:5 වගන්තිය ප්‍රකාරව, එම ආයතනවල නිලධාරින් ඒවායේ බාහිර කථිකාචාර්ය තනතුරුවලට පත්කළ නොහැකිය. කෙසේවුවද, විශ්ව විද්‍යාලයේ පීඨ 05 ක කාර්ය මණ්ඩලයෙන් බාහිර කථිකාචාර්යවරුන් 27 දෙනෙකු විශ්ව විද්‍යාලය විසින් පත්කර තිබූ අතර එම කථිකාචාර්යවරුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 696,250 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) 2011 අප්‍රේල් 20 දිනැති අංක 01/2011 දරන උසස් අධ්‍යාපන චක්‍රලේඛය හා 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව, පර්යේෂණ කමිටුවේ අනුමැතිය සහිතව පර්යේෂණ යෝජනා ඉදිරිපත් නොකරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලය පර්යේෂණ දීමනා ලැබීම සඳහා සුදුසුකම් නොලබයි. කෙසේවුවද, පර්යේෂණ කමිටුවේ අනුමැතිය ලබා නොගත් කලා හා සංස්කෘතික පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 53 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 8,864,434 ක් වූ පර්යේෂණ දීමනා ලබා ගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 107,259,847 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු. 157,502,871 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු. 50,243,024 ක වර්ධනයක් දැක්වුණි. රු. 205,897,000 කින් පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විශ්ව විද්‍යාලයේ අගය එකතු කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය රු. 107,259,847 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළ රට වෙනුවෙන් විශ්ව විද්‍යාලයේ අගය එකතු කිරීම රු. 874,297,000 ක් විය. රට වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ හා පෙර වර්ෂ 4 ක් සඳහා විශ්ව විද්‍යාලයේ දායකත්වය පහත පරිදි වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

| | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| අතිරික්තය/ (ඌනතාවය) | (107,300) | (157,503) | (76,653) | (127,102) | (63,431) |
| එකතු කළා -: | | | | | |
| ▪ පුද්ගලික පඩිනඩි | 790,536 | 704,978 | 530,130 | 453,080 | 359,600 |
| ▪ ක්ෂය | 191,061 | 173,457 | 105,759 | 82,195 | 68,879 |
| මුළු දායකත්වය | 981,597 | 878,435 | 635,889 | 535,275 | 428,479 |
| **අගය එකතු කිරීම** | **874,297** | **720,932** | **559,236** | **408,173** | **365,048** |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

#### (අ) උපාධි පාඨමාලා

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 2 ක තුළ එක් එක් පීඨය සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව පහත දැක්වේ.

| පීඨය | බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2016 | 2015 | 2014 |
| කලා හා සංස්කෘතිය | 386 | 104 | 450 |
| වාණිජ්‍ය හා කළමනාකරණය | 182 | 184 | 200 |
| විද්‍යාව | 138 | 90 | 90 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාව | 80 | 201 | 300 |
| කෘෂිකර්මය | 42 | 80 | 120 |
| සන්නිවේදනය හා ව්‍යාපාර අධ්‍යයනය | 148 | 136 | 151 |
| ව්‍යවහාර විද්‍යාව | 35 | 31 | 92 |
| සිද්ධ ඖෂධ ඒකකය | 48 | 49 | 51 |
| **එකතුව** | **1,059** | **875** | **1,454** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයට හා කෘෂිකර්ම පීඨයට සිසුන් බඳවා ගැනීම පිළිවෙලින් සියයට 73 කින් හා සියයට 65 කින් අඩු වී තිබූ අතර 2016 වර්ෂය තුළ විද්‍යා පීඨයට සිසුන් බඳවා ගැනීම 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 53 කින් වැඩි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ සියලුම පීඨවලට සිසුන් බඳවා ගැනීම 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 27 කින් අඩු වී තිබුණි.

**(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය**

විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාව හා සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂ 2 ක් සඳහා මෙහෙයුම් වියදම පදනම් කර ගෙන ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| මුළු පිරිවැය (රු'000) | 1,296,021 | 1,143,866 | 879,368 |
| මුළු සිසුන් සංඛ්‍යාව | 4,438 | 4,890 | 4,467 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු.) | 292,028 | 233,919 | 196,859 |

(i) 2016 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 48 කින් වැඩි වී තිබුණි.

(ii) 2016 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු. 292,028 ක් වූ අතර එම වර්ෂය සඳහා යාපනය විශ්ව විද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු. 266,178 ක් විය. ඒ අනුව, යාපනය විශ්ව විද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැයට වඩා මෙම විශ්ව විද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු. 25,850 කින් වැඩි වී තිබුණි.

**(ඇ) අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ලබා දීම.**

එක්සත් රාජධානියේ බෙඩ්ෆර්ඩ්ෂයර් විශ්ව විද්‍යාලයේ දර්ශන විශාරද උපාධි වැඩසටහනක් සඳහා අපේක්ෂා කෙරෙන දර්ශනපති පාඨමාලාව හැදෑරීම සඳහා 2011 ඔක්තෝබර් 03 සිට 2015 අප්‍රේල් 02 දක්වා කාල පරිච්ඡේදය තුළ කථිකාචාර්යවරයෙකුට (පරිවාස) වැටුප් සහිත මාස 45 ක හා වැටුප් රහිත මාස 06 ක

අධ්‍යයන නිවාඩුවක් විශ්ව විද්‍යාලය විසින් අනුමත කර රු. මිලියන 9.2 ක මූල්‍ය සහායක් ලබා දී තිබුණි. කෙසේවුවද, කථිකාචාර්යවරයා විසින් වර්ෂ 02 ක් ඉකුත් වීමෙන් පසුවත් ඔහුගේ දර්ශන විශාරද උපාධිය සම්පූර්ණ කර නොතිබුණි. 2017 මැයි 15 දින සිට බලපැවැත්වෙන පරිදි අදාළ කථිකාචාර්යවරයා විසින් සේවය අවසන් කර ඇති බවට මේ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලයේ උපකුලපති විසින් 2017 මැයි 15 දින මා වෙත දන්වා තිබුණි.

**(ඇ) බාහිර කථිකාචාර්යවරුන් පිළිබඳ කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ දේශන පැවැත්වීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් 52 ක් විශ්ව විද්‍යාලය විසින් පත් කර එක් එක් විෂය සඳහා වෙන් කරන ලද කාල පරිච්ඡේදය ඇතුළත විෂය නිර්දේශය සම්පූර්ණ කිරීම සඳහා ඉල්ලීමක් කර තිබුණි. කෙසේවුවද, එක් එක් විෂය සඳහා වෙන් කරන ලද දේශන පැය වලින් දේශන පැය 06 සිට 101 දක්වා පරාසයක දේශන පැය එම කථිකාචාර්යවරුන් විසින් සම්පූර්ණ කර නොතිබුණි. එබැවින් එම කථිකාචාර්යවරුන් ඔවුන්ගේ දේශන කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ විෂය නිර්දේශය සම්පූර්ණ කළේද යන්න ප්‍රශ්නගත වේ. විස්තර පහත දැක්වේ.

| විෂයය | වෙන් කරන ලද මුළු පැය ගණන | නිම කරන ලද මුළු පැය ගණන | සම්පූර්ණ නොකරන ලද දේශන පැය |
|---|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | 55 | 14.5 | 40.5 |
| ශෛල්‍ය වෛද්‍ය විද්‍යාව | 110 | 27 | 83 |
| ළමා රෝග | 118 | 17 | 101 |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව | 30 | 24 | 06 |
| මරණ පිළිබඳ විමර්ශන | 08 | 02 | 06 |
| රුධිර වසා පද්ධති ආබාධ | 20 | 02 | 18 |
| පද්ධති ආබාධ හා පේශි පද්ධති ආබාධ | 20 | 07 | 13 |

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පරිගණක හා සර්වර්ස් මිලදී ගැනීම**

සමාලෝචිත වර්ෂය තුළ දී රු. 20,227,663 ක වටිනාකමට විශ්ව විද්‍යාලය විසින් ඩෙස්ක්ටොප් පරිගණක 212 ක් හා සර්වර් 07 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශිෂ්‍ය රසායනාගාරය ස්ථාපිත කිරීම සඳහා 2016 ජුනි 07 දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයට (CICT) පරිගණක 75 ක් භාර දී තිබුණද, එවැනි රසායනාගාරයක් මේ දක්වා ස්ථාපිත කර නොතිබුණි. එබැවින් එම පරිගණක වර්ෂයක පමණ කාලයක් නිශ්කාර්යව පැවතුණි.

(ii) පරිගණක රසායනාගාරයේ භාවිතය සඳහා 2016 අප්‍රේල් 18 දින මුළු වටිනාකම රු. 3,323,530 ක් වූ පරිගණක 24 ක් හා සර්වර් 02 ක් ගණිත දෙපාර්තමේන්තුව සඳහා සපයා තිබුණි. කෙසේවුවද පරිගණක මේස, පුටු හා ජාල සම්බන්ධතා පහසුකම් ආදිය නොමැතිවීම හේතුවෙන් පරිගණක 24 න් පරිගණක 10 ක් හා සර්වර් 02 ක් වර්ෂ 1 ක කාලයක් දෙපාර්තමේන්තුවේ නිෂ්කාර්යව පැවතුණි.

(iii) ජීව - පද්ධති තාක්ෂණික දෙපාර්තමේන්තුවට රු. 4,364,559 ක් වටිනා පරිගණක 35 ක් හා සර්වර් 02 ක් 2016 මැයි 05 දින සපයා තිබුණි. කෙසේවුවද, එක් පරිගණකයක් හැර අනෙකුත් පරිගණක 34 පරිගණක මේස, පුටු හා ජාල සම්බන්ධතාවය ආදී පහසුකම් නොමැති වීම හේතුවෙන් 2017 අප්‍රේල් 20 දක්වා උපයෝජනය කර නොතිබුණි.

**(ආ) මයික්‍රොටෝම් - ෆිනසි 325 (Microtome - Finesse 325) මිලදී ගැනීම**

උපාධි පාඨමාලාව සඳහා සත්ත්ව විද්‍යාව තෝරාගත් සිසුන්ගේ භාවිතය සඳහා යොදා ගැනීමේ අරමුණින් සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමට අනුව රු. 1,325,000 ක පිරිවැයකට 2016 පෙබරවාරි 15 දින විශ්ව විද්‍යාලය විසින් මයික්‍රොටෝම් - ෆිනසි 325 මිලදී ගෙන තිබුණි. කෙසේවුවද, සත්ව විද්‍යාව ඔවුන්ගේ විශේෂ උපාධිය ලෙස තෝරාගත් සිසුන් නොසිටි බැවින් 2017 ජුනි 20 දක්වා එය භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

## 4.3 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තනතුරු හැරගිය හා සේවයෙන් විශ්‍රාම ගිය අධ්‍යයන හා අනධ්‍යයන සේවකයන් දෙසිය විසි දෙදෙනෙකුගේ එකතුව රු. 10,124,628 ක ණය ශේෂ වර්ෂ 05 සිට 28 දක්වා කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේවුවද ඉහත සඳහන් ණය කිසිදු වලංගු ඇපයක් ලබා ගැනීමෙන් තොරව ලබාදීම හේතුවෙන් එම ණය ශේෂ අයකර ගැනීම සඳහා කිසිදු පියවරක් ගැනීමට විශ්ව විද්‍යාලයට නොහැකි වී තිබුණි.

(ආ) බැඳුම්කර වටිනාකම ලෙස කලා හා සංස්කෘතික පීඨයේ කථිකාචාර්යවරයකුගෙන් ඔහුගේ ගිවිසුම කඩ කිරීම හේතුවෙන් රු. 6,452,912 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. කෙසේවුවද ඔහු දිවයිනට පෙරළා පැමිණ සර් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයේ සහකාර පුස්තකාලාධිපතිවරයෙකු ලෙස සේවයට බැඳී තිබුණු අතර නැගෙනහිර විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන්ද සේවය කරන නමුත් ඔහුගෙන් ඉහත මුදල අයකර ගැනීම සඳහා වර්ෂ 10 කට වැඩි කාලයක් විශ්ව විද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) දර්ශන විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුර සඳහා බඳවා ගත් නිලධාරියාට වඩා වැඩි පළපුරුද්දක් හා ප්‍රමාණවත් සුදුසුකම් එම තනතුර සඳහා ඉල්ලුම් කරන ලද නිලධාරිනියක් සතුව තිබුණද, එම තනතුරට බඳවා ගැනීම සඳහා ඇයව නොසලකා තිබූ හෙයින් ඇය විසින් මඩකලපුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් අධිකරණය විසින් එම නිලධාරියාට වන්දි ලෙස රු. 1,000,000 ක් ගෙවීමට නඩු තීන්දුව ලබා දී තිබූ අතර නිලධාරියා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉන් රු. 500,000 ක් එම නිලධාරියාට ගෙවා තිබුණි. තවද විශ්ව විද්‍යාලය විසින් නෛතික ගාස්තු ලෙස රු. 1,098,169 ක මුදලක් නෛතික කටයුතු වෙනුවෙන් වැය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, බඳවා ගැනීම් ක්‍රියාවලියේ සාවද්‍ය ක්‍රියා හේතුවෙන් රු. 1,598,169 ක පාඩුවක් විශ්ව විද්‍යාලයට දැරීමට සිදු වී තිබුණි. කෙසේවුවද, මෙම සාවද්‍ය ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරියාට එරෙහිව විශ්ව විද්‍යාලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) ත්‍රිකුණාමලය මණ්ඩපය විසින් නේවාසිකාගාර ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකර තිබූ අතර මෙම ගොඩනැගිල්ල 2015 පෙබරවාරි මාසයේදී විවෘත කර තිබුණි. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම ගොඩනැගිල්ල සඳහා ජල සැපයුම් සම්බන්ධතාවය ලබා දී තිබූ අතර මෙම ගොඩනැගිල්ල සඳහා සවි කරන ලද

ජල මණුව පස්වලින් යට වී තිබුණි. එබැවින්, 2015 දෙසැම්බර් මාසය දක්වා මාසික ජල බිල්පත්‍ර ගාස්තුව ඇස්තමේන්තුගත මුදලක් වූ ඉතා කුඩා වටිනාකමක මුදලක් මණ්ඩලය විසින් අයකර තිබුණි. පසුව ඉහත සඳහන් කාල පරිච්ඡේදය සඳහා රු. 4,775,936 ක් වූ ඉතා විශාල මුදලක් ජල ගාස්තු ලෙස මණ්ඩලය විසින් අයකර තිබූ අතර 2015 නොවැම්බර් 11 සිට 2016 ජනවාරි 18 දක්වා කාල පරිච්ඡේදය තුළ මෙම මුදල ගෙවා තිබුණි. කෙසේවුවද, තථ්‍ය මණු කියවීම අනුව ගාස්තු ගණනය කිරීම සඳහා මණු කියවන්නාට අවශ්‍ය පහසුකම් සැලසීමට නොහැකි වූ වගකිව යුතු නිලධාරියාට එරෙහිව විශ්ව විද්‍යාලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) විදේශ රටවල විද්‍යාපති උපාධි පාඨමාලා හැදෑරීම සඳහා වැටුප් සහිතව අධ්‍යයන නිවාඩු ලබා ගැනීමෙන් පසුව ගිවිසුම් කඩ කිරීම විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය පරිචයක් විය. කෙසේවුවද, ඔවුන්ගෙන් වලංගු ඇපකර ලබා ගැනීමට හෝ ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලින් බැඳුම්කර වටිනාකම අඩුකර ගැනීමට විශ්ව විද්‍යාලය විසින් මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොතිබුණි. ඒ අනුව, ගිවිසුම් කඩ කිරීම් හේතුවෙන් නිලධාරීන් 71 දෙනෙකුගෙන් බැඳුම්කර වටිනාකම ලෙස රු. 159,990,645 ක මුළු මුදලක් වර්ෂ 10 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේවුවද ඔවුන්ගෙන් වලංගු ඇපකර ලබා නොගැනීම හේතුවෙන් එම හිඟ ශේෂ අයකර ගැනීමට විශ්ව විද්‍යාලයට නොහැකි වී තිබුණි.

(ඊ) විවිධ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු. 28,542,535 ක් වූ අත්තිකාරම් වර්ෂ 02 සිට 20 දක්වා වූ කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. කෙසේවුවද, 2015 වර්ෂය සඳහා මාගේ විගණන වාර්තාවේ මෙම කරුණ පෙන්වා දී තිබුණද, එම අත්තිකාරම් අයකරගැනීම සඳහා විශ්ව විද්‍යාලය විසින් 2017 ජුනි 20 වන විටත් කටයුතු කර නොතිබුණි.

(උ) විදේශ සැපයුම්කරුවන් 67 දෙනෙකු සඳහා ලබා දී තිබූ එකතුව රු. 2,267,842 ක්වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 12 කට වැඩි කාලයක් පැවතුණි.

(ඌ) නිලධාරීන් සඳහා ලබා දී තිබූ අත්තිකාරම් ඒවා ලබා දී තිබූ කාර්යය නිම කළ වහාම නිරවුල් කළ යුතුය. කෙසේවුවද, විවිධ කාර්යයන් සඳහා නිලධාරින් 164 දෙනෙකුට ලබා දී තිබූ එකතුව රු. 18,088,502 ක්වූ අත්තිකාරම් වර්ෂ 07 කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(එ) ඉල්ලුම් කරන ලද මුදලේ ස්වභාවය හා සාධාරණත්වය තහවුරු කර ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය විසින් අත්තිකාරම් ලෙස ඉල්ලුම් කරන ඕනෑම මුදලක් විශ්ව විද්‍යාලය විසින් ලබා දී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අවස්ථා 03 කදී එකතුව රු. 38,500 ක අත්තිකාරම් සම්පූර්ණයෙන් මුදලින් නිරවුල් කර තිබූ අතර අවස්ථා 16 කදී ගෙවා තිබූ අත්තිකාරම් වලින් සියයට 50 ක් වූ එකතුව රු. 482,750 ක් මුදලින් නිරවුල් කර තිබුණි. මෙම පරිචයන් රාජ්‍ය මුදල් සාවද්‍ය පරිහරණයට අවස්ථා සලසා තිබුණි.

### 4.4 අරමුදල් උපයෝජනය

නිදන්ගත වකුගඩු රෝග, විද්‍යාත්මක, ඉංජිනේරු හා තොරතුරු තාක්ෂණයට අදාළ ගැටලු හා ප්‍රජා විද්‍යා, සමාජ - සංස්කෘතික හා ආර්ථික ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන යටතේ 2016 වර්ෂය තුළදී ලැබී තිබුණු එකතුව රු. 6,500,000 ක් වූ අරමුදල් අරමුණු කළ කාර්යයන් සඳහා යොදාගැනීමෙන් තොරව 2017 ජුනි 20 දක්වා බැංකු ජංගම ගිණුමේ තබා තිබුණි.

### 4.5 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලේඛකාධිකාරී තනතුර 2015 ජනවාරි 31 දින සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේවුවද එම තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත් කිරීමට විශ්ව විද්‍යාලය විසින් මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) මහාචාර්ය, ආශ්‍රිත මහාචාර්ය හා කථිකාචාර්ය තනතුරු 21 ක් වර්ෂ කිහිපයක සිට පුරප්පාඩු වී පැවතුණි. සිසුන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා මෙම තත්ත්වය අයහපත් අන්දමින් බලපා තිබුණද, විශ්ව විද්‍යාලය විසින් මේ සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාරව, යාවත්කාලීන කරන ලද සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය, අග්‍රිම අවශ්‍යතාවයන්, අරමුණු ඉටු කර ගැනීම සඳහා කාර්යයන් හා දිගුකාලීන

දැක්මක් ආදී තොරතුරු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කළ යුතුය. කෙසේවුවද, 2016 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරි සැලැස්මේ ඉහත සඳහන් තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අත්තිකාරම් නිරවුල් කිරීම | අත්තිකාරම් නිරවුල් කිරීමේ දිගු ප්‍රමාදයන් |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා පුරප්පාඩු ස්ථිර කාර්ය මණ්ඩලය පත් කිරීම මඟින් පුරවා නොතිබීම සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම වාර්තා නොකිරීම. |
| (ඇ) | පුස්තකාල පරිපාලනය | සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම සඳහා කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ඇ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

14

## 9. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළව කළමණාකරණයේ හේතු පැහැදිලි කිරීම

| විගණන ජේද යොමුව | | නිරීක්ෂණයන් |
|---|---|---|
| **2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම: | | |
| **2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) අනුකූල වීම: | | |
| ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 7 - දේපළ, පිරියත හා උපකරණ | | |
| (අ). | ඉඩම් හා ගොඩනැගිලි එකටම පවරාගෙන ඇතත්, ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව ඒවා වෙන වෙනම ගිණුම්ගත කල යුතුය. කෙසේ වෙතත්, විශ්විද්‍යාලයේ 2016 දෙසැම්බර් මස 31 දිනට රු.1,915,507,577 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වෙන වෙනම දැක්වීමෙන් තොරව එකට දක්වා තිබුණි. | පිළිගනිමි.<br><br>උපදේශකවරයෙකුගේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරිමේ ක්‍රියාවලිය මේ වන විටත් ආරම්භ කර ඇත. මෙම ක්‍රියාවලිය අවසන් වූ වහාම ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණන වටිනාකම 2017 වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන්ව අනාවරණය කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ආ). | විශ්වවිද්‍යාලය විසින් පෙර වර්ෂ තුළ දී රු.4,597,940 ක පිරිවැයකට මිලදී ගන්නා ලද හා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් වාහන 03 ක් මෙම ප්‍රමිතියේ 65 වගන්තිය ප්‍රකාරව ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කිරීමෙන් හා වෙනස්වීම් ගිණුම්ගත කිරීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණි. | පිළිගනිමි.<br><br>මෙම රථවාහන ප්‍රත්‍යාගණනය කිරිමට කටයුතු කර ඇත. |
| **2.2.2** ගිණුම්කරණ අඩුපාඩු: | | |
| (අ). | ත්‍රිකුණාමල මණ්ඩපයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකර එම මණ්ඩපයට භාර දී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු.12,259,371 ක මුදලක් ගිණුම් ගත කර නොතිබුණි. | පිළිගනිමි.<br><br>2016.12.31 දින වන විටත් අවසාන බිල්පත් ත්‍රිකුණාමල මණ්ඩපයේ ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැත. එබැවින් එය ප්‍රාග්ධනික කර නොමැත. |
| (ආ). | මණ්ඩප ගොඩනැගිලි, පොම්පාගාරය සහිත ජල ටැංකිය, ජල සැපයුම් සංවර්ධනය, විදුලි බල සංවර්ධනය, ජෙනරේටර් කාමරය, මායිම් තාප්පය හා ක්‍රීඩා භූමිය යනාදී ඉදිකිරිම් වැඩ විෂයයන් | පිළිගනිමි.<br><br>ඉදිකිරිම් කටයුතු අවසන් වූ පසු මෙම ගොඩනැගිලි වල සාධාරණ වටිනා අගය මාරු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන අතර 2017 වර්ෂය සඳහා පිළියෙල කරනුලබන |

| | | |
|---|---|---|
| | 7ක් 2010 සිට 2012 වර්ෂය සඳහා කාල පරිච්ඡේදය තුළ රු. 113,508,496 ක මුළු පිරිවැයකට සම්පූර්ණ කර තිබුණි. කෙසේ වුවද, එම නිම කරන ලද වැඩවල මුළු වටිනාකම දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වනු වෙනුවට කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ දක්වා තිබුණි. | අවසන් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ). | සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද බස් රථයක් විකිණීමෙන් ලැබුණු රු.327,000 ක මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්වීමෙන් තොරව විවිධ ණයහිමි ගිණුමට ගිණුම්ගත කර තිබුණි. | පිළිනොගනිමි.<br>බස්රථය විකිණීමෙන් ලද මුදල 2016.12.31 දිනට ණයහිමිගේ ලෙස පෙන්නුම්කර තිබුණේ එය රජයේ හෝ ආධාරයක් ලෙස අත්පත් කර ගත්තේද යන්න තහවුරු කර ගත යුතු බැවිනි.<br>මෙය 2017 වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන ගිණුම් ප්‍රකාශන වල නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ). | විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යන ලෙජර් ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලය අර්ථසාධක අරමුදල් ණය ශේෂය රු.113,391,627 ක් විය. කෙසේ වුවද, මෙම ණය ශේෂය මූල්‍ය ප්‍රකාශන වල රු.112,243,299 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ණය ශේෂය රු. 1,148,328 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි.<br>මෙය වසර දහයක්ට අධික කාලයක් තිස්සේ පැවැත එන ශේෂයක් වන අතර මීට අදාල ලියකියවිලි අප සතුව නොමැත. එබැවින් මෙය නිරවුල් කර ගිණුම්වල ගැලවීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ). | විශ්වවිද්‍යාලයේ මානව ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, ව්‍යාධි භෞතවේද දෙපාර්තමේන්තුව, ඵලදා විද්‍යා දෙපාර්තමේන්තුව සහ කෘෂිකාර්මික රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ පාරිභෝජ්‍ය හා රසායනික විෂයයන් 183 ක තොග ශේෂයන්වල මුළු වටිනාකම රු.3,253,617 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි.<br>මෙය ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. |
| (ඊ). | 1996 වර්ෂය සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලයේ බැංකු ගිණුමට කරන ලද රු. 1,639,218 ක් හා රු.4,025,059 ක් වූ පිළිවෙලින් සෘජු බැර හා සෘජු හර හඳුනාගෙන අදාළ ගිණුම්වල ගිණුම් ගත කර නොතිබුණි. | 2005 වර්ෂයට පෙර වර්ෂයන් වල ලියකියවිලි හඳුනාගැනිමට නොහැකි බවට පාලක සභාව ද හෙළිදරව් කරගෙන ඇති අතර 2009 වර්ෂයට පෙර හඳුනානොගතහොත් අඩුපාඩු පිළිබඳව සොයා බලනු ලැබේ. මෙම වටිනාකම මේ වන විටත් පොත් වලින් කපා හැරිමට කටයුතු කර ඇති අතර මේ සඳහා වන කමිටුවක් අමාත්‍යාංශය මඟින් පත්කර තිබුණි. |

**2.2.3.** විගණනය සඳහා සාක්ෂි නොවීම :

| ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| පුස්තකාල පොත් හා වාර සඟරා | **19,082,790** | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ගොවි පොළ සතුන් | **87,187** | කෘෂිකර්ම පියයට අයත් ගොවිපොළේ සතුන් **60** දෙනෙකු මියයාම සම්බන්ධයෙන්පශු වෛද්‍ය වාර්තාව |

පුස්තකාල පොත්, වාර සඟරා පිළිගනිමි.

පුස්තකාලයේ දැනට ආසන්න වශයෙන් පොත් හා වාර සඟරා **89,000**ක් පමණ ඇත. එසේම වාර්ෂික සමීක්ෂණ ක්‍රියාවලිය සය මාසික පදනමක් යටතේ ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යන පාඨමාලාවන් සඳහා ද බලපානු ලැබේ. කෙසේ වෙතත් පුස්තකාල කමිටුවේ නිර්දේශය මත **2017** වර්ෂයේ දි තොග සමීක්ෂණය පැවැත්වීම සඳහා කමිටුවක් මේ වන විට පත්කර ඇති අතර මෙම කමිටුවේ වාර්තාව මත පදනම්ව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකරනු ලැබේ.

ගොවි පොළ සත්තු

පිළිනොගනිමි.

පශු ශල්‍ය වෛද්‍යවරයෙකුගේ නිර්දේශය යටතේ මියගිය වටිනා සතුන්ගේ වටිනාකම් පොත්වලින් කපා හැරීමේ සම්ප්‍රදායක් විශ්වවිද්‍යාල ගොවි පොළ සතුව පවති. (අදාල ලියකියවිලි ගොවි පොළ සතුව පවති.) එසේම විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදය 2:3 වගන්තිය ප්‍රකාරව කුකුළු පැටවි,කුඩා හාවුන්,ඌරන්, යනාදි රු.**500.00** නොඉක්මවන පාඩු වාර්තා කිරිම අවශ්‍ය නොවේ. ඒ මත පදනම්ව මෙම වටිනාකම් කපා හැර ඇත.

**2:3** නීති, රීති රෙගුලාසි හා කළමණාකරණ තිරණ වලට අනුකුල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| **(අ).** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3:1 හා 3:2 වගන්තිය | සියලුම උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ යෙදී සිටින සියලු පුද්ගලයන් ඔවුන්ගේ දිනපතා පැමිණීම හා පිටවීම් වේලාවන් පැමිණීමේ ලේඛනයේ සටහන් කළ යුතු වුවද, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය | පිළිගනිමි.<br>මෙය අනෙකුත් සියලුම විශ්වවිද්‍යාල වලද සම්ප්‍රදායක් ලෙස සිදුකරනු නොලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | මණ්ඩලය ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. එබැවින් විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම පිළිබඳ සනාථ කර ගැනීමෙන් තොරව එකතුව රු.**407,738,731** ක් වූ වැටුප් හා පාරිශ්‍රමික **257** ක් වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයට සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | |
| (ආ). | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | |
| | මුදල් රෙගුලාසි **102-104** | විශ්වවිද්‍යාලයට අයත් වාහනයක් අනතුරකට භාජනය වී තිබු අතර රු. **77,250**ක් වූ එහි අලුත්වැඩියා වියදම සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. කෙසේ වුවද හානියේ ප්‍රමාණය හා හේතුව හා වගකීම් නිශ්චය කර ගැනීම සඳහා විමර්ශන මණ්ඩලයක් පත් කිරිමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි.<br><br>විනයානුකූල විමර්ශනයක් සිදුකිරිම සඳහා විමර්ශන කමිටුවක් පත්කිරිමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් මෙහි යම් ප්‍රමාදයක් සිදු වී ඇති බව පිළිගන්නා අතර අදාල විමර්ශන කටයුතු පවත්වා අවසන් කිරිමට ඉදිරියේදි කටයුතු කරනු ලැබේ. |
| | මුදල් රෙගුලාසි **571** | එකතුව රු. **8,143,021** ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු **21**ක් වර්ෂ **2** සිට **12** දක්වා කාල පරිච්ඡේදයක් පැවතුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිනොගනිමි.<br><br>අදාල කාලය අවසන් වූ පසු නියමිත පුද්ගලයා/ආයතනය විසින් කරනු ලබන ඉල්ලිමකට අනුව ආපසු ගෙවනු ලබන තැන්පතු නිරවුල් කරනු ලැබේ. එබැවින් මෙම ආපසු ගෙවනු ලබන තැන්පතු ජංගම නොවන වගකිම් යටතේ පෙන්නුම් කෙරේ.<br><br>උක්ත කරුණු මත පදනම්ව ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | |
|---|---|---|
| **2.4** ප්‍රමාණවත් අධිකාරි බලයකින් තොරව තහවුරු නොවූ ගණුදෙණු | | |
| (අ). | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ 03 වන පරිච්ඡේදයේ 26:5 වගන්තිය ප්‍රකාරව, එම ආයතනවල නිලධාරීන් ඒවායේ බාහිර කථිකාචාර්ය තනතුරු වලට පත්කළ නොහැකිය. කෙසේ වුවද, විශ්වවිද්‍යාලයේ පීඨ 05ක කාර්ය මණ්ඩලයෙන් බාහිර කථිකාචාර්යවරුන් 27 දෙනෙකු විශ්වවිද්‍යාලය විසින් පත් කර තිබූ අතර එම කථිකාචාර්යවරුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 696,250 ක මුදලක් ගෙවා තිබුණි. | ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගනිමි.<br><br>නමුත් අන්තර් විශ්විද්‍යාල ඉගැන්වීම් සඳහා පාලක සභාවේ අනුමැතිය මත පමණක් මෙම දීමනාව ගෙවීමට කටයුතු කර ඇත. බාහිර කථිකාචාර්යවරුන් විවිධ ක්ෂේත්‍ර සඳහා සෑම අවස්ථාවකදීම සපයාගත නොහැකි අතර එසේ සපයා ගතහැකි අවස්ථාවලදී ද ඉතා අධික වියදමක් දැරීමට සිදුවේ. |
| (ආ). | 2011 අප්‍රේල් 20 දිනැති අංක 01/2011 දරන උසස් අධ්‍යාපන චක්‍රලේඛය හා 2014 පෙබරවාරි 11 දිනැති 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව, පර්යේෂණ කමිටුවේ අනුමැතිය සහිතව පර්යේෂණ යෝජනා ඉදිරිපත් නොකරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලය පර්යේෂණ දීමනා ලැබීම සඳහා සුදුසුකම් නොලබයි. කෙසේ වුවද, පර්යේෂණ කමිටුවේ අනුමැතිය ලබා නොගත් කලා හා සංස්කෘත පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 53 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.8,864,434 ක් වූ පර්යේෂණ දීමනා ලබා ගෙන තිබුණි. | පිළිනොගනිමි.<br><br>පීඨ පර්යේෂණ කමිටුව හා විශ්වවිද්‍යාල පර්යේෂණ කමිටුව මඟින් යෝජනාවන් සියුම් ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව උපකුලපතිතුමාගේ අනුමැතියද සහිතව අදාල ගෙවීම් සිදුකර ඇත. |
| **3.** මූල්‍ය සමාලෝචනය<br><br>**3.1** මූල්‍ය ප්‍රතිඵල | | |
| | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 107,259,847 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු. 157,502,871 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු.50,243,024 ක වර්ධනයක් දැක්වුණි. රු.205,897,000 කින් පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | සටහන් කරගනිමි. |

**3.2 විශ්වවිද්‍යාලයේ අගය එකතු කිරීම.**

**සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය රු.107,259,847 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළ රට වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ අගය එකතු කිරීම රු.874,297,000ක් විය. රට වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ හා පෙර වර්ෂ 4ක් සඳහා විශ්වවිද්‍යාලයේ දායකත්වය පහත පරිදි වේ.**

| | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| අතිරික්තය(ඌනතාවය)<br>එකතු කළා :- | (107,300) | (157,503) | (76,653) | (127,102) | (63,431) |
| පුද්ගලික පඩිනඩි | 790,536 | 704,978 | 530,130 | 453,080 | 359,600 |
| ක්ෂය | 191,061 | 173,457 | 105,759 | 82,195 | 68,879 |
| මුළු දායකත්වය | 981,597 | 878,435 | 635,889 | 535,275 | 428,479 |
| අගය එකතු කිරීම | 874,297 | 720,932 | 559,236 | 408,173 | 365,048 |

**සටහන් කරගනිමි.**

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

**(අ). උපාධි පාඨමාලා**

**සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 2ක තුළ එක් එක් පීඨය සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව පහත දැක්වේ.**

| පීඨය | බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | **2016** | **2015** | **2014** |
| කලා හා සංස්කෘත | **386** | **104** | **450** |
| වාණිජ්‍ය හා කළමනාකරණ | **182** | **184** | **200** |
| විද්‍යාව | **138** | **90** | **90** |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාව | **80** | **201** | **300** |
| කෘෂිකර්මය | **42** | **80** | **120** |
| සන්නිවේදනය හා ව්‍යාපාර අධ්‍යයනය | **148** | **136** | **151** |
| ව්‍යවහාර විද්‍යාව | **35** | **31** | **92** |
| සිද්ධි ඖෂධ ඒකකය | **48** | **49** | **51** |
| එකතුව | **1059** | **875** | **1454** |

**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i). **2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයට හා කෘෂිකර්ම පීඨයට සිසුන් බඳවා ගැනීම පිළිවෙලින් සියයට 73 කින් හා සියයට 65 කින් අඩු වී තිබූ අතර 2016 වර්ෂය තුළ විද්‍යා පීඨයට සිසුන් බඳවා**

**ශිෂ්‍ය වෙන්කිරීම්/ ප්‍රවේශය මුළුමනින්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන අතර වි.වි.ප්‍ර.කො.ස. විසින් ලබාදෙනු ලබන ශිෂ්‍ය වෙන්කිරීම් මත පදනම්ව විශ්වවිද්‍යාලය විසින් සිසුන් ඇතුලත් කරගැනීම සිදුකරනු ලබයි.**

**එසේම 2014 වර්ෂයේදි විශේෂ ශිෂ්‍ය ඇතුලත් කර ගැනිමක් සිදු කරන ලදී.**

<table>
<tr><td></td><td>ගැනීම 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 53 කින් වැඩි වී තිබුණි.<br><br>(ii). සමාලෝචිත වර්ෂය තුළ සියලුම පීඨවලට සිසුන් බඳවා ගැනීම 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 27කින් අඩු වී තිබුණි.</td><td></td></tr>
<tr><td colspan="3">(ආ). ඒක ශිෂ්‍ය පිරිවැය</td></tr>
<tr><td></td><td>විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වු මුළු සිසුන් සංඛ්‍යාව හා සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂ 2ක් සඳහා මෙහෙයුම්
<table>
<tr><th></th><th>2016</th><th>2015</th><th>2014</th></tr>
<tr><td>මුළු පිරිවැය (රු.000)</td><td>1,296,021</td><td>1,143,866</td><td>879,368</td></tr>
<tr><td>මුළු සිසුන් සංඛ්‍යාව</td><td>4,438</td><td>4,890</td><td>4,467</td></tr>
<tr><td>ඒක ශිෂ්‍ය පිරිවැය(රු.)</td><td>292,028</td><td>233,919</td><td>196,859</td></tr>
</table>
වියදම් පදනම් කර ගෙන ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.<br><br>(i). 2016 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 48කින් වැඩි වී තිබුණි.<br><br>(ii). 2016 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.292,028 ක් වු අතර එම වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.266,178 විය. ඒ අනුව, යාපනය විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැයට වඩා මෙම විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.25,850 කින් වැඩි වී තිබුණි.</td><td>සටහන් කරගනිමි.<br><br>වි.වි.ප්‍ර.කො.සභාවේ හා අමාත්‍යාංශයේ ඉල්ලීම මත සියළුම සිසුන් සඳහා නේවාසික පහසුකම් සපයන එකම විශ්වවිද්‍යාලය අප බැවින් අපගේ පිරිවැය ඉහල ගොස් ඇත.</td></tr>
<tr><td>(ඇ).</td><td>අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ලබාදීම.</td><td></td></tr>
<tr><td></td><td>එක්සත් රාජධානියේ බෙඩ්ෆර්ඩ්ෂයර් විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද උපාධි වැඩසටහනක් සඳහා අපේක්ෂා කෙරෙන දර්ශනපති පාඨමාලාවක් හැදෑරීම සඳහා 2011 ඔක්තෝබර් 03 සිට 2015 අප්‍රේල් 02 දක්වා කාල පරිච්ඡේදය තුළ කථිකාචාර්යවරයෙකුට (පරිවාස) වැටුප් සහිත මාස 45ක හා වැටුප් රහිත මාස 6ක අධ්‍යයන නිවාඩුවක් විශ්වවිද්‍යාලය විසින් අනුමත කර රු. මිලියන 9.2 ක මූල්‍ය සහායක් ලබා දී තිබුණි. කෙසේ වුවද, කථිකාචාර්යවරයා විසින් වර්ෂ 02ක් ඉකුත් වීමෙන් පසුවත් ඔහුගේ දර්ශන විශාරද උපාධිය සම්පූර්ණ කර නොතිබුණි. 2017 මැයි 15 දින සිට බලපැවැත්වෙන පරිදි අදාළ කථිකාචාර්යවරයා විසින් සේවය අවසන් කර ඇති බවට මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් 2017 මැයි 15 දින මා වෙත දන්වා තිබුණි.</td><td>පිළිගනිමි.<br><br>අදාළ කථිකාචාර්යවරයා නියමිත කාල සීමාව තුලදි සිය දර්ශනශූරි උපාධිය අවසන් නොකිරිම හේතුවෙන් 2017.05.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් පහ කරන ලදි. චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අනුව නිවාඩු ලබාදෙන ලදි. ඔහුගේ පර්යේෂණ යෝජනාවලිය පදනම් කරගෙන විසි එක්වන ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපනය (HETC) හා උසස් අධ්‍යාපනය සඳහා ජාතික මධ්‍යස්ථානය</td></tr>
</table>

(NCAS) මඟින් මුලා ප්‍රතිපාදන ලබාදෙන ලදි.

**(ඇ).** බාහිර කථිකාචාර්යවරුන්ගේ කාර්ය සාධනය

**සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ දේශන පැවැත්වීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් 52ක් විශ්වවිද්‍යාලය විසින් පත් කර එක් එක් විෂය සඳහා වෙන් කරන ලද කාල පරිච්ඡේදය ඇතුළත විෂය නිර්දේශය සම්පූර්ණ කිරීම සඳහා ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වුවද, එක් එක් විෂය සඳහා වෙන් කරන ලද දේශන පැය වලින් දේශන පැය 06 සිට පැය 101 දක්වා පරාසයක දේශන පැය එම කථිකාචාර්යවරුන් විසින් සම්පූර්ණ කර නොතිබුණි. එබැවින් එම කථිකාචාර්යවරුන් ඔවුන්ගේ දේශන කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ විෂය නිර්දේශය සම්පූර්ණ කලේ ද යන්න ප්‍රශ්නගත වේ. විස්තර පහත දැක්වේ.**

| විෂයය | වෙන්කරන ලද මුළු පැය ගණන | නිම කරන ලද මුළු පැය ගණන | සම්පූර්ණ නොකරන ලද දේශන පැය ගණන |
|---|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | **55** | **14.5** | **40.5** |
| ශෛල්‍ය වෛද්‍ය විද්‍යාව | **110** | **27** | **83** |
| ළමා රෝග | **118** | **17** | **101** |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව | **30** | **24** | **06** |
| මරණ පිළිබඳ විමර්ශන | **08** | **02** | **06** |
| රුධිර වසා පද්ධති ආබාධ | **20** | **02** | **18** |
| පද්ධති ආබාධ හා පේශි පද්ධති ආබාධ | **20** | **07** | **13** |

**පිළිනොගනිමි.**

**පහත විෂයයන් සඳහා ඉතිරි වී තිබූ වෙනකරන ලද පැය ගණන් පහත පරිදි ආවරණය කරන ලදී.**

**1.සායනික විද්‍යාව**

- **අධ්‍යයන නිවාඩු අවසන් කර සේවයට වාර්තා කල ස්ථිර කථිකාචාර්යවරුන් විසින්,**
- **ශික්ෂණ රෝහලේ ඇඳන් මත සිදු කරනු ලබන ඉගැන්වීම්.**

**2. අධිකරණ වෛද්‍ය විද්‍යාව**

- **පත්කරන ලද බාහිර කථිකාචාර්යවරුන් (මූලික රෝහලේ උපදේශකවරුන්) ස්ථාන මාරුවීම් ලබා ඉවත්ව ගිය හෙයින් සෑම විෂයයකම ඉතිරි පැය 06 ක කාලය ස්වයං මඟ පෙන්වීමේ ක්‍රමයකට ආවරණය කරන ලදී.**

**3. වෙනත්**

- **අධ්‍යයන නිවාඩු අවසන් කර සේවයට වාර්තා කල ස්ථිර සේවයේ නියුතු කථිකාචාර්යවරුන් විසින්**
- **තාවකාලික සහාය කථිකාචාර්යවරුන් විසින්**

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**(අ).** <u>පරිගණක හා සර්වර්ස් මිලදී ගැනීම.</u>

**සමාලෝචිත වර්ෂය තුළ දී විසින් රු.20,227,663 ක වටිනාකමට විශ්වවිද්‍යාලය විසින් ඩෙස්ක්ටොප් පරිගණක 212ක් හා සර්වර්ස් 07ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | | |
|---|---|---|
| | **(i).**ශිෂ්‍ය රසායනාගාරය ස්ථාපිත කිරිම සඳහා **2016** ජුනි **07** දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයට **(CICT)** පරිගණක **75**ක් භාර දී තිබුණ ද, එවැනි රසායනාගාරයක් මේ දක්වා ස්ථාපිත කර නොතිබුණි. එබැවින් එම පරිගණක වර්ෂයක පමණ කාලයක් නිශ්කාර්යයව පැවතුණි. | පිළිගනිමි.<br><br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයට පසුගිය සතියේ දී පරිගණක 75 ලද අතර සියළුම පරිගණක මේ වන විට ප්‍රයෝජනයට ගැනිමට සුදානම් මට්ටමේ පවතී. |
| | | |
| (අ). | **(ii).** පරිගණක රසායනාගාරයේ භාවිතය සඳහා **2016** අප්‍රේල් **18** දින මුළු වටිනාකම රු.**3,323,530** ක් වු පරිගනක **24**ක් හා සර්වර්ස් **02**ක් ගණිත දෙපාර්තමේන්තුව සඳහා සපයා තිබුණි. කෙසේ වුවද, පරිගණක මේස, පුටු හා ජාල සම්බන්ධතා පහසුකම් ආදිය නොමැතිවිම හේතුවෙන් පරිගණක **24**න් පරිගනක **10**ක් හා සර්වර් **02**ක් වර්ෂ **1** ක කාලයක් දෙපාර්තමේන්තුවේ නිෂ්කාර්යයයව පැවතුණි.<br><br>**(iii).** ජීව-පද්ධති තාක්ෂණික දෙපාර්තමේන්තුවට රු.**4,364,559** ක් වටිනා පරිගණක **35**ක් හා සර්වර් **02**ක් **2016** මැයි **05** දින සපයා දී තිබුණි. කෙසේ වුවද, එක් පරිගණකයක් හැර අනෙකුත් පරිගනක **34**ම පරිගණක මේස, පුටු හා ජාල සම්බන්ධතාවය ආදී පහසුකම් නොමැති වීම හේතුවෙන් **2017** අප්‍රේල් **20** දින දක්වා උපයෝජනය කර නොතිබුණි. | පිළිගනිමි.<br><br>පරිගණක මේස හා පුටු මිලදි ගැනිමට හා අන්තර් ජාල පහසුකම් ලබා දිමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විටත් ගෙන ඇත.<br><br>පිළිගනිමි.<br><br>පරිගණක විද්‍යාගාරයේ පැවති අළුත්වැඩියා කටයුත්තක් හේතුවෙන් මෙම පරිගණක ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබු අතර මේ වන විට එය අවසන් කර ඇත. |
| (ආ). | <u>මයික්‍රොටෝම් - ෆිනසි **325** මිලදී ගැනීම</u><br><br>උපාධි පාඨමාලාව සඳහා සත්ත්ව විද්‍යාව තෝරාගත් සිසුන්ගේ භාවිතය සඳහා යොදා ගැනීමේ අරමුණින් සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමකට අනුව රු.**1,325,000** ක පිරිවැයකට **2016** පෙබරවාරි **15** දින විශ්වවිද්‍යාලය විසින් මයික්‍රෝටෝම්-ෆිනසි **325** මිලදි ගෙන තිබුණි. කෙසේ වුවද, සත්ත්ව විද්‍යාව ඔවුන්ගේ විශේෂ උපාධිය ලෙස තෝරාගත් සිසුන් නොසිටි බැවින් **2017** ජුනි **20** දින දක්වා එය භාවිතා කිරිමට නොහැකි වී තිබුණි. | පිළිනොගනිමි.<br><br>මෙය කාර්ය මණ්ඩලයේ පර්යේෂණ කටයුතු සඳහා යොදා ගනිමින් පවතී. |

| 4.3 කළමණාකරණ දුර්වලතා | | |
|---|---|---|
| (අ). | තනතුරු හැරගිය හා සේවයෙන් විශ්‍රාම ගිය අධ්‍යයන හා අනධ්‍යන සේවකයන් දෙසිය විසි දෙනෙකුගේ එකතුව රු.10,124,628 ක ණය ශේෂ වසර 05 සිට වසර 28ක කාලයක් හිඟ හිට ලෙස පැවතුණි. කෙසේ වුවද, ඉහත සඳහන් ණය කිසිදු වලංගු ඇපයක් ලබා ගැනීමෙන් තොරව ලබාදීම හේතුවෙන් එම ණය ශේෂ අයකර ගැනිම සඳහා කිසිදු පියවරක් ගැනිමට විශ්වවිද්‍යාලයට නොහැකි වි තිබුණි. | පිළිගනිමි.<br><br>හිඟ ණය මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගනු ලැබේ.<br><br>• සේවයෙන් ඉවත් කරන ලද නිළධාරීන්:<br>මෙම කාර්ය මණ්ඩලය මේ දක්වා සිය විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල් ශේෂයන් ඉල්ලුම්කර නොමැත. අදාල වි.වි.අ.අ ශේෂයන් ආපසු ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ විගස මෙම නිරවුල් නොකල ණය සහ වැටුප් අත්තිකාරම් මුදල් අයකර ගැනිමට කටයුතු කරනු ලැබේ.<br><br>• සේවයෙන් ඉවත්ව ගිය හා ගිවිසුම් කඩ කර ඇති පුද්ගලයන් :<br>නීතිපති දෙපාර්තමේන්තුවේ උපදේශනය මත මෙම සේවකයින් ඇප බැඳිම් වටිනාකම් නිරවුල් කරගන්නා අවස්ථාවේදීම ඔවුන්ගෙන් අයවිය යුතු ණය වටිනාකම් ද අයකර ගැනිමට අවශ්‍ය නිතිමය ක්‍රියාමාර්ග මේ වන විටත් ගනිමින් පවතී.<br><br>• සේවයෙන් විශ්‍රාම ගිය කාර්යය මණ්ඩලය :<br>ලිපි යැවීම මඟින් සේවයෙන් විශ්‍රාම ගිය කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු ණය හා වැටුප් අත්තිකාරම් අයකර ගැනිමට කටයුතු කරමින් පවතී. මේ අතර අයවිය නොමැති සහතිකය නිකුත් කිරිමට වගකිවයුතු නිළධාරින් හඳුනාගෙන අදාල මුදල් ඔවුන්ගෙන් අයකර ගැනීම සඳහා විමර්ශනයක් ද මේ වන විටත් සිදු කරමින් |

| | | |
|---|---|---|
| | | පවතී.<br><br>● වෙනත් විශ්වවිද්‍යාලවලට / රජයේ දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරුවීම් ලැබ ගිය නිළධාරින් :<br>අදාල ආයතනවල උපදෙස් මත මෙම ස්ථාන මාරුවීම් ලැබ ගිය නිළධාරින්ගෙන් අයවිය යුතු නිරවුල් නොකල ණය හා අත්තිකාරම් මුදල් අයකර ගැනීමට මේ වන විටත් කටයුතු කර ඇත.<br><br>එසේම, 2005 වර්ෂයට පෙර වර්ෂයන් වල ලියකියවිලි හඳුනාගැනිමට නොහැකි බවට පාලක සභාව ද හෙලිදරව් කරගෙන ඇති අතර 2009 වර්ෂයට පෙර හඳුනා නොගත හොත් අඩුපාඩු පිළිබඳව සොයා බලනු ලැබේ. මෙම වටිනාකම මේ වන විටත් පොත් වලින් කපා හැරිමට කටයුතු කර ඇති අතර මේ සඳහා වන කමිටුවක් අමාත්‍යාංශය මඟින් පත්කර තිබුණි. |
| (ආ). | බැඳුම්කර වටිනාකම ලෙස කලා හා සංස්කෘත පීඨයේ කථිකාචාර්යවරයකුගෙන් ඔහුගේ ගිවිසුම කඩ කිරීම හේතුවෙන් රු. 6,452,912ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. කෙසේ වුවද, ඔහු දිවයිනට පෙරළා පැමිණ සර්.ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයේ සහකාර පුස්තකාලාධිපතිවරයෙකු ලෙස සේවයට බැඳී තිබුණු අතර නැගෙනහිර විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් ද සේවය කරන නමුත් ඔහුගෙන් ඉහත මුදල අයකර ගැනීම සඳහා වර්ෂ 10කට වැඩි කාලයක් විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි. | අර්ධ වශයෙන් පිළිගනිමි.<br><br>ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ විගණන කමිටුවේ විශේෂ අවධානය මේ සම්බන්ධයෙන් යොමුකර ඇති අතර විගණන කමිටුවේ මඟපෙන්වීම මත නිසි ක්‍රමවේදයට අනුව 2016-12-28 දින අදාල කථිකාචාර්යවරයාට ලිපියක් යැවීමට මේ වන විටත් කටයුතු කර ඇත. එසේම නීතිමය දෙපාර්තමේන්තුවේ සහය මේ වන විටත් ඉල්ලා ඇත. පිළිතුරක් අපේක්ෂාවෙන් පසුවේ. |

| | | |
|---|---|---|
| (ඇ). | දර්ශන විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුර සඳහා බඳවා ගත් නිලධාරියාට වඩා වැඩි පළපුරුද්දක් හා ප්‍රමාණවත් සුදුසුකම් එම තනතුර සඳහා ඉල්ලුම් කරන ලද නිලධාරිනියක් සතුව තිබුණද, එම තනතුරට බඳවා ගැනීම සඳහා ඇයව නොසලකා තිබු හෙයින් ඇය විසින් මඩකලපුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් අධිකරණය විසින් එම නිලධාරියාට වන්දි ලෙස රු. **1,000,000**ක් ගෙවීමට නඩු තීන්දුව ලබා දී තිබූ අතර නිලධාරියා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉන් රු.**500,000**ක් එම නිලධාරියාට ගෙවා තිබුණි.<br><br>තවද විශ්වවිද්‍යාලය විසින් නෛතික ගාස්තු ලෙස රු.**1,098,169**ක මුදලක් නෛතික කටයුතු වෙනුවෙන් වැය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සාවද්‍ය ක්‍රියා හේතුවෙන් රු.**1,598,169**ක පාඩුවක් විශ්වවිද්‍යාලයට දැරීමට සිදු වී තිබුණි. කෙසේ වුවද, මෙම සාවද්‍ය ක්‍රියාවන්ට වගකිව යුතු නිලධාරියාට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | පිළිගනිමි.<br><br>මෙය අවක්‍රියාවක් නොවන අතර මෙය තෝරාගැනීමේ සැලසුම් සහගත අවක්‍රියාවක් බවට සොයාගත හොත් විනා තේරීම් කමිටුවෙන් මේ සම්බන්ධයෙන් අයකිරීමක් සිදු කරනු නොලැබේ. **2016-08-27** දින පැවති **268** වැනි පාලක සභා රුස්වීමේදී තීරණය කලේ පාර්ශව දෙක මඟින්ම නීති, ගාස්තු දැරීම හෝ දිර්ඝ නඩු හබයක් දක්වා මෙම සිද්ධිය වර්ධනය කර ගැනීම වළක්වා පාර්ශව දෙකේ නීති උපදේශකවරුන් මාර්ගයෙන් එකඟතාවයකට පැමිණ රු.**500,000.00**ක වන්දියක් ගෙවා නිරවුල් කරන ලෙසයි. |
| (ඈ). | ත්‍රිකුණාමල මණ්ඩපය විසින් නේවාසිකාගාර ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකර තිබූ අතර මෙම ගොඩනැගිල්ල **2015** පෙබරවාරි මාසයේදී විවෘත කර තිබුණි. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් මෙම ගොඩනැගිල්ල සඳහා ජල සැපයුම් සම්බන්ධතාවය ලබා දී තිබූ අතර මෙම ගොඩනැගිල්ල සඳහා සවි කරන ලද ජල මණුව පස්වලින් යට වී තිබුණි. එබැවින්, **2015** දෙසැම්බර් මාසයදක්වා මාසික ජල බිල්පත්‍ර ගාස්තුව ඇස්තමේන්තුගත මුදලක් වූ ඉතා කුඩා වටිනාකමක මුදලක් මණ්ඩලය විසින් අයකර තිබුණි. පසුව ඉහත සඳහන් කාල පරිච්ඡේදය සඳහා රු. **4,775,936** ක් වූ ඉතා විශාල මුදලක් ජල ගාස්තු ලෙස මණ්ඩලය විසින් අයකර තිබූ අතර **2015** නොවැම්බර් **11** සිට **2016** ජනවාරි **18** දක්වා කාල පරිච්ඡේදය තුළ මෙම මුදල ගෙවා තිබුණි. කෙසේ වුවද, තථ්‍ය මණු කියවීම අනුව ගාස්තු ගණනය කිරීම සඳහා මණු කියවන්නාට අවශ්‍ය පහසුකම් සැලසීමට නොහැකි වූ වගකිව යුතු නිලධාරියාට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගනිමි.<br><br>භූගත විශාල ජල කාන්දුවක් පැවති ඇති අතර ඒ වන විට ජල මණුවක් සවිකර නොතිබූ බැවින් එය හඳුනා ගැනීමට අප හට කිසිදු ක්‍රමයක් නොමැති විය. සමුච්චිත බිල්පත ලැබුණු පසු පද්ධතිය පරීක්ෂාකර ජල කාන්දුව සිදු වූ ස්ථානය හඳුනාගෙන එය වැසීමට කටයුතු කරන ලදී. ජල කාන්දුව හඳුනාගැනීම සඳහා නඩත්තු ඒකකය සතුව කිසිදු සාක්ෂියක් හෝ ස්ථාපිත කරන ලද ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මෙය හඳුනාගැනීම් කිසිම ක්‍රමයක් නොමැති විය. |
| (ඉ). | විදේශ රටවල විද්‍යාපති උපාධි පාඨමාලා හැදෑරීම සඳහා වැටුප් සහිතව අධ්‍යයන නිවාඩු ලබාගැනීමෙන් පසුව ගිවිසුම් කඩ කිරීම විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයේ සාමාන්‍ය පරිචයක් විය.කෙසේ වුවද, ඔවුන්ගෙන් වලංගු ඇපකර ලබා ගැනීමට හෝ ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලින් බැඳුම්කර වටිනාකම අඩුකර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් මේ දක්වා කිසිදු පියවරක් ගෙන | අර්ධ වශයෙන් පිළිගනිමි.<br><br>• ගිවිසුම් කඩකර ඇති පුද්ගලයින් **74** දෙනෙකු ඇතුළත් නඩු **12**ක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන අදාල හිඟ මුදල් අයකර දීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| | නොතිබුණි. ඒ අනුව, ගිවිසුම් කඩ කිරීම් හේතුවෙන් නිළධාරීන් 71 දෙනෙකුගෙන් බැඳුම්කර වටිනාකම ලෙස රු.159,990,645ක මුළු මුදලක් වර්ෂ 10කට වැඩි කාලයක් හිඟ හිට ලෙස පැවතුණි. කෙසේ වුවද ඔවුන්ගෙන් වලංගු ඇපකර ලබා නොගැනීම හේතුවෙන් එම හිඟ ශේෂ අයකර ගැනීමට විශ්වවිද්‍යාලයට නොහැකි වී තිබුණි. | වෙත භාර දීමට කටයුතු කර ඇත. රජයේ නීති උපදේශකවරුන් දෙදෙනෙකු මෙම නඩු භාරව කටයුතු කරනු ලබයි. ගිවිසුම් කඩකල පුද්ගලයන් ගෙන් මිලියන 10කට අධික මුදලක් මේ දක්වා අයකර ගැනිමට කටයුතු කර ඇත.<br>• වසර 10ක කාලසීමාව තුළ නඩු සම්බන්ධයෙන් ප්‍රමුඛතා පදනම මත මුලින් ක්‍රියාත්මක වීමටත්, වසර 10කට වඩා වැඩි නඩු සම්බන්ධයෙන් පසුව සලකා බැලීමටත් කටයුතු කරන බව නීතිපති දෙපාර්තමේන්තුව දන්වා ඇත.<br>• නීතිමය දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ඊ). | විවිධ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු. 28,542,535ක් වු අත්තිකාරම් වර්ෂ 02 සිට වසර 20 දක්වා වු කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. කෙසේ වුවද, 2015 වර්ෂය සඳහා මාගේ විගණන වාර්තාවේ මෙම කරුණ පෙන්වා දී තිබුණද, එම අත්තිකාරම් අයකර ගැනිම සඳහා විශ්වවිද්‍යාලය විසින් 2017 ජුනි 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි.<br>බොහෝමයක් සැපයුම් අත්තිකාරම් 1990 වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම වර්ෂයේ පැවති වාතාවරණයට අනුව ඇණවුම් කරන ලද භාණ්ඩ කොළඹ ආශ්‍රිත සැපයුම්කරුවන්ගෙන් මිලදී ගන්නා අවස්ථාවේදීම මුදල් ගෙවා ලබාගත යුතුව පැවතුණි. එම නිසා සෘජුවම ගෙවීම් කටයුතු සිදු කිරිම සඳහා චෙක්පත් කලින් ලිවීමට කටයුතු කර ඇති අතර අදාළ භාණ්ඩ ලද විගස මෙම අත්තිකාරම් මුදල් පියවිමට කටයුතු කර ඇත. මෙය විධිමත් කිරිමට ඉදිරයේ දී කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (උ). | විදේශ සැපයුම්කරුවන් 67 දෙනෙකු සඳහා ලබා දී තිබූ එකතුව රු. 2,267,842 ක් වූ අත්තිකාරම් අයකර ගැනිමට කටයුතු කිරිමෙන් තොරව වර්ෂ 12කට වැඩි කාලයක් පැවතුණි. | පිළිගනිමි.<br><br>බොහෝමයක් සැපයුම් අත්තිකාරම් 1990 වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම වර්ෂයේ පැවති වාතාවරණයට අනුව ඇණවුම් කරන ලද භාණ්ඩ කොළඹ ආශ්‍රිත සැපයුම්ක-රුවන්ගෙන් මිලදී ගන්නා අවස්ථාවේදීම මුදල් ගෙවා ලබාගත යුතුව පැවතුණි. එම නිසා සෘජුවම ගෙවීම් කටයුතු සිදු කිරිම සඳහා චෙක්පත් කලින් ලිවීමට කටයුතු කර ඇති අතර අදාළ භාණ්ඩ ලද විගස මෙම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත. මෙය විධිමත් කිරිමට ඉදිරයේ දී කටයුතු කරනු ලැබේ. |
| (ඌ). | නිලධාරින් සඳහා ලබා දී තිබූ අත්තිකාරම් ඒවා ලබා දී තිබූ කාර්යය නිම කළ වහාම නිරවුල් කළ යුතුය. කෙසේ වුවද, විවිධ කාර්යන් සඳහා නිලධාරින් 164 දෙනෙකුට ලබා දී තිබූ එකතුව රු.18,088,502 ක් වූ අත්තිකාරම් වර්ෂ 07කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි. | පිළිගනිමි.<br>• විගණන කමිටුවේ හා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මුදල් කමිටුවේ උපදෙස් මත නිරවුල් නොකරන ලද ණය මුදල් ආපසු අයකර ගැනිම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>• 2006 වර්ෂයේ සිට මේ දක්වා නිරවුල් නොකරන ලද අත්තිකාරම් මුදල් අයකරගැනිමට/ නිරවුල් කිරිමට කටයුතු කරමින් පවතී.<br>• 2005 වර්ෂයට පෙර වර්ෂයන් වල ලියකියවිලි හඳුනාගැනිමට නොහැකි බවට පාලක සභාව ද හෙළිදරව් කරගෙන ඇති අතර 2009 වර්ෂයට පෙර හඳුනා නොගතහොත් අඩුපාඩු පිළිබඳව සොයා බලනු ලැබේ. මෙම වටිනාකම මේ වන විටත් පොත් වලින් කපා හැරිමට කටයුතු කර ඇති අතර මේ සඳහා වන කමිටුවක් අමාත්‍යාංශය මඟින් පත්කර තිබුණි. |

| | | |
|---|---|---|
| (එ). | ඉල්ලුම් කරන ලද මුදලේ ස්වභාවය හා සාධාරණත්වය තහවුරු කර ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය විසින් අත්තිකාරම් ලෙස ඉල්ලුම් කරන ඕනෑම මුදලක් විශ්වවිද්‍යාලය විසින් ලබා දී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අවස්ථා 03කදි එකතුව රු.38,500ක අත්තිකාරම් සම්පූර්ණයෙන් මුදලින් නිරවුල් කර තිබූ අතර අවස්ථා 16කදී ගෙවා තිබූ අත්තිකාරම් වලින් සියයට 50ක් වූ එකතුව රු.482,750ක් මුදලින් නිරවුල් කර තිබුණි. මෙම පරිචයන් රාජ්‍ය මුදල් සාවද්‍ය පරිහරණයට අවස්ථා සලසා තිබුණි. | සටහන් කරගනිමි.<br><br>අත්තිකාරම් මුදල් ගෙවීමේ කටයුතු මේ වන විටත් විධිමත් කර ඇති අතර නියමිත කාල සීමාව තුල අදාල අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරන ලෙසට කාර්ය මණ්ඩල සාමාජිකයන්ට උපදෙස් ලබා දී ඇත. |
| **4.4** අරමුදල් උපයෝජනය | | |
| | නිදන්ගත වකුගඩු රෝග, විද්‍යාත්මක,ඉංජිනේරු හා තොරතුරු තාක්ෂණයට අදාළ ගැටළු සහ ප්‍රජා විද්‍යා, සමාජ-සංස්කෘතික හා ආර්ථික ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන යටතේ 2016 වර්ෂය තුළදී ලැබී තිබුණු එකතුව රු.6,500,000 ක් වූ අරමුදල් අරමුණු කළ කාර්යයයන් සඳහා යොදා ගැනීමෙන් තොරව 2017 ජුනි 20 දින දක්වා බැංකු ජංගම ගිණුමේ තබා තිබුණි. | පිළිගනිමි.<br><br>අදාල පර්යේෂණ සිදුකරමින් පවතින අතර මෙම අරමුදල් උපයෝජනය කරනු ලැබේ. |
| **4.5** මානව සම්පත් කළමනාකරණය | | |
| (අ). | ලේඛකාධිකාරි තනතුර 2015 ජනවාරි 31 දින සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද එම තනතුර සඳහා ස්ථිර නිළධාරියකු පත්කිරිමට විශ්වවිද්‍යාලය විසින් මේ දක්වා කටයුතු කර නොතිබුණි. | පිළිනොගනිමි.<br><br>සමාලෝචිත වර්ෂයේ 2015 ජනවාරි හා 2016 මැයි මස ලේඛකාධිකාරි තනතුර පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරිමට විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. සම්මුඛ පරික්ෂණයේදී කිසිදු පුද්ගලයෙකු තේරී නොමැත. නැවත වතාවක් 2017 ජුනි 28 දින පුවත්පත් දැන්වීමක් පළ කල අතර අවසන් දිනය 2017.07.27 වේ. |
| (ආ). | මහාචාර්ය, ආශ්‍රිත මහාචාර්ය හා කථිකාචාර්ය තනතුරු විසි එකක් වර්ෂ කිහිපයක සිට පුරප්පාඩු වී පැවතුණි. සිසුන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා මෙම තත්ත්වය අයහපත් අන්දමින් බලපා තිබුණද, විශ්වවිද්‍යාලය විසින් මේ සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගෙන නොතිබුණි. | පිළිනොගනිමි.<br><br>2012 වර්ෂයේ සිට 2016 දක්වා කාලය තුළ අවස්ථා කිහිපයකදීම අධ්‍යයන හා අනධ්‍යයන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරිමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරන ලදී. සුදුසු අයදුම්කරුවන් ඉදිරිපත් වූ |

| | | |
|---|---|---|
| | | අවස්ථාවලදී පත්වීම් ලබාදීමට කටයුතු කරන ලදී. උද්භිද විද්‍යා මහාචාර්ය තනතුරු පුරප්පාඩුව පිරවීමට කටයුතු කරන ලදී. |
| **5.** ශිෂ්‍යත්වය කටයුතුභාවය හා යහපාලනය | | |
| **5.1** ක්‍රියාකාරී සැලැස්ම | | |
| | **2014** පෙබරවාරි **17** දිනැති අංක **01/2014** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ **04** වගන්තිය ප්‍රකාරව, යාවත්කාලීන කරන ලද සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය, අග්‍රිම අවශ්‍යතාවයන්, අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යයන් හා දිගුකාලීන දැක්මක් ආදීතොරතුරු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කළ යුතුය. කෙසේ වුවද, **2016** වර්ෂය සඳහා විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඉහත සඳහන් තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | සටහන් කර ගත් අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **6.** පද්ධති හා පාලන | | |
| | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ. | සටහන් කරගනිමි. |

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| අ.අත්තිකාරම් නිරවුල් කිරීම. | අත්තිකාරම් නිරවුල් කිරීමේ දිගු ප්‍රමාදයන් |
| ආ.කාර්ය මණ්ඩල පරිපාලනය | ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් සඳහා පුරප්පාඩු ස්ථිර කාර්ය මණ්ඩලය පත්කිරීම මගින් පුරවා නොතිබීම සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම වාර්තා නොකිරීම. |
| ඇ.පුස්තකාල පරිපාලනය | සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම සඳහා කටයුතු නොකිරීම. |

**මහාචාර්ය ටී. ජයසිංහම්**
උපකුලපති
නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව